<u>පටුන</u> <u>පිටු</u>
<u>අංකය</u>


| | | |
|---|---|---|
| කොමිෂන් සභා තොරතුරු | | 02 |
| දැක්ම හා මෙහෙවර | | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව | | 04 |
| හැඳින්වීම | | 06 |
| තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය | | 07 |
| කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය | | 09 |
| පාලන හා මුදල් අංශය | | 12 |
| සැලසුම් හා පර්යේෂණ අංශය | | 22 |
| පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය | | 41 |
| ජාතික වෘත්තීය සුදුසුකම් අංශය | | 50 |
| තොරතුරු පද්ධති අංශය | | 68 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය | | 85 |
| විශේෂ වැඩසටහන් | | 91 |
| මූල්‍ය ප්‍රකාශ | | 92-124 |
| මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශය | 92 | |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 94 | |
| ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය | 95 | |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 96 | |
| ශේෂ පත්‍රය සටහන් | 98 | |
| මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශ සටහන් | 101 | |
| මූල්‍ය තත්ව ප්‍රකාශ සටහන් | 105 | |
| මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශ උප සටහන් | 108 | |
| මූල්‍ය තත්ව ප්‍රකාශ උප සටහන් | 112 | |
| මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛණ | 115 | |
| මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම | 124 | |
| විගණකාධිපති වාර්තාව | | 131 |
| විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු | | 140 |

## කොමිෂන් සභා තොරතුරු

| | |
|---|---|
| ආයතනය | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| අමාත්‍යාංශය | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| ලිපිනය | තුන්වන මහල, නිපුණතා පියස,<br>354/2 ඇල්විටිගල මාවත,<br>කොළඹ - 05 |
| ඊමේල් ලිපිනය | info@tvec.gov.lk |
| වෙබ් අඩවිය | www.tvec.gov.lk |
| දුරකථන අංකය | 011 - 5849291 |
| ෆැක්ස් අංකය | 011 - 2555007 |
| විගණකවරු | විගණකාධිපති,<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>නිදහස් චතුරශ්‍රය,<br>කොළඹ - 07. |
| බැංකු කරුවන් | මහජන බැංකුව,<br>වයි.එම්.බී.ඒ. ශාඛාව,<br>බොරැල්ල. |

**දැක්ම**

ඒකියා වෙළෙඳපොළට ගැළපෙන හා ගුණාත්මක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට ලැබීම අපගේ දැක්ම වේ.

**මෙහෙවර**

**වෙනස් වන ලෝක වෙළඳපොල අවශ්‍යතා හා සමාජ- ආර්ථික අරමුණු ඉටුවන කාර්යක්ෂම,ඵලදායී හා ගුණත්වය සහතික කල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කර පවත්වාගෙන් යෑම අපගේ මෙහෙවර වේ.**

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

2012 වර්ෂය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ඉතා වැදගත් වැඩ කටයුතු රාශියක් ඉටුකල වර්ෂයක් ලෙස හැඳින්විය හැකිය. ඒ තුලින් කොමිෂන් සභාවේ ශක්තිමත්භාවය ඉහල නැංවීමටත් කොමිෂන් සභාව ලබාදෙන සේවා වඩා ඉහළ මට්ටමකින් ඉටුකිරීමටත් හැකිවිය. ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී මුහුණදීමට සිදුවී ඇති අභියෝග ජය ගැනීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත් සංශෝධනයට ලක්කිරීම අවශ්‍යවිය. කොමිෂන් සභාවේ සේවාලාභීන්ගේ මෙන්ම මහජන අදහස් මේ පිළිබඳව ලබාගැනීමෙන් අනතුරුව පනත් සංශෝධන කෙටුම්පත යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට යොමු කිරීමට මෙම වර්ෂයේදී හැකිවිය. මෙම පනත් සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අමාත්‍යාංශය විසින් දැනටමත් ලබාගෙන තිබුණි. අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ කැපවීම මෙන්ම විෂය භාර ගරු අමාත්‍යතුමාගේ නායකත්වය හා මඟ පෙන්වීම යටතේ 2013 වර්ෂයේදී සංශෝධිත තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 වර්ෂයේදී කොමිෂන් සභා කාර්යය මණ්ඩල බඳවාගැනීමේ පටිපාටිය සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂමේ හා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට හැකිවිය. එසේම ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම සඳහා කෙරෙන ඇගයීම්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා නව කාර්යය මණ්ඩලයක් සහිත නව අංශයක් ස්ථාපිත කිරීමට ද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට හැකිවිය. ඒ ආකාරයට අළුතින් අනුමත කල බඳවාගැනීමේ පටිපාටිය සහ නව අංශය සංශෝධන යෝජනා හේතු කොටගෙන ක්‍රියාවට නැංවීමට නොහැකි වුවද, යෝජිත එම කාර්යභාර්ය සමස්ත ඇගයීම් ක්‍රියාවලියේ ගුණත්වයේ මෙන්ම කොමිෂන් සභා කාර්යයභාරයේ පුළුල් වෙනසක් අනාගතයේ සිදුවන බැව් ප්‍රකාශ කලයුතුය.

කොමිෂන් සභාවේ ප්‍රවාහන ඇණිය වසර 20කට වඩා වැඩි පැරණි වාහනවලින් සමන්විත වූ බැවින්, කොමිෂන් සභා නිලධාරීන් සඳහා රාජකාරී කටයුතු වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සැපයීම ඉතා විශාල ගැටලුවක් විය. මෙම තත්ත්වය සමතයකට පත්කරමින් මහාභාණ්ඩාගාරයේ සහයෝගය ඇතිව නව වාහන 06ක් ලබාගැනීමට 2012 වර්ෂයේ දී හැකිවිය. ඒ හේතු කොටගෙන කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයෙන් වැඩි සේවාවක් අපේක්ෂා කල හැකිය.

කොමිෂන් සභාවේ සේවාවන් අතර, නව පුහුණු ආයතන 187 ලියාපදිංචි කිරීමත්, පාඨමාලා 271 අලුතින් ප්‍රතීතනය කිරීමටත්, ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 18,111ක් පමණ ද අළුතින් නිකුත් කිරීමටත් 2012 වර්ෂයේ දී හැකිවිය.

පුහුණු ආයතන ලියාපදිංචිකිරීමේ අංශයේ කාර්යය මණ්ඩලය සමඟ අඛණ්ඩව කතිකා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පුහුණු ආයතන ලියාපදිංචිකිරීමේ නව ක්‍රමවේදයක් ඇති කර කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට හැකිවිය. කොමිෂන් සභාවේ ලියාපදිංචි නොවී පුවත්පත් දැන්වීම්

පලකරන සියලු ආයතන අමතා ලියාපදිංචි වීමේ නෛයිතික අවශ්‍යතාව පෙන්වා දෙනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පුහුණු ආයතන බහුතර සංඛ්‍යාවක් කොමිෂන් සභාව සමග ලියාපදිංචිවීමට පියවර ගනුලැබීය.

ජාතික වෘත්තීය සුදුසුකම් ලබාගැනීම සඳහා පැවැත්වෙන ඇගයීම් කටයුතුවල තත්ත්වය ඉහල නැංවීම සඳහා ඇගයීම් නිලධාරීන් සඳහා බලපත්‍ර 152ක් ලබාදීමට 2012 වර්ෂයේදී හැකිවිය. එසේම, ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණය කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්‍ෂමතාවය හා ඵලදායිතාවය ඉහල නැංවීමටද මෙම වර්ෂයේ දී හැකිවිය. එහිදී රාජ්‍ය අංශයේ ප්‍රධාන පුහුණු ආයතන වලින් පරිගණක ආශ්‍රිත අන්තර්ජාලය හරහා ඇගයීම් ප්‍රතිඵල ලබාගෙන ඉතා කාර්යක්‍ෂමව ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීමට හැකිවිය.

සැලසුම් හා පර්යේෂණ අංශයේ කටයුතු දෙස බැලූ කල, 2012 වර්ෂයේදී කර්මාන්ත ක්ෂේත්‍ර 3ක් සඳහා නව සැලසුම් 1ක් ඇතුලුව යාවත්කාලීන සැලසුම් 2ක් සකස් කිරීමට හැකිවිය. වයඹ හා උතුරු පළාත් සඳහා පළාත් වෘත්තීය පුහුණු සැලසුම් 2ක් සකස්කිරීම ආරම්භ කලද එම කාර්යය 2012 වර්ෂයේදී අවසන් කිරීමට නොහැකි වූයේ පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්මක් සකස් කිරීමට වසරකට වඩා වැඩි කාලයක් ගන්නා බැවිනි. එම තත්වය අවබෝධ කරගැනීමෙන් පසුව 2013 වර්ෂය සඳහා සකස් කිරීමට නියමිත පළාත් වෘත්තීය පුහුණු සැලැසුම් සකස් කිරිම 2012 වර්ෂයේ අවසන් කාර්තුව තුලදී ආරම්භ කෙරිනි. කොමිෂන් සභාවේ මූල්‍යාධාර වැඩසටහන් තුලින් 2012 වර්ෂය තුලද වෘත්තීය පුහුණු ආයතන සංඛාවකට මූල්‍යාධාර ලබාදීමට හැකිවිය. මෙම මූල්‍යාධාර ප්‍රදානය ද ඇතුලත්ව 2012 වර්ෂය තුලදී වර්ෂයට අදාල ප්‍රාග්ධන වැය ශීර්ෂයෙන් 91%ක් වැය කිරීමට හැකිවිය.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව තුල පාසල් සිසුන්ට පරිගණක අධ්‍යාපනය ලබාදීම සහ විදේශ රැකියා සඳහා පිටත්ව යන ගෘහ කටයුතු සහකාර වෘත්තිකයන්ට අවශ්‍ය ඇගයීම් කිරීම සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ ඇගයීම් නිලධාරීන් ඇගයීම්කරුවන් ලෙස පුහුණු කරන ලදි.

ජාත්‍යන්තර සහයෝගීතාවය යටතේ නේපාල රජයේ හා ඇෆ්ගනිස්තාන් රජයේ වෘත්තීය පුහුණුව භාර නිලධාරීන් කණ්ඩායම් 2ක් ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව පිළිබඳව අධ්‍යයනය කිරීමට අප රටට එන ලදි. එසේම ආධාර ලබාදෙන ආයතන කිහිපයක් සමඟ සාකච්ඡා වාර කිහිපයකටද සහභාගීවීමට 2012 වර්ෂය තුලදී කොමිෂන් සභාවට හැකිවිය. මෙම සියලු කාර්යයන් සැලකූ විට 2012 වර්ෂය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව තව දුරටත් ඉදිරියට පියවර තැබූ වර්ෂයක් ලෙස හැඳින්විය හැකිය.

**බී එච් එස් සුරවීර**

වැඩබලන අධ්‍යක්‍ෂ ජනරාල්

## 1.0 හැඳින්වීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනත මඟින් 1999 දෙසැම්බර් 16 දින සිට ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියලුම මට්ටම් වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම.

(ආ) සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රධානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම, සහ

(ඇ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්පායතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියලු ආයතනවල ශාස්ත්‍රීයය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම.

## 2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වේ.

**2012 වසර තුල කොමිෂන් සභා සංයුතිය**

**පනතේ 6(1)(ඌ) වගන්තිය යටතේ කර ඇති පත්වීම්**

1) මහාචාර්ය දයන්ත එස්. විජයසේකර මහතා - සභාපති
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

2) ආචාර්ය තුසිත තෙන්නකෝන් මහතා (2012 පෙබරවාරි දක්වා) - සාමාජික
ජෙරාල්ඩ් රූබේරා මහතා (2012 මැයි 26 සිට 2012 නොවැම්බර් දක්වා)
නලින් ආටිගල මහතා (2012 නොවැම්බර් 28 සිට )
ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ නියෝජිත

3) ආචාර්ය කේ.එල්. චන්ද්‍රතිලක මහතා - සාමාජික
ශ්‍රී ලංකා සේවා යෝජක මණ්ඩලයේ නියෝජිත

4) නන්දදාස රාජපක්ෂ මහතා - සාමාජික
ශ්‍රී ලංකා කුඩා හා මධ්‍යම කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත

5) සී. ලාල් ද අල්විස් මහතා - සාමාජික
ජාතික වාණිජ මණ්ඩලයේ නියෝජිත

6) තිස්ස සෙනෙවිරත්න මහතා - සාමාජික
ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත

7) සී.ජේ. ගුණසීල මහතා - සාමාජික
සබරගමුව වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත

8) අයි.එස්. තිලකවර්ධන මහතා - සාමාජික
ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිත

9) නීතිඥ සෙනරත් ජයසුන්දර මහතා - සාමාජික
ගරු ඇමතිතුමා පත් කරන ලද නියෝජිත

10) වෛද්‍ය ජී. විජේසූරිය මහතා - සාමාජික
ගරු ඇමතිතුමා පත් කරන ලද නියෝජිත

**පනතේ 6(1)(අ) සිට (උ) වගන්ති යටතේ කර ඇති පත්වීම්**

අ) බී.එච්.එස්.සුරවීර මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල් - වැ.බ.,
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

ආ) ආචාර්ය තිස්ස ජිනසේන මහතා (2012 නොවැම්බර් 14 මස දක්වා) - සාමාජික
කේ.ඒ.සී.අරුණදේවා සිල්වා මහතා(2012 නොවැම්බර් 15 සිට)
සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) ධම්මික හේවාපතිරණ මහතා (2012 අගෝස්තු මස දක්වා) - සාමාජික
කර්නල් එස්.පී.ආර්.රත්නායක මහතා (2012 ඔක්තෝම්බර් 04 සිට)
සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) ආචාර්ය එච්.සී. අඹවත්ත මහතා (2012 ඔක්තෝම්බර් මස දක්වා) සාමාජික
ඩබ්.ඒ.ජයවික්‍රම මහතා(2012 නොවැම්බර් 19 සිට)
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ඉ) මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) පී.එච්.ඒ.එස්.විජයරත්න මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

උ) ලෙස්ලි දේවේන්ද්‍ර මහතා - සාමාජික
වෘත්තීය සමිති නියෝජිත

## 3.0 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු ඇතුළු 65 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් 2012 වසර තුළදී කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටුකරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ඉටු කරගැනීම පිණිස පහත දැක්වෙන අංශ යටතේ කටයුතු සංවිධානය කරනු ලැබ ඇත.

- පාලන හා මුදල් අංශය
- සැලසුම් හා පර්යේෂණ අංශය
- පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය
- ජාතික වෘත්තීය සුදුසුකම් අංශය
- තොරතුරු පද්ධති අංශය

කොමිෂන් සභාව සඳහා 83 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතව ඇතත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2012.12.31 දිනට කාර්ය මණ්ඩලය 65 දෙනෙකුගෙන් සමන්විත විය. විස්තර පහත දක්වා ඇත.

වගුව **3.1:** **කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය - 2012**

| | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2012/12/31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | - |
| 2 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 3 | අධ්‍යක්ෂ | 05 | 03 |
| 4 | අධ්‍යක්ෂ පාලන | 01 | 01 |
| 5 | ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක | 01 | 01 |
| 6 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්‍ෂ | 14 | 09 |
| 7 | අභ්‍යන්තර විගනක | 01 | 01 |
| 8 | සහකාර අධ්‍යක්ෂ - නීති /කොමිෂන් සභා ලේකම් | 01 | 01 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (මුදල්) | 01 | 01 |

| | | | |
|---|---|---|---|
| 10 | සංඛ්‍යාලේඛණඥ | 01 | 01 |
| 11 | පුස්තකාලයාධිපති / ප්‍රලේඛණ නිලධාරි | 01 | 01 |
| 12 | පරිපාලන නිළධාරි | 01 | 01 |
| 13 | භාෂා පරිවර්ථක (සිංහල,දෙමළ,ඉංග්‍රිසි ) | 01 | - |
| 14 | සංවර්ධන නිළධාරි | 12 | 08 |
| 15 | තොරතුරු තාක්‍ෂණ නිළධාරි | 01 | 01 |
| 16 | තොරතුරු තාක්‍ෂණ සහකාර | 01 | - |
| 17 | පරිගණක යෙදවුම් සහකාර | 04 | 04 |
| 18 | පුස්තකාල / ප්‍රලේඛණ සහකාර | 01 | 01 |
| 18 | කළමනාකරණ සහකාර (I ශ්‍රේණිය/ II ශ්‍රේණිය / III ශ්‍රේණිය) | 15 | 14 |
| 19 | රියැදුරු (I ශ්‍රේණිය / II ශ්‍රේණිය / III ශ්‍රේණිය) | 12 | 10 |
| 20 | කාර්යාල සහායක | 07 | 07 |
| | **එකතුව** | **83** | **65** |

මෙම වර්ෂය තුළ ක්ෂේත්‍රයේ විශාල අඩුපාඩුවක්ව පවතින වෘත්තීය ඇගයීම් සිදුකිරීමට ක්‍රමවත් විභාග ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා විභාග ඇගයීම් ඒකකයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය කොමිෂන් සභාව විසින් හඳුනාගන්නා ලදී. ඒ සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එම අංශය ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. මේ සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව පහත සඳහන් තනතුරු අනුමත කර තිබේ.

| | |
|---|---|
| අධ්‍යක්‍ෂ තනතුරු | 1 |
| නියෝජ්‍ය / සහකාර අධ්‍යක්‍ෂ තනතුරු | 2 |
| සංවර්ධන නිළධාරී තනතුරු | 2 |
| | 5 |

මෙම අංශය ස්ථාපිත කිරීමේදී බඳවා ගැනීමේ පරිපාටියේ ඇතිවූ සංශෝධනයන් නැවත අනුමත කරවා ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට යොමුකර ඇති අතර, එය අනුමත වන තෙක් තාවකාලිකව මෙම ඒකකය ස්ථාපිත කිරීම ප්‍රමාද කර ඇත. මෙම තනතුරු වලට අමතරව මෙම වර්ෂය තුල සහකාර අධ්‍යක්‍ෂ තනතුරු 02ක් සහ රියදුරු තනතුරු 02ක් අනුමත විය.

පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 02 සඳහා අවස්ථා 02 කදී සම්මුඛ පරීක්‍ෂණ පවත්වා අයදුම් කරුවන් අතරින් සුදුසුකම් සහිත අය තෝරාගන්නා ලදී. නමුත් පළමු සම්මුඛ පරීක්ෂණයෙන්

තෝරා ගත් පුද්ගලයන් දෙදෙනාම සේවයට වාර්ථා නොකරන ලද අතර දෙවන සම්මුඛ පරීක්ෂණයේදී තෝරාගත් දෙදෙනාගෙන් එක් අයදුම්කරුවකු පමණක් 2013.01.02 වන දින සිට සේවයට වාර්තා කර ඇත. මීට අමතරව 2012 වර්ෂයේදී භාෂා පරිවර්ථක, තොරතුරු සහකාර, පුස්තකාල සහකාර, තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. මේ සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අයදුම්කරුවන් අතර සුදුසු අයකු නොවූ බැවින් නැවත අයදුම්පත් කැඳවා තෝරා පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර තිබේ.පුරප්පාඩු පවතින ඉතිරි තනතුරු සඳහා අමාත්‍යංශයේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර ඇත.

# 4.0 පාලන හා මුදල් අංශය

පාලන හා මුදල් අංශය අධ්‍යක්ෂ (පරිපාලන), නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) හා පරිපාලන නිළධාරියෙකු ඇතුලු 30 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වන අතර, කොමිෂන් සභාවේ කාර්යභාරය කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරලීමට අවශ්‍ය වන මානව හා මූල්‍ය සම්පත් කළමනාකරණය ඇතුළු යටිතල පහසුකම් සැපයීමේ කාර්යයන් ඉටුකරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම්සඳහන් නිළධාරීන් 2012 වසර තුලදී කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ලදී.

## 4.1 2012 වසරේ නව පත්වීම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| බී.එස්.ජේ.විපුල්සි මිය | සංවර්ධන නිළධාරී | 2012.01.02 |
| එච්.එම්.ඒ.ඩී.කේ.හේරත් මිය | සංවර්ධන නිළධාරී | 2012.01.02 |
| එච්.එස්.අබේගුණතිලක මහතා | සංවර්ධන නිළධාරී | 2012.01.02 |
| නදීෂ් ද සිල්වා මහතා | සංවර්ධන නිළධාරී | 2012.01.02 |
| අයි.ජී.කල්ප උදාර මහතා | සංවර්ධන නිළධාරී | 2012.07.10 |
| ප්‍රසංග මුතුකුමාරණ මහතා | සංවර්ධන නිළධාරී | 2012.11.03 |
| චන්දි මේනකා මහතා | කළමණාකරන සහකාර | 2012.03.01 |
| ඒ.පී.ඉන්ද්‍රණි මෙය | කාර්යාල සහායක | 2012.03.01 |

## 4.2 2012 වසරේ සේවයෙන් ඉල්ලා අස්වීම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| පී. ජී. ආනන්ද | සංවර්ධන නිළධාරී | 2012/03/01 |
| පී. එම්. චාන්දනී | සංවර්ධන නිළධාරී | 2012/03/28 |
| වයි.එල්.ඒ.එස්.ආර්. ලියනාරච්චි | සංවර්ධන නිළධාරී | 2012/06/01 |
| රනිල් නිශාන්ත හපුගොඩ | කළමණාකරන සහකාර | 2012/09/30 |
| ජී. එන්. මල්ලවආරච්චි | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2012/09/01 |

## 4.3 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරිමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුලින් තේරී පත් වූ නිළධාරීන්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| බී.එච්.එස්.සුරවීර මහතා | අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා | 2011.12 .17 |
| එස්.යූ.කේ. රුබසිංහ මහතා | අධ්‍යක්ෂ (පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත) තනතුරෙහි වැඩබැලීම සඳහා | 2009.07.01 |

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවය 2011.11.30 දින සිට අවසන් වූ බැවින් එදින සිට 2012.12.31 දක්වා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් බී.එච්.එස්. සුරවීර මහතා අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරේ වැඩ බලන ලද අතර අමාත්‍යංශය විසින් අධ්‍යක්‍ෂ ජනරාල්වරයකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්‍ෂණය තබා අවසන් කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම තනතුරේ පුරප්පාඩුව සම්පුර්ණ වනු ඇත.

2006 වර්ෂයේදී බඳවා ගැනීමේ පරිපාටිය අලුතින් සකස් කිරීම වැටුප් සහ සංඛ්‍යා ලේඛන කොමිෂන් සභාවේ උපදෙස් හා අධීක්‍ෂණය යටතේ සිදුකිරීම ආරම්භ කරන ලද අතර එය සකස් කර අවසන් වී නව බඳවා ගැනීමේ පරිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නව සුදුසුකම් යටතේ අධ්‍යක්ෂ (පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත) තනතුර බඳවා ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය බැවින් මෙම තනතුරු බඳවා නොගන්නා ලදී. මේ වන විට බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වී ඇතත් එම බඳවා ගැනීමේ පරිපාටිය නැවත අධ්‍යක්‍ෂ මණ්ඩලය මඟින් සංශෝධනය කර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බැවින් එය අනුමත වන තෙක් මෙම බඳවා ගැනීම කල්තබා ඇත.කෙසේ වෙතත් එම අනුමැතියෙන් පසු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

## 4.4 දේශීය හා විදේශීය පුහුණුව

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව නිලධාරීන් දේශීය හා විදේශීය පුහුණුවීම් / සම්මන්ත්‍රණ වලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය හා විදේශීය පුහුණුවීම් / සම්මන්ත්‍රණ වලට සහභාගී වූ නිළධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**දේශීය පුහුණු - 2012**

කාර්ය මණ්ඩලය වෙත දේශීය පුහුණු ලබාදීම පහත සඳහන් ආකාරයන්ට සිදු කරන ලදී.

වගුව 4.1 : **දේශීය පුහුණු**

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| බී.එච්.එස්.සුරවීර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | Workshop On Effective Proposal Writing -National Science Foundation | One Day |
| පී.සී.පී. ජයතිලක මයා | අධ්‍යක්ෂ( සැලසුම් හා පර්යේෂණ) | Maximizing National productivity for sustainable growth-OPA | 08/10/2012 - 09/10/2012 |
| ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මයා | අධ්‍යක්ෂ(තොරතුරු පද්ධති) | Japanese Style of Management-Jasteca Institute | 08/27/2012 |
| ඒ.එස්.අමරසිංහ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | IFRS<br>IFRS Part Two<br>Prag Institute -DO- | 21/08/2012 - 18/ 09/ 2012 |
| එස්.යු.කේ. රුබසිංහ මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | Japanese Style of Management-Jasteca Institute | 08/27/2012 |
| අජිත් කුසුම් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | Workshop On Effective Proposal Writing-National Science Foundation | One Day |
| චන්ද්‍රානි ප්‍රේමරත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | Japanese Style of Management-Jasteca Institute | 08/27/2012 |
| පී.පී. නානායක්කාර මිය | සහකාර අධ්‍යක්ෂ | Workshop On Effective Proposal Writing- National Science Foundation | One Day |
| ජී.ඒ.එම්.යු. ගනේපොල මයා | සහකාර අධ්‍යක්ෂ | Professional Development programme In Project Management-NIBM | 1900 hrs |
| නෙළුම් සමරකෝන් මිය. | සහකාර අධ්‍යක්ෂ | Workshop On Managing Legal matters In Government Institutions-Sri lanka Foundation | 06/11/2012 - 08/11/2012 |
| ඩබ්.එම්.ටී.ඒ. වීරකෝන් මයා | පුස්තකාලාධිපති/ ප්‍රලේකන නිළධාරී | 01.National conference on Library | 21/06/2012 සහ 28/08/2012 |
| | | 02.Japanese Style of Management-Hotel Renuka Jasteca Institute | 28/08/2012 |

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| ජී.ඩී.එන්.එම්. පෙරේරා මිය | පරිපාලන නිළධාරී | Special Education Diploma (For vulnerable group)- National Institute of Education | 2012 අධ්‍යයන වර්ෂය |
| | | Coordination of Prepare SOR-NHRDC | 11/12/2012 |
| බී.එච්.ජේ. විපුල්සි මිය | සංවර්ධන නිළධාරී | Coordination of Prepare SOR-NHRDC | 11/12/2012 |
| අයි.ජී.කල්ප උදාර මයා | සංවර්ධන නිළධාරී | Positive attitudes t wards proved government service-NHRDC | 11/05/2012 |
| | | Coordination of Prepare SOR-NHRDC | 11/12/2012 |
| ඩබ්.ජී.සුමින්ද අරුණකීර්ති මයා | කළමණාකරන සහකාර | Coordination of Prepare SOR-NHRDC | 11/12/2012 |
| එච්.බී. ඉන්දික සම්පත් මයා | කළමණාකරන සහකාර | Positive attitudes towards proved government service-NHRDC | 11/05/2012 |
| ඩී.ඩබ්. නිමල් ගුණසිරි මයා | කාර්යාල සහයක | Personal Grooming Business & Social Etiquette-SDFL | 03/22/2012 |
| | | Higher Productivity K.K.S.Traning-NILS | 04/10/2012-05/10/2012 |
| එම්.ඩබ්.අසංක රංගන මයා | කාර්යාල සහයක | Higher Productivity K.K.S.Traning-NILS | 11/10/1012 -12/10/2012 |
| ජේ.තිලක් ධම්මික මයා | කාර්යාල සහයක | Higher Productivity K.K.S.Traning-NILS | 04/12/2012 -05/12/2012 |
| එම්.වී.සී.ජගත් කුමාර මයා | කාර්යාල සහයක | Higerh Productivity K.K.S.Traning-NILS | 11/10/1012 -12/10/2012 |
| අයි.පී. ඉන්ද්‍රානි මෙනවිය | කාර්යාල සහයක | Higher Productivity K.K.S.Traning-NILS | 11/10/1012 -12/10/2012 |
| එස්.එස්. කල්පගේ මයා | කාර්යාල සහයක | Higher Productivity K.K.S.Traning-NILS | 11/10/1012 -12/10/2012 |
| ජී.ජී. සමන් කුමාර මයා | කාර්යාල සහයක | Personal Grooming Business & Social Etiquette-SDFL | 03/22/2012 |
| | | Higher Productivity K.K.S.Traning-NILS | 04/10/2012-05/10/2012 |

**විදේශ පුහුණු - 2012**

වගුව **4.2 :** විදේශ පුහුණු

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| බී.එච්.එස්. සුරවීර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01.South Asia Regional Conference -India | 2012/06/25-2012/06/26 |
| | | 02.Unevoc Coordinators-Germany | 2012/09/11 - 2012/09/14 |
| පී.සී.පී. ජයතිලක මයා | අධ්‍යක්ෂ | 01. Green Jobs in Asia Reginal Conference - Indunisia | 2012/08/29 – 2012/08/31 |
| | | 02. Setting up of technology Development fund-Maleshiya | 2012/12/03 – 2012/12/07 |
| ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මයා | අධ්‍යක්ෂ(තොරතුරු පද්ධති) | 01.Third Asia Regional Programme-India | 2012/01/30-2012/02/04 |
| | | 02. Unesco-Unevoc Special Session-China | 2012/05/12-2012/05/18 |
| | | 03.International Forum on the role of the UNEVOC network in transforming TVET for a Sustainable future-.Bonn, Germany | 2012/11/14 - 2012/11/16 |
| වජිර පෙරේරා මයා | අධ්‍යක්ෂ (ජාතික වෘත්තීය සුදුසුකම්) | Study Tour On Sri lanka -Malayasia Knowledge Exchange On Skills Development Strategies-Maleshiya | 2012/07/23-2012/07/28 |
| එස්.යු.කේ. රූබසිංහ මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාඨමාලා පිළිගැනීම් පුහුණු සම්මත) | Study Tour On Sri lanka -Malayasia Knowledge Exchange On Skills Development Strategies-Maleshiya | 2012/07/23-2012/07/28 |
| අජිත් පොල්වත්ත මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම් හා පර්යේෂණ) | Study Tour On Sri lanka -Malayasia Knowledge Exchange On Skills Development Strategies-Maleshiya | 2012/07/23-2012/07/28 |
| ජී.ඒ.එම්.යු. ගනේපොල මයා | සංවර්ධන නිළධාරී | KRIVET Asia Pacific TVET Experts workshop capacity Building of TVET TEACHERS-Korea | 2012/10/22 – 2012/12/26 |

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| පි.එම්.සී.පී. ගුණතිලක මයා | සංවර්ධන නිළධාරී | HOD Executive Training in Information technology- Sigapore | 2012/06/10 - 201206/23 |
| වයි.පී.එස්. උදයකාන්ති | පරිගණක යෙදවුම් සහායක | HOD Executive Training in Information technology- Sigapore | 2012/06/10 – 2012/06/23 |

## 4.5 වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභා නිළධාරීන්ගේ වෘත්තීය ආයතනවල වාර්ෂික සාමාජික ගාස්තු ගෙවීමේදී පහත සඳහන් නිළධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූරණය කර ඇත.

1. මහාචාර්ය දයන්ත විජේසේකර මයා සභාපති - Chartered Insititute of Logestics and Transport
   - Insititue of Civil Engineers - London

2. බී.එච්.එස්.සුරවීර මයා අධ්‍යක්ෂ ජනරාල් වැ.බ. - Insitution of Engineers Sri Lanka
   Sri Lanka Insititue of Training and Development

3. ඩබ්.පී.එම්.පී. ප්‍රේමචන්ද්‍ර මයා අධ්‍යක්ෂ (පාලන) - Association of Accounting Technicians of Sri Lanka

4. ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මයා අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) - The Chartered Institute for IT (BCS)
   The Computer Society of Sri Lanka

5. එච්.එම්.ඒ.ඩී.කේ.හේරත් සංවර්ධන නිළධාරී(තොරතුරු පද්ධති) - The Computer Society of Sri Lanka

6. එස්.යු.කේ.රූබසිංහ මහතා වැ.බ.අධ්‍යක්ෂ (පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත) - Insitution of Engineers Sri Lanka

7. එච්.එස්.එම්.ඒ.ටී.එන්.ඩී. සමරකෝන් සහකාර අධ්‍යක්ෂ(නීති/ -අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) - Bar Association of Sri Lanka

## 4.6 මූල්‍ය ප්‍රගතිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙනු ඇත.

2012 වර්ෂය සඳහා කොමිෂන් සභාව සිය වියදම් සඳහා පහත පරිදි ඇස්තමේන්තු කරන ලදි.

පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 55.073 කි.

ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් මිලියන 12.239 කි.

මෙම වියදම් වලින් 2012 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 50.3 ක්ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 10.130 ක්ද කොමිෂන් සභාව වෙත නිදහස් කරන ලදි.

2012 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත වියදම් 2011 වර්ෂය සමඟ සැසඳීමේදී පුනරාවර්තන ඇස්තමේන්තුවෙහි 14% වැඩිවීමක් වන අතර ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවෙහි 63%ක අඩුවීමක් දක්නට ලැබේ.

2012 වසර තුලදී 078-1001-1226834 ගිණුමෙහි අතිරික්තයෙන් රු. 800,000 තුන්මස් ඇමතුම් තැන්පතුවක ආයෝජනය කළ හැකි විය. කොමිෂන් සභාව 2012 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී රුපියල් මිලියන 4.773 ක ආදායමක් අපේක්ෂා කල අතර ආදායම හා සත්‍ය ආදායම 4.459 ක් විය.

මේ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | ඇස්තමේන්තු ගත ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) |
|---|---|---|
| ශිෂ්‍ය වාර්තා පොත් විකුණුම් ශුද්ධ ආදායම | 1,453,996 | 1,292,645 |
| ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු | 584,950 | 584,950 |
| ආයතන ප්‍රතීතනය කිරීමේ ගාස්තු | 1,114,550 | 1,114,550 |
| වෙනත් | 1,620,246 | 1,467,790 |
| **එකතුව** | 4,773,742 | 4,459,935 |

## 4.7 අභ්‍යන්තර විගණනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන හා පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත.පෙර වර්ෂ වලදී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස් වලට, කොමිෂන් සභාව පනත, හා කොමිෂන් සභාවට අදාළ වන වෙනත් නීතිරීති වලට අනුකූල වීම

විමසමින් අභ්‍යන්තර විගණන කටයුතු ඉදිරියට ගෙන යන ලදි. විගණන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම විගණන හා කළමනාකරණ කමිටුව මඟින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌණතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාළ නිළධාරීන්ගේ අවධානයට යොමු කිරීම අවශ්‍ය කටයුතු අදාළ වර්ෂයේදී සිදු කරන ලදි.

1. විගණන හා කලමනාකරණ කමිටුව නිසි පරිදි 2012 වර්ෂය තුළ අවස්ථා පහකදී රැස් වන ලදි. ඒනම් 2012 .02.28, 2012.06.27, 2012.08.02, 2012.08.29 සහ 2012.12.13 දිනයන්හිදී රැස්වන ලදි.
2. විගණන හා කලමනාකරණ කමිටුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් පිළිබඳව අවධානය යොමු කරමින් සාකච්ඡා කරන ලද අතර අවශ්‍ය අදාල ක්‍රියාමාර්ග ගැනීමට උපෙදස් දෙන ලදි.
   i. අභ්‍යන්තර විගණන වැඩසටහන හා කාර්යයන් පිළිබඳව
   ii. කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තා හා වාර්ෂික වාර්තාව පිළිබඳව
   iii. කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යය සාධනය පිළිබඳව
   iv. කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලන හා විධි ක්‍රම පිලිබඳව

3. අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව ප්‍රධාන විගණන ප්‍රදේශ 12 ක් ආවරණ කිරීමට සැළසුම් කරන ලද නමුත් විගණන ප්‍රදේශයන් 10ක් ආවරණය කරන ලද අතර අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව සැළසුම් නොකරන ලද විගණන කාර්යයන් 2 ක් අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂක ජනරාල්ගේ හා විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදි.
4. පෙර වර්ෂයේදී මෙන් 2012 වර්ෂයේදී ද ඉදිරි වසර වලදී කාර්යසාධන පාදක අයවැයක් (Performances Based Budget) සංවර්ධනය කිරීමේ අරමුණින් පරිගණක ගිණුම්කරණ පද්ධතියක් සම්පූර්ණ ක්‍රියාකාරි තත්වයට පත් කර ඇත. එනම් ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම දක්වා වූ ගිණුම් ක්‍රියාකාරීත්වය, තොග පාලනය, මිළ දී ගැනීම, ගෙවීම් කිරීම, මුදල් ලබා ගැනීම හා ස්ථාවර වත්කම් ලේඛනද ඇතුළුව අභ්‍යන්තර පාලන විධි වලින් සමන්විත වී ඇත

## 4.8 නීති කටයුතු

1. පනත ප්‍රකාරව පුහුණු ආයතන ලියාපදිංචි කිරීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 14(1) හා 15(1) වගන්තීන් ප්‍රකාරව රජයේ හෝ පෞද්ගලික/ රාජ්‍ය නොවන අංශයේ කිසියම් හෝ ආයතනයක් විසින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතනයන් හෝ පාඨමාලාවන් හෝ

පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික හැකියාව ලබා ගැනීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සිදු කරගත යුතු වේ. ඒ අනුව ලියාපදිංචි නොවී ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ආයතනයට එරෙහිව කටයුතු කිරීම මෙම කොමිෂන් සභාව මගින් සිදුකරනු ලැබේ. දැනට ආයතන 55 කට පමණ ඉහත කී නෛතික අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කර ඇති අතර අදාල ආයතනයන්ට ලියාපදිංචි වීමේ නෛතික අවශ්‍යතාවය දක්වා ලිපි මගින් දැනුම් දී ඇති අතර, ඉන් දැනට ආයතන 33 ක් පමණ එයට ප්‍රතිචාර දක්වා ඇත.

2. පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත වසර 22 ක් පැරණි පනතක් වන අතර එහි ලියාපදිංචි නොවූ ආයතනයක් සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කුමක්ද යන්න පිළිබඳව වගන්තියක් හෝ පියවර හෝ නිසි අධිකරණය දක්වා නොමැත. එසේ හෙයින් නීත්‍යානුකූල පියවර ගැනීමේ දැඩි අපහසුතාවක් පැනනැගී ඇත.
යෝජිත සංශෝධන මගින් අධිකරණ බලය පිළිබඳ වගන්තීන් ඇතුළත් කර මෙම පනත ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.
එසේම 2004 දී හඳුන්වා දුන් ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සහ ප්‍රතීතනය කිරීම වඩාත් විධිමත් කිරීමට අවශ්‍ය විය. ඒ අනුව වෘත්තීය පුහුණුව සංශෝධනය කිරීමේදී ඇතිවන අභියෝගයන්ට වඩාත් ඵලදායි ලෙස මුහුණ දීම සඳහා පනත සංශෝධනය කිරීම අවශ්‍ය විය.
මෙහිදී කොමිෂන් සභාව විසින් නීති උපකමිටුවක් පත්කළ අතර කාර්ය මණ්ඩලය සහ අදාළ බාහිර පාර්ශවයන්ගේ අදහස් විමසා සංශෝධිත පනත කෙටුම්පත් කරන ලදී. එම කෙටුම්පත වෙබ් අඩවියේ එලකොට පුවත්පත් මඟින් මහජන අදහස් විමසා / නැවතත් බාහිර පාර්ශවයන්ගේ අදහස් විමසා සකස්කරන ලද අවසන් පනත් කෙටුම්පත අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. අමාත්‍යාංශය විසින් සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. 2013 වර්ෂය තුළ සංශෝධිත පනත පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

3. ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය පියවර.

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 04 (ඊ) හා 04 (ඌ) වගන්ති යටතේ පෞද්ගලික අංශයේ / රාජ්‍ය නොවන අංශයේ ආයතනයන්ට දී ඇති මූල්‍ය ප්‍රදානයන් නිසිලෙස ක්‍රියාත්මක නොකර හා පාඨමාලා ප්‍රතීතනය නොවී පවත්වාගෙන යනු ලබන ආයතනයන් මගින් එම ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමද සිදු කරන ලදී.

ඒ අනුව එම ආයතනයන් වෙත නඩු පැවරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සහකාර අධ්‍යක්ෂ නීති විසින් සිය නිරීක්ෂණ සමඟ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. 2012/06/27, 2012/10/12, 2012/11/28 වන දිනයන්හිදී නීතිපති දෙපාර්තමේන්තුව සහ මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් සමඟ මේ සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක්ද පවත්වන ලදී.

4. TVEC නාමය හා ලාංඡනය වැරදි ලෙස භාවිතා කිරීම වැලක්වීම.

බොහෝ පුහුණු ආයතන විසින් TVEC නාමය හා ලාංඡනය වැරදි ලෙස භාවිතා කරන බවට නිරන්තරයෙන් වාර්තා වේ. ඒ පිළිබඳව නීතිමය පියවර ගැනීමේදී, TVEC නම හා ලාංඡනයෙහි අයිතිය තහවුරු කිරීමට සිදුවේ. එම නිසා 2012/08/24 දින කොමිෂන් සභාවේ TVEC නිල ලාංඡනය සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) යන තේමාව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමද සිදුකර ඇති අතර එමඟින් මෙම ආයතනයේ අනන්‍යතාවය නීතිමය වශයෙන් ශක්තිමත් වේ.

## 5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතෙහි පළමු අරමුණ වූ, “ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම” සඳහා සක්‍රීය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත්බඳ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂෙත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම
- තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සැලසුම් හා පර්යේෂණ අංශය කාර්ය මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම අංශය අධ්‍යක්ෂවරයෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකු සහ සහාය කාර්යමණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු වනසේ සංවිධානය වී ඇත.

ඒ අනුව සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන වැඩසටහන් 2012 වසරේදී ක්‍රියාත්මකකර ඇත.

### 5.1 රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශණය කිරීම.

රාජ්‍ය, පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු ආයතනයන් හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා ශ්‍රම වෙළෙඳපොල අදාලත්වය දියුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ ලබාදීම පිණිස කොමිෂන් සභාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ මගින් රාජ්‍ය හා පුද්ගලික අංශයේ පුහුණු පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනයකර ඒ තුලින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ප්‍රදානය කිරීමට හැකියාව ලැබේ.

මූලාධාර විමර්ශණ වැඩසටහන යටතේ 2011 වර්ෂයේදී කොමිෂන් සභාව මඟින් මූලාධාර ලබා දුන් පුහුණු පාඨමාලා විමර්ශනයට ලක් කරන ලදී. එයට අමතරව පවත්නා වර්ෂයේදී මූලාධාර ලබාදීමට සුදුසු පුහුණු ආයතන තෝරාගැනීම සඳහා ඇගයීම් කටයුතු ද සිදු කරන ලදී.


2012 වර්ෂය තුලදී මූලාධාර වැඩසටහන දීප ව්‍යාප්ත මට්ටමින් සිදුකල අතර, අපේක්ෂිත මූලාධාර ප්‍රමාණය මේ වර්ෂය තුලදී ලබාදීමට හැකියාව ලැබුණි. මෙම වර්ෂය තුලදී මූලාධාර ලබාදීම පිළිබඳ විස්තර අංශ අනුව පහත වගු අංක 5.1 මගින් දැක්වේ.

**වගුව 5.1: ලබාදුන් මූලාධාර ආංශික ව්‍යාප්තිය - 2012**

| අංශය | 2012 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන) | | මූලාධාර ප්‍රදානය කිරීමට අපේක්ෂාකල පාඨමාලා ගණන | සත්‍ය වියදමෙන් මූලාධාර ලබාදුන් පාඨමාලා සංඛ්‍යාව | ආයතන සංඛ්‍යාව | වැයවූ මුදල (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|
| | ආරම්භක | සංශෝධිත | | | | |
| රාජ්‍ය අංශය | 3.0 | 1.5 | 16 | 10 | 10 | 1.44 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය | 2.0 | 2.2 | 15 | 15 | 10 | 1.91* |
| පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතන අංශය | 0.9 | 0.9 | 11 | 11 | 06 | 0.87 |
| **එකතුව** | **5.9** | **4.6** | **42** | **36** | **26** | **4.41** |

*රු. මි. 0.227 ක මුදලක් 2013 වර්ෂයේදී වැය කිරීමට නියමිතය.

**ප්‍රස්ථාරය 5:1 අංශ අනුව මූලාධාර ලබාදීම**



මූලාධාර ප්‍රදානය පිළිබඳ විස්තර වෙන්වෙන් වශයෙන් පහත දක්වා ඇත.

### 5.1.1 රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සඳහා මූලාධාර සැපයීම

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ කොමිෂන් සභාව විසින් සකස්කරන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් මගින් හඳුනාගත් පුහුණු වැඩසටහන් රාජ්‍ය අංශයේ පුහුණු ආයතන තුලින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මූලාධාර ලබාදීමයි. හඳුනාගත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනයකර ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අවකාශ සැලසීමද මෙහිදී සිදුවේ.

රාජ්‍ය අංශයට මූලාධාර ලබාදීමේ දීප ව්‍යාප්ත වැඩසටහන යටතේ අප කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති පුහුණු ආයතන රාශියකට පසුගිය කාලය මුලුල්ලේ මූලාධාර ලබාදුනි. ඒ අතරින්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන පුහුණු ආයතනවල පාඨමාලා සංශෝධනය කිරීම සඳහා වාර්ෂිකව විශාල මූලාධාර ප්‍රමාණයක් ලබාදී ඇත.

නමුත් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබාදුන් වාචික උපදෙස් මත, 2012 වර්ෂය සඳහා අප අමාත්‍යාංශයෙන් පරිබාහිර පුහුණු ආයතනවලට මූලාධාර ලබාදීමට සලකා බලන ලදී. ඒ අනුව, අමාත්‍යාංශයෙන් පරිබාහිර පුහුණු ආයතනවලින් මූලාධාර ලබාදීමට අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ සඳහා ලද ප්‍රතිචාරමත පළාත් සභා මගින් ක්‍රියාත්මක කරනුලබන වෘත්තීය පුහුණු ආයතන සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබාදෙනලදී. ඒ අනුව, සියළුම පළාත් සභාවන්හි පුහුණු අධ්‍යක්ෂකවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන්නට යෙදුනු අතර, ඒ යටතේ ඌව හා දකුණු පළාත් සභාවල පුහුණු උපදේශකවරුන් සඳහා පුහුණු ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වන ලදී.


2012 වර්ෂයේ ද රාජ්‍ය අංශය සඳහා මූලාධාර ලබාදීමට රුපියල් මිලියන 3.0 ක් පාඨමාලා 16 ක් සඳහා වෙන්කර තිබුණි. මෙම මූලාධාර ප්‍රමාණය පුරෝකථනය කරනු ලබන්නේ 2011 වර්ෂයේදීය. නමුත් අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ දෙසැම්බර් මස දෙනලද උපදෙස්මත, අමාත්‍යාංශයෙන් පරිබාහිර ආයතනවලට පමණක් මූලාධාර ලබාදීමට සිදුවිය. එමනිසා, අප විසින් සැලසුම්කල පරිදි, රුපියල් මිලියන 3.0 ක් පාඨමාලා 16 ක් සඳහා ලබාදීමට නොහැකිවිය. ඒ අනුව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයේදී එම මූලාධාර ප්‍රමාණය රුපියල් මිලියන 1.5 දක්වා අඩු කිරීමට සිදුවිය. එමගින් පළාත්සභා මගින් ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන

10 ක පාඨමාලා 10 ක් සඳහා රු. මිලියන 1.44 ක් ප්‍රදානය කරනලදී. රාජ්‍ය අංශයේ කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ව්‍යාප්තිය පිළිබඳ විස්තර වගු අංක 5.2 හි සඳහන්වේ.

**වගුව 5.2: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ව්‍යාප්තිය - 2012**

| අංකය | කර්මාන්ත ක්ෂේත්‍රය | පාඨමාලා ගණන | ප්‍රදානය කළ මුදල (රු.) | ප්‍රතිශතය ( %) (ප්‍රදානය කල මුළු මුදලින්) |
|---|---|---|---|---|
| 1. | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | 07 | 1,075,295 | 74% |
| 2. | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | 03 | 371,357 | 26% |
| **එකතුව** | | **10** | **1,446,652** | **100%** |

ඉහත වගු අංක 5:2 අනුව, 2012 වර්ෂයේදී රාජ්‍ය අංශයේ ආයතන සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 02 ක් ආවරණය වන පරිදි මූල්‍යාධාර ලබා දී ඇති අතර, එසේ ලබාදුන් මූල්‍යාධාර වලින් 74%ක් ලබාදී ඇත්තේ දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳපොළ තුල ඉහළ ඉල්ලුමක් ඇති ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සඳහාය. එමෙන්ම, 2012 වර්ෂය තුලදී ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය සඳහා 26% ක මූල්‍යාධාර ප්‍රමාණයක් ප්‍රදානයකර ඇත. ඒ පිළිබඳ විශ්ලේෂණය ප්‍රස්ථාර අංක 5.2 මගින් දැක්වේ.




**ප්‍රස්ථාරය 5:2 කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම**

රාජ්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන එක් එක් ආයතන සඳහා 2012 වර්ෂයේදී ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් වෙන වෙනම වගු අංක 5.3 මගින් දැක්වේ.

**වගුව 5.3: රාජ්‍ය අංශය සඳහා මූල්‍යාධාර ලබාදීම - 2012**

| අංකය | ආයතනයේ නම | කර්මාන්ත ක්ෂෙත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| **මධ්‍යම පළාත් සභාව** | | | | |
| 1. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව කහවත්ත, ගම්පොළ | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 167,350 |
| 2. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව උඩගම, අටබාගේ | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 58,000 |
| 3. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව මාරියාවත්ත, ගම්පොළ | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 132,500 |
| 4. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව උයන්වත්ත, පොල්ගොල්ල | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 202,000 |
| 5. | කාර්මික පුහුණු ආයතනය මධ්‍යම පළාත් සභාව පිටියගෙදර, වත්තේගම | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පෑස්සුම් ශිල්පී 3 වන මට්ටම | 109,682 |
| 6. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව කඩුගන්නාව | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පෑස්සුම් ශිල්පී 3 වන මට්ටම | 54,050 |
| 7. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව ගලේවෙල | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 216,850 |
| 8. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මධ්‍යම පළාත් සභාව හඟුරන්කෙත | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 216,950 |

| අංකය | ආයතනයේ නම | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| 9. | කාර්මික පුහුණු ආයතනය (ලෝහ වැඩ) මධ්‍යම පළාත් සභාව බොරලැස්ස පාර, හඟුරන්කෙත | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පැස්සුම් ශිල්පී 3 වන මට්ටම | 207,625 |
| | | | **උප එකතුව - මධ්‍යම පළාත් සභාව** | **1,365,007** |
| **දකුණු පළාත් සභාව** | | | | |
| 10. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) දකුණු පළාත් සභාව අමලගොඩ, අකුරැස්ස | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 81,645 |
| | | | **උප එකතුව - දකුණු පළාත් සභාව** | **81,645** |
| | | | **එකතුව** | **1,446,652** |

### 5.1.2 පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතන වලට මූල්‍යාධාර සැපයීම

2012 වර්ෂයේදී පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා අදාලත්වය ඉහළ නැංවීම පිණිස මූල්‍යාධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 2.2 ක ප්‍රතිපාදන පාඨමාලා 15 ක් සඳහා වෙන්වී තිබුණි (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව). එම මූල්‍යාධාර ලබාදීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති වෘත්තීය පුහුණු ආයතන වෙත මූල්‍යාධාර අයදුම්කිරීමේ අයදුම්පත්‍ර තැපැල් මගින් යවනලදී. අනතුරුව ලැබුණු සුදුසු අයදුම්පත් කොමිෂන් සභාවේ නිළධාරීන් විසින් ඇගයීමට ලක්කරන ලදී.

එසේ තෝරාගන්නාලද පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු ආයතන 10 ක පාඨමාලා 15 ක් සඳහා රුපියල් මිලියන 2.1 ක මූල්‍යාධාර ලබාදෙන ලදී. ඒ අනුව, 2012 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 95.4% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබිණි. එලෙස මූල්‍යාධාර ප්‍රදානය කරනලද ආයතන පිළිබඳ විස්තර වගු අංක 5.4 හි දැක්වේ.

වගුව 5.4: **පෞද්ගලික/රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතනවලට මූලාධාර ලබාදීම - 2012**

| අංකය | පුහුණු ආයතනය හා ලිපිනය | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | අනුමත කරනලද මුළු මුදල (රු.) | ප්‍රතිපූරණය කරනලද මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1. | ජාත්‍යන්තර හෝටල් පාසල අංක.48, දුම්රියපොළ පාර, ගල්කිස්ස | ආහාරපාන කර්මාන්තය | බේකරි ශිල්පී 4 වන මට්ටම | 234,150 | **234,150** |
| 2. | ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සමාධි නිකේතන, දියකොබල, බිබිල | ඉදිකිරීම් කර්මාන්තය | දැවකාර්මික ශිල්පී 4 වන මට්ටම | 204,400 | **204,400** |
| | | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පෑස්සුම් ශිල්පී 3 වන මට්ටම | 41,055 | **41,055** |
| | | රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන | රබර් නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරු | 52,465 | **52,465** |
| 3. | මර්සි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය තැ. පෙ. 01, පුත්තලම, කොළඹ පාර, මදුරන්කුලිය | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පෑස්සුම් ශිල්පී 3 වන මට්ටම | 115,012 | 2013 වර්ෂයේ ජනවාරි මස අවසන් වනවිට මිලදී ගැනීම් සම්පූර්ණ කිරීමට නියමිතය |
| | | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | විදුලි කාර්මික ශිල්පී 3 වන මට්ටම | 112,112 | |
| 4. | සර්වෝදය ශ්‍රමදාන සංගමය වඩුකාර්මික පුහුණු මධ්‍යස්ථානය සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානය, පුරිජ්ජල, මාතලේ | ඉදිකිරීම් කර්මාන්තය | දැවකාර්මික ශිල්පී 4 වන මට්ටම | 71,575 | **71,575** |
| 5. | ශාන්ත අන්තෝනි කාර්මික ආයතනය 104, තිස්ස පාර, මොණරාගල | ඉදිකිරීම් කර්මාන්තය | දැවකාර්මික ශිල්පී 4 වන මට්ටම | 11,970 | **11,970** |
| | | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පෑස්සුම් ශිල්පී 3 වන මට්ටම | 346,500 | **346,500** |
| 6. | හ/ශ්‍රී කාවන්තිස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය කතරගම පාර, තිස්සමහාරාමය | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | මෝටර් රථ කාර්මික ශිල්පී 3 වන මට්ටම | 36,512 | **36,512** |
| 7. | ගාමිණී දිසානායක තාක්ෂණ හා වෘත්තීය | මුද්‍රණ කර්මාන්තය | පරිගණක චිත්‍රක ශිල්පී | 473,200 | **473,200** |


| අංකය | පුහුණු ආයතනය හා ලිපිනය | කර්මාන්ත ක්ෂෙත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | අනුමත කරනලද මුළු මුදල (රු.) | ප්‍රතිපූරණය කරනලද මුදල (රු.) |
|---|---|---|---|---|---|
| | අධ්‍යාපන ආයතනය ශ්‍රී සුමංගල මාවත, හාවා එලිය, නුවරඑළිය | | 4 වන මට්ටම | | |
| 8. | සමාධි ප්‍රජා සංවර්ධන පදනම ''සමාධි මැදුර'', අංක 47, ශ්‍රී රත්නසාර මාවත, මාතර | මුද්‍රණ කර්මාන්තය | පරිගණක චිත්‍රක ශිල්පී 4 වන මට්ටම | 221,200 | **221,200** |
| 9. | ශාන්ත ජෝෂප් කාර්මික ආයතනය, 345, බලාගාර පාර, ත්‍රිකුණාමලය | ඉදිකිරීම් කර්මාන්තය | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී 3 වන මට්ටම | 21,070 | **21,070** |
| | | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | විදුලි කාර්මික ශිල්පී 3 වන මට්ටම | 44,502 | **44,502** |
| 10. | දොන්බොස්කෝ වෘත්තීය පුහුණු ආයතනය නොච්චියාගම | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | විදුලි කාර්මික ශිල්පී 3 වන මට්ටම | 151,533 | **151,533** |
| **එකතුව** | | | | **2,137,258** | **1,910,133** |

පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය විසින් වෘත්තීය පුහුණුව සැපයීම සඳහා වැඩි නැඹුරුතාවයක් පෙන්නුම් කරන මුද්‍රණ කර්මාන්තය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වලින් 32.5% ක මූල්‍යාධාර ප්‍රමාණයක් 2012 වර්ෂයේ දී ලබා දී ඇත. 2012 වර්ෂය තුලදී ලබාදුන් මූල්‍යාධාර එක් එක් ක්ෂෙත්‍රය අනුව එම මුදල් බෙදීගොස් ඇති ආකාරය වගු අංක 5.5 මගින් දැක්වෙන අතර ප්‍රස්ථාර අංක 5.3 මගින් එහි විශ්ලේෂණය දැක්වේ.

වගුව 5.5: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම (පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය)

| කර්මාන්ත ක්ෂේත්‍රය | පාඨමාලා ගණන | ප්‍රදානය කළ මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | 03 | **308,148** | **14.4** |
| ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | 03 | **502,568** | **23.5** |
| රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන | 01 | **52,465** | **2.5** |
| මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | 01 | **36,512** | **1.7** |
| මුද්‍රණ කර්මාන්තය | 02 | **694,400** | **32.5** |
| ඉදිකිරීම් කර්මාන්තය | 04 | **309,015** | **14.5** |
| ආහාරපාන කර්මාන්තය | 01 | **234,150** | **11.0** |
| **එකතුව** | **15** | **2,137,258** | **100** |

**ප්‍රස්ථාරය 5:3 කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍ය ප්‍රදානය – පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය**



### 5.1.3 පීඩාවට පත්වූ තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය හා කාර්මික පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාර ප්‍රදානය

ශ්‍රී ලංකාව තුල සිටින පීඩාවට පත්වූ තරුණ තරුණියන්ගේ නිපුණතාවය ඉහළ නැංවීම පිණිස වෘත්තීය පුහුණුව සපයන ආයතනවලට අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා පාඨමාලා ප්‍රතිතන කොන්දේසියෙන් තොරව මූල්‍යාධාර ලබාදෙනු ලැබේ. 2012 වර්ෂය තුලදී මේ සඳහා රු. මි. 0.9ක් පාඨමාලා 11 ක් සඳහා ලබාදීමට සැලසුම්කර තිබූ අතර අපේක්ෂා කල පරිදි නිශ්චිත ඉලක්ක සපුරා ගැනීමට හැකිවිය. ඒ අනුව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී වෘත්තීය පුහුණුව සපයන එවැනි ආයතන හා පාඨමාලා සඳහා 2012 වර්ෂයේදී ප්‍රදානය කරනුලැබූ මූල්‍යාධාර පිළිබඳ විස්තර වගු අංක 5.6 හි දැක්වේ.

වගුව **5.6:** **පීඩාවට පත්වූ තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය හා කාර්මික පුහුණුව ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීම - 2012**

| අංකය | පුහුණු ආයතනයේ නම | හිමිකාරත්වය | කර්මාන්ත ක්ෂෙත්‍රය | පුහුණු පාඨමාලා වේ නම | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 1. | ලසාලියන් ප්‍රජා අධ්‍යාපන සේවා අංක 25 සහ 51, පන්සල් පාර, මට්මක්කුලිය, කොළඹ 15 | රාජ්‍ය නොවන සංවිධාන | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | විදුලි කාර්මික ශිල්පී | **104,810** |
| | | | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | පෑස්සුම් ශිල්පී | **66,650** |
| 2. | රජරට කාන්තා පදනම අංක 410, ඔළුකරඳ, කැකිරාව | රාජ්‍ය නොවන සංවිධාන | පුද්ගල හා කණ්ඩායම් සංවර්ධන ය | රූපාලාව න්‍යා හා කේෂාලංකරණ ශිල්පී | **24,575** |
| | | | රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තය | මැහුම් ශිල්පී | **71,210** |
| | | | අහාරපාන කර්මාන්තය | සූපවේදී | **5,990** |
| 3. | වෘත්තීය පුහුණු ආයතනය සමාජ සේවා දෙපාර්තමේන්තුව, තෙලබුයාය, | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ආහාරපාන තාක්ෂණ කර්මාන්තය | බේකරි ශිල්පී | **95,000** |
| | | | ගොඩනැගිලි ඉදිකිරීම් | දැවකාර්මික ශිල්පී | **76,950** |

| අංකය | පුහුණු ආයතනයේ නම | හිමිකාරත්වය | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලා වේ නම | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| | අඟුණුකොළපැලැස්ස | | කර්මාන්තය | | |
| 4. | ආබාධිතයන් සඳහා වූ සංගමය පහළගම පාර, කෝන්ගොල්ලෑව, තලාව | රාජ්‍ය නොවන සංවිධාන | රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තය | මැහුම් ශිල්පී | **45,020** |
| 5. | සුබිත කාන්තා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | රාජ්‍ය නොවන සංවිධාන | රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තය | මැහුම් ශිල්පී | **53,050** |
| 6. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සමාජ සේවා දෙපාර්තමේන්තුව ලියනගෙමුල්ල සීදූව | සමාජ සේවා දෙපාර්තමේන්තුව | රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තය | මැහුම් ශිල්පී | **77,300** |
| | | | සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය | සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී | **237,000** |
| | | | | **ප්‍රදානය කරනලද මුළු මුදල** | **857,555** |

එසේ තෝරාගන්නාලද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු ආයතන 06 ක පාඨමාලා 11 ක් සඳහා රුපියල් මිලියන 0.87 ක මූල්‍යාධාර ප්‍රමාණයක් ප්‍රදානය කරන ලද අතර, 2012 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා අනුමත ප්‍රතිපාදන වලින් 96.6% ක ප්‍රතිශතයක් වැය කිරීමට හැකියාව ලැබිණි.

### 5.1.4 මූල්‍යාධාර විමර්ශනය කිරීමේ වැඩසටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතනවලට ලබාදෙන මූල්‍යාධාර නිසිපරිදි භාවිතා කොට ඇත්දැයි විමර්ශනය කිරීම සඳහා වාර්ෂික විමර්ෂන වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන යටතේ 2011 වර්ෂයේදී කොමිෂන් සභාව මගින් මූල්‍යාධාර ලබාදුන් පුහුණු ආයතන වෙත ගොස් විමර්ශනයට ලක්කරන ලද අතර, ඒ යටතේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා 60 න් 31 ක් පිලිබඳව විමර්ශනය සිදුකරනු ලැබීය. එයට හේතුවූයේ, රාජ්‍ය අංශයේ ආයතන 29ක් උපකරණ මිලදීගෙන නොතිබූ බැවිනි.

මෙම වැඩසටහන තුලින් හඳුනාගත් පරිදි මූල්‍යාධාර ලබාදුන් පෞද්ගලික අංශයේ පාඨමාලා 19 අතුරින් පාඨමාලා 09 ක් ප්‍රතීතනය ලබාගෙන ඇත. අනෙකුත් පාඨමාලාද ප්‍රතීතන ක්‍රියාවලියට ඇතුලත්ව අවශ්‍ය කටයුතු සිදුවෙමින් පැවැති බැව් නිරීක්ෂණය විය. රාජ්‍ය අංශයේ පාඨමාලා 40 ක් අතුරින් පාඨමාලා 14 ක් පමණ ඇගයීමට ලක්කරන ලදී.

එම අධ්‍යනයේදී හෙලිවූ තොරතුරු සාරාංශයක් වගු අංක 5.7 මගින් දැක්වේ.

**වගු අංක 5.7: මූල්‍යාධාර විමර්ශනය තුළින් ලද තොරතුරු**

| අංශය | මූල්‍යාධාර ලබාදුන් ආයතන සංඛ්‍යාව | මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා සංඛ්‍යාව | ඇගයීම් කරනලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රදානය කරනලද මූල්‍යාධාර ප්‍රමාණය (රු.) | පුහුණුව ලද සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | **2011** | **2012** |
| රාජ්‍ය | 29 | 40 | 14 | 16,988,909 | 282 | 226 |
| පෞද්ගලික | 13 | 19 | 18 | 4,886,223 | 243 | 211 |
| පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට පුහුණුව සපයන ආයතන | 04 | 11 | 09 | 1.993,495 | 57 | 64 |
| **එකතුව** | **46** | **70** | **41** | **23,868,627** | **582** | **501** |

## 5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම

කොමිෂන් සභාව 1999 වසරේ සිට ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා අවශ්‍යවන නිපුණතා අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තිය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. මෙම වැඩසටහන යටතේ නව වෘත්තීය අධ්‍යාපන සැලසුම් සකස් කිරීම මෙන්ම දැනට සකස්කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීම සිදුවේ.

යාවත්කාලීන කරනලද සැලසුම් 02 ක් පිළියෙලකර අවසන් කරනලදී. තවද හඳුනාගත් දියුණුවන නව කර්මාන්ත ක්ෂේත්‍රයක් වන ප්‍රවාහන හා ගබඩාකරන ක්ෂේත්‍රය සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්මක් සකස් කිරීම 2012 අවසාන කාර්තුවේදී ආරම්භ කරනලදී.

2012 වර්ෂයේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ මීට පෙර සැලසුම්කර තිබූ කර්මාන්ත ක්ෂේත්‍ර 10 ක් සඳහා මානව සම්පත් අවශ්‍යතා ඇස්තමේන්තු සකස්කිරීම ආරම්භ කරනලද අතර, ඒවායේ කෙටුම්පත් වාර්ථා 2012 වර්ෂය තුලදී නිමකරන ලදී. මෙසේ සකස්කරන නව සහ යාවත්කාලීන කරනු ලබන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළිබඳ සාරාංශයක් වගු අංක 5.8 මගින් දැක්වේ.

**වගුව 5.8:** නව සහ යාවත්කාලීන කරනු ලබන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළිබඳ විස්තරය


| කර්මාන්ත ක්ෂේත්‍රය | | ප්‍රතිපාදන (සංශෝධිත) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| නව සැලසුම් | විදුලි සංදේශ කර්මාන්ත ක්ෂේත්‍රය | 160,000 | • වාර්ථාව අවසන්කර ඇත | 160,000 |
| | ප්‍රවාහන හා ගබඩාකරන ක්ෂේත්‍රය | 160,000 | • වාර්ථාව සැකසීම මොරටුව විශ්ව විද්‍යාලයේ ප්‍රවාහන හා ගබඩාකරන දෙපාර්තමේන්තුවට බාරදී ඇත. | 160,000 |
| යාවත්කාලීන කරනලද පුහුණු සැලසුම් | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්ත ක්ෂේත්‍රය | 427,270 | • වාර්ථාව සකසා අවසන්කර මුද්‍රණය කරනලදී | 427,270 |
| | හෝටල් හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය | 215,000 | • වාර්ථාව අවසන්කර ඇත | 214,7000 |
| | ක්ෂේත්‍ර 10 ක් සඳහා මානව සම්පත් ඇස්තමේන්තු සකස්කිරීම | 550,000 | • කෙටුම්පත් වාර්ථා 10 ක් සකස්කර ඇත<br>1. ඉදිකිරීම්<br>2. මුද්‍රණ<br>3. මැණික් හා ස්වර්ණාභරණ<br>4. මෝටර්රථ අළුත්වැඩියාව හා නඩත්තුව<br>5. ආහාරපාන තාක්ෂණය<br>6. රූපලාවන්‍ය හා කේෂාලංකරණ<br>7. ලෝහ හා ලුහු ඉංජිනේරු<br>8. වැව්ලි කර්මාන්තය<br>9. පරිපූරක වෛද්‍ය සේවා<br>10. නිම්ඇඳුම් හා ඇඟළුම් | 550,000 |

මෙම සැලසුම් සකස්කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 5.2.1 නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම

- **විදුලි සංදේශ කර්මාන්ත ක්ෂේත්‍රය**


2011 වර්ෂයේ දී මොරටුව විශ්ව විද්‍යාලයේ විදුලි සංදේශ ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් විදුලි සංදේශ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්මක් සකස් කිරීම ආරම්භ කරනලදී. එය 2012 වර්ෂය තුලදී නිමකිරීමට අපේක්ෂිත වූ පරිදිම සකස්කර අවසන් කරනලදී. ඒ සඳහා 2012 වර්ෂය තුලදී මුද්‍රණ වියදම් ඇතුළුව රු. 427,270ක මුදලක් වැයවිය. එහි මුල් කවරයේ ඡායාරූපයක් පහත දැක්වේ.




- **ප්‍රවාහන හා ගබඩාකරන ක්ෂේත්‍රය**

එයට අමතරව 2012 වර්ෂයේදී ප්‍රවාහන හා ගබඩාකරන ක්ෂේත්‍රය සඳහා නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්මක් සකස්කිරීම ආරම්භ කරනලදී. මෙම සැලැස්ම මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධ යුනි - කන්සල්ටන්සි සර්විසස් ආයතනය මගින් සකස් කිරීමට භාරගන්නා ලදී. ඒ සඳහා 2012 වර්ෂය තුලදී රු. 160,000.00 වියදමක් දරනලද අතර එය 2013 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂිතය. මෙම වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම සකස්කිරීම ප්‍රමාද වූයේ විශ්ව විද්‍යාල පද්ධතියතුල පැවති ආචාර්යවරුන්ගේ වැඩ වර්ජනය හේතු කොට ගෙන අදාල ටෙන්ඩර් යෝජනා ලබා ගැනීමට ප්‍රමාද වූ බැවිනි. එබැවින් අප විසින් පුවත්පත් දැන්වීමක් මගින් මේ සඳහා විවෘත ටෙන්ඩර් යෝජනා කැඳවන ලද අතර ඒ අනුව, මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධ යුනි - කන්සල්ටන්සි සර්විසස් ආයතනය සමග මෙම සැලසුම සකස්කිරීම ආරම්භ කරනලදී.

### 5.3.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීම




2011 වර්ෂයේදී යාවත්කාලීන කිරීම ආරම්භකරන ලද විදුලි හා ඉලෙක්ට්‍රොනික් සහ හෝටල් හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රවල වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම නිමකරනලදී. 2012 වර්ෂයේදී වෘත්තීය පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීම නව මාවතකට පිවිසි අතර, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව පහත සඳහන් ක්ෂේත්‍ර 10 සඳහා මානව සම්පත් ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගන්නා ලදී. 2012 අවසන්වනවිට ක්ෂේත්‍ර 10 සඳහා කෙටුම්පත් වාර්ථා සකස්කිරීම අවසන්වී ඇති අතර මෙයට

අදාල සියළු කාර්යයන් 2013 පළමු කාර්තුව තුල අවසන් කිරීමට අපේක්ෂිතය. එම සැලසුම් වල මුල් කවරයේ අනුරූප පහත දැක්වේ.




## 5.3 ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පැවරී ඇති කාර්යභාරය ඉටුකරමින් ශ්‍රී ලංකාවේ පළාත් මට්ටමින් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2012 වර්ෂය වනවිට සබරගමුව, නැගෙනහිර හා දකුණු පළාත් සඳහා පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කර අවසන්කර ඇත.

2012 වර්ෂයේදී, වයඹ හා උතුරු පළාත් සඳහා සැලසුම් 02 ක් සකස්කිරීම ආරම්භකරන ලදී. උතුරු පළාත් වෘත්තීය පුහුණු සැලසුම සකස්කිරීම සඳහා ජාත්‍යාන්තර කම්කරු සංවිධානය මූල්‍ය දායකත්වය ලබාගන්නා ලදී. 2012 වර්ෂය තුලදී මේ සඳහා රු. මි. 0.6612 ක් වැයකරන ලදී.

මහාභාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන මත ආරම්භකරන ලද වයඹ පළාත් වෘත්තීය පුහුණු සැලසුම සඳහා රු. මිලියන 0.8093ක් මෙම වර්ෂය තුලදී වැයකරන ලදී. මෙම පළාත්බද වෘත්තීය පුහුණු සැලසුම් 02 ක 2013 වර්ෂයේ පළමු කාර්තුව තුලදී නිමකිරීමට නියමිතය. වයඹ පළාත් සැලසුම 2012 වර්ෂයේදී නිමකිරීමට නියමිතව තිබුණද, එම පළාත් සභාව මගින් මෙම සැලසුම සකස්කිරීම ආරම්භ කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාදීම ප්‍රමාදවීම නිසා ප්‍රමාද වී ආරම්භ වූ අතර එය 2013 පළමු කාර්තුවේදී නිමකිරීමට සැලසුම් කරනලදී.

### 5.3.1 පළාත් වෘත්තීය පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම

- සබරගමුව පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ සබරගමුව පළාත් සභාව විසින් සංවිධානය කරනලද කාර්මික ශිල්පීන්ගේ තාක්‍ෂණික දක්‍ෂතා ඉහල නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කල අතර ඒ සඳහා රු. 76,000 ක මුදලක් වැයවිය.
- දකුණු පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ දකුණු පළාත් මෙහෙයුම් කමිටු රැස්වීම් 02 ක් සඳහා සහභාගීවී අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරන ලදී.

## 5.4 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්‍ෂෙත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරිම

2012 වර්ෂය සඳහා පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරනලෙස යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට විවෘත ආරාධනයක් ඉදිරිපත් කරනලදී.

ඒ අනුව, 2012 වර්ෂය සඳහා පර්යේෂණ යෝජනා 13 ක් ලැබුණි. එම යෝජනා අතරින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා ඍජු දායකත්වය ලබානොදෙන පර්යේෂණ යෝජනා ඉවත් කිරීමෙන් අනතුරුව සෙසු යෝජනා 10 සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණි. එම පර්යේෂණ 10 සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 1.0 වන අතර 2012 වර්ෂය සඳහා අනුමත මුදල වූයේ රු. මිලියන 0.8 කි. එමගින් රු. 471,051 ක මුදලක් පර්යේෂණ අධ්‍යයන සඳහා ලබාදුන් අතර රු. 70,683 ක මුදල පවත්වනලද පර්යේෂණ යෝජනා දියුණුකිරීමේ වැඩමුළු සඳහා වැයවිය. ඒ අනුව, ඉතිරි මුදල 2013 වර්ෂයේ දී ගෙවීමට අනුමැතිය ලබාගන්නා ලදී.

එම පර්යේෂණ අධ්‍යනයන් පිළිබඳ විස්තර වගු අංක 5.9 මගින් දැක්වේ.

වගුව 5.9: පර්යේෂණ අධ්‍යයන - 2011/2012

| අංකය | මාතෘකාව | පර්යේෂණ කණ්ඩායම | අනුමත මුදල (රු.) | 2012 වර්ෂය වනවිට වැයවූ මුදල (රු.) | 2013 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 2011 | | | | | |
| 1. | නව යෞවනයින්ගේ වෘත්තීය ලැදියාවන් හා වැඩලෝකය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 66,500 | 56,500 | 10,000 |
| 2. | විදේශ රැකියා අපේක්ෂකයින් තම සහතික තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සහතිකකර ගැනීම හා එමගින් විදේශ රැකියා ලැබීමේ හැකියාව සොයාබැලීමේ පර්යේෂණ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 94,750 | 63,490 | 18,000 |
| 3. | ශ්‍රී ලංකාවේ තාක්ෂණ විද්‍යාලතුල ආරම්භ කරනලද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (NVQ 5) පාඨමාලාවේ ඵලදායීතාවය නංවාලීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 78,500 | 65,500 | 10,000 |
| 4. | තාක්ෂණ විද්‍යාල තුල ස්ථාපිතකර ඇති තත්ත්ව කළමණාකරන පද්ධතියේ ඵලදායීතාවය සෙවීමේ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 120,000 | 15,000 | 105,000 |
| 5. | තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 5 & 6 මට්ටම් පාඨමාලාවල ඵලදායීතාවය පිළිබඳ | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 64,000 | 56,000 | 8,000 |

| අංකය | මාතෘකාව | පර්යේෂණ කණ්ඩායම | අනුමත මුදල (රු.) | 2012 වර්ෂය වනවිට වැයවූ මුදල (රු.) | 2013 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල මුදල (රු.) |
|---|---|---|---|---|---|
| | අධ්‍යනය | | | | |
| 6. | තාක්‍ෂණ විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා වලින් සිසුන් අඩු ප්‍රතිශතයක් සමත්වීම පිළිබඳ හේතු සෙවීමේ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 99,000 | 20,000 | 79,000 |
| 7. | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ජා. වෘ. සු. මට්ටම් 5 හා 6 හදාරා පාඨමාලාව අවසන්කල සිසුන්ගේ පසුවිපරම් අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 197,000 | 7,500 | 189,500 |
| 8. | NVQ ඇගයීම් ක්‍රමයේ සංගතභාවය පිළිබඳ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 141,750 | 120,050 | 10,000 |
| 9. | වෘත්තීය පුහුණුව තුලින් වෘත්තීය සාර්ථකත්වය ලැබූවන්ගේ ජීවන ගමන්මග පිළිබඳ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 165,000 | 65,000 | 100,000 |
| | වැඩමුළු හා අනෙකුත් වියදම් | | | 70,685 | |
| **මුළු වියදම** | | | **1,028,511** | **541,736** | **1,570,247** |

එමෙන්ම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතියලද තවත් පර්යේෂණ යෝජනා 02 ක්, එම පර්යේෂණ කණ්ඩායම්වල සාමාජිකයන්ගේ කාර්යබහුලත්වය නිසා අත්හරින ලදී.

මේ සඳහා කිසිදු මුදලක් වැය නොකරන ලද අතර ඒ පිළිබඳ විස්තර වගු අංක 5.10 මගින් දැක්වේ.

වගු අංක **5.10:** පර්යේෂණ අධ්‍යයන (අත්හරිනලද) - **2011/2012**

| අංකය | පර්යේෂණ මාතෘකාව | ඇස්තමේන්තු මුදල (රු.) | අත්හැරීමට හේතුව |
|---|---|---|---|
| 1. | විද්‍යුත් මාධ්‍ය උපයෝගීකරගෙන වෘත්තීය පුහුණු ආයතනවල තත්ත්ව විගණනය සිදුකිරීමේ හැකියාව මැනබැලීම පිළිබඳ අධ්‍යයනය | 54,000 | දැනට පවතින කළමණාකරන තොරතුරු පද්ධතියේ (MIS) හි ක්‍රියාකාරීත්වයේ පවතින අඩුපාඩු නිසා එම පර්යේෂණ යෝජනාව අත්හරින ලදී. |
| 2. | කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් වෘත්තීය පුහුණු ආයතනවලට ලබාදුන් පුහුණු උපකරණ වෘත්තීය පුහුණුව හා අනෙකුත් පද්ධතීන්හි ඵලදායීතාවය සෙවීමේ අධ්‍යයනය | 163,000 | එම කණ්ඩායමේ සාමාජිකයන්ගේ කාර්ය බහුලත්වයමත නියමිත කාලරාමුව තුලදී පර්යේෂණය නිමකිරීමට අපහසුබව දන්වන ලදී. |

## 5.6 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම අවුරුදු 05 ක කාල රාමුවක් සඳහා (2013-2017) යාවත්කාලීනකර සකස් කරන ලද අතර, මෙය “මහින්ද චින්තනය” මත පදනම් වූ දස අවුරුදු සංවර්ධන සැලැස්මෙහි අඩංගු නිපුණතා සංවර්ධන ප්‍රතිපත්ති හා අරමුණු ඉටුවන ආකාරයට හා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ දස අවුරුදු සැලැස්මෙහි සඳහන් ඉලක්ක ඉටුවන ආකාරයට සකස් කරන ලදී. සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලද අතර, එහිදී රාජ්‍ය අයවැය වෙන් කිරීම්ද, විදේශ නියෝජිතායතන මගින් ලැබෙන මූල්‍යාධාරද සැලකිල්ලට යොමුකරන ලදී. යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැසුමේ මුල් කෘතියේ අනුරූපයක් පහත දැක්වේ.



## 6.0 පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට සහ අංක 887/8 දරන 1995 සැප්තැම්බර් මස 07 වන දින රජයේ ගැසට් පත්‍රයට (අතිවිශේෂ) අනුව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු ආයතනයන්හි තත්ත්ව ආරක්ෂණය ඇති කිරීම සහ පවත්වාගෙන යාම අරමුණු කර ගෙන පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

1. පුහුණු ආයතන ලියාපදිංචි කිරීම
2. පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම
3. තත්ත්ව කළමණාකරන පද්ධති ස්ථාපනය කිරීම සඳහා මග පෙන්වීම හා විගණනය

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයෙහි නිලධාරීන් දස දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් සිටින අතර එය එක් වැඩ බලන අධ්‍යක්ෂකවරයෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියක්, සහකාර අධ්‍යක්ෂකවරු තිදෙනෙක්, සංවර්ධන නිලධාරියෙක්, කළමනාකරණ සහකාර තිදෙනෙක් හා කාර්යාල කාර්ය සහායකවරයෙකුගෙන් සමන්විත විය. ඉහත දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය මගින් 2012 වසර තුළ ඉටු කරන ලද කාර්යභාරය පහත පරිදි වෙයි.

### 6.1 වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීම.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සපයන ආයතන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම නීතිමය අවශ්‍යතාවයකි. 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් ආයතන ලියාපදිංචි කිරීම සඳහා විධි විධාන සපයා ඇති අතර 1995 සැප්තැම්බර් මස 07 වන දින අංක 887/8 දරන රජයේ ගැසට් පත්‍රයෙන් ආයතන ලියාපදිංචියට අදාළ නිර්නායක දක්වා ඇත. දිවයිනේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂත්‍රයන්හි තත්ත්වය හා අදාලත්වය තහවුරු කිරීමේ අරමුණින් මෙම විධිවිධාන සහ නිර්ණායක වලට අනුව ආයතන ලියාපදිංචිය කරනු ලබයි.

ආයතන සතු යටිතල පහසුකම්, පුහුණු උපකරණ, උපදේශකවරුන්ගේ සුදුසුකම්, පුහුණුව සැපයීම සහ ඇගයීම, විෂය නිර්දේශයන්ගේ ප්‍රමාණාත්මක බව, ශිෂ්‍ය සුභසාධනය හා පුහුණුවේ අදාළත්වය යන නිර්ණායක ආයතන ලියාපදිංචි කිරීමේදී ඇගයීමට ලක් කෙරෙයි.

2012 වසරෙහි කොමිෂන් සභාවෙහි වාර්ෂික සැලසුමට අනුව අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ආයතන 144 ක් ඇගයීමට සැලසුම් කර තිබූ අතර ඒ අතුරින් ආයතන 120 ක් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන ලදී. මෙම වසර තුලදී අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ආයතන 280

ක් ඇගයීමට ලක්කරන ලද අතර ඒ අතරින් ආයතන 187 ක් ලියාපදිංචි කරන ලදී ඒ පිළිබඳ විස්තර වගු අංක 6.1 හි දැක්වේ.

වගුව **6.1:** **පුහුණු ආයතන ඇගයීම , ලියාපදිංචිය**


| | ආයතන සංඛ්‍යාව | |
|---|---|---|
| | ලියාපදිංචිය | |
| | ඇගයීම | ලියාපදිංචිය |
| ඉලක්කය | 144 | 120 |
| **ප්‍රගතිය** | 280 | 187 |

ඉහත පරිදි 2012 වසර තුල අලුතින් ලියාපදිංචි කිරීම් ඇගයීම් 136 ක්ද, ආයතන ලියාපදිංචිය 67 ක් ද ඉලක්ක ගත ප්‍රමාණයට වඩා වැඩියෙන් සිදුකොට ඇත. ක්‍රියාකාරී සැලැස්මෙහි 2012 වසර සඳහා ඉලක්කයක් තබා ගත්තද ආයතන ලියාපදිංචිය සඳහා ලැබෙන සම්පූර්ණ කරන ලද සියලුම අයදුම්පත් ඇගයීමට ලක් කරන අතර සුදුසුකම් සපුරා ඇති ආයතන ලියාපදිංචි කරනු ලැබේ. පුවත්පත් දැන්වීම්, අත්පත්‍රිකා හා ප්‍රවර්ධන වැඩසටහන් මගින් අදාල පාර්ශවයන් දැනුවත් කිරීම සහ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය සමාජගත වීම අයදුම්පත්‍ර වැඩි ප්‍රමාණයක් ලැබීමට හේතු විය හැක.

ආයතන ලියාපදිංචිය සඳහා සුදුසුකම් සපුරා නොමැති නිසා ආයතන 93ක් ලියාපදිංචි කිරීමට නොහැකි වූ අතර ඒවායේ සුදුසුකම් සපුරා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙන ලදී. 2012 වසර තුලදී කොමිෂන් සභාවේ අළුතින් ලියාපදිංචි කරනු ලැබූ ආයතන පිළිබඳ හිමිකාරත්වය අනුව විශ්ලේෂණය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතන | 19 |
| 2. | ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා යටතට අයත් පුහුණු ආයතන | 69 |
| 3. | රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක පුහුණු ආයතන | 32 |
| 4. | පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතන | 67 |
| **එකතුව** | | **187** |

**ප්‍රස්තාරය 6.1 - හිමිකාරත්වය අනුව ආයතන ලියාපදිංචිය**




## 6.2 පුහුණු මධ්‍යස්ථාන වල ලියාපදිංචිය අළුත් කිරීම

1995 සැප්තැම්බර් මස 07 වන දින පළ කෙරුණු අංක 887/8, දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) සඳහන් නිර්ණායක වලට අනුකූලව පුහුණු ආයතන ඇගයීම් කර, පුහුණු ආයතන වෙත අවුරුදු 02 ක හෝ 03 ක කාලයට සීමාවූ තාවකාලික ලියාපදිංචියක් ලබා දෙනු ලැබේ. මෙම කාලය අවසන් වීමෙන් පසු පුහුණු ආයතන විසින් තම ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අයදුම් කළ යුතුයි.

2012 වසර තුලදී ආයතන 250 ක් ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබූ අතර ලියාපදිංචිය අළුත් කිරීම සඳහා ආයතන 282 ක් ඇගයීම් කරන ලදී. ( 2011 වසරේ ලියාපදිංචිය අළුත් කිරීමට තිබූ ආයතන වලින් ලැබූ අයදුම්පත්‍ර ද සමඟ) ඒ අතරින් ආයතන 250 ක ලියාපදිංචිය අළුත් කරන ලද අතර ආයතන 31 ක ලියාපදිංචිය අලුත් කිරීම පහත සඳහන් හේතූන් මත කළ නොහැකි විය.

- ආයතනය ලියාපදිංචි කිරීම සඳහා ඇගයීම කරන අවස්ථාවේ පාඨමාලා නොපැවැත්වීම
- පාඨමාලා කාලය ප්‍රමාණවත් නොවීම
- පාඨමාලා වලට අදාළ විෂය මාලාවන් සහ නව අධ්‍යයන කාර්යය මණ්ඩලයන්හි ජීව දත්ත තොරතුරු සහ සහතික වල ඡායා පිටපත් භාර නොදීම
- දී ඇති විෂය මාලා වලට අනුව පාඨමාලා නොපැවැත්වීම

- ලියාපදිංචි කර ඇති සහ අළුතින් ලියාපදිංචිය සඳහා ඉල්ලා ඇති පාඨමාලා පවත්වන බවට තොරතුරු නොතිබීම
- පාඨමාලාවට අදාළව වැඩහල් පහසුකම් සහ උපකරණ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම
- වැඩහල් වල ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම

ලියාපදිංචිය **අළුත් කිරීම** පිළිබඳ විස්තර පහත වගුවෙදි දක්වා ඇත.

**වගුව 6.2: පුහුණු ආයතන ඇගයීම , ලියාපදිංචිය අළුත් කිරීම.**

| | ආයතන සංඛ්‍යාව | |
|---|---|---|
| | ලියාපදිංචිය අළුත් කිරීම | |
| | ඇගයීම | ලියාපදිංචිය |
| ඉලක්කය | 250 | 250 |
| ප්‍රගතිය | 281 | 250 |

## 6.3 2012 වසරේදී වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්

පුහුණු ආයතන පිළබඳව ව්‍යාජ ප්‍රචාර මගින් සිසුන් නොමග යැවීමේ විවිධ ව්‍යාපාර පවත්වාගෙන යනු ලැබේ. එම ප්‍රචාර වලට සිසුන් රැවටීම වැළැක්වීමටත්, පුහුණුවේ ගුණාත්මකභාවය වැඩි කිරීමටත් පුහුණු ආයතන ලියාපදිංචිය හා ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳව මහජනතාව හා පුහුණුව සපයන්නන් දැනුවත් කිරීම පිණිස පහත සඳහන් වැඩසටහන් 2012 වසර තුළ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.

1. පුවත් පත් දැන්වීම් මගින් දැනුවත් කිරීම

- 2012 සැප්තැම්බර් මස 02 වෙනි දින සිළුමිණ, ඉරිදා ලංකාදීප, වීරකේසරි, Sunday Observer පුවත්පත් වල ද,
- 2012 දෙසැම්බර් මස 23 වෙනි දින සිළුමිණ, ඉරිදා ලංකාදීප, වීරකේසරි, Sunday Observer පුවත්පත් වල ද, පළ කරන ලදී.

2. අත්පත්‍රිකා මඟින් දැනුවත් කිරීම.

ආයතන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම පිළිබඳව සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදාහරින ලදී.

2012 වසරේ ඔක්තෝබර් මාසය තෙක් කොමිෂන් සභාවේ ලියාපදිංචිය ලැබූ හා ලියාපදිංචිය අළුත් කරන ලද පුහුණු ආයතන වල ලැයිස්තුවක් 2013 පබරවාරි මස 20 වන දින නිකුත් කරන ලද රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර, TVEC වෙබ් අඩවිය (www.tvec.gov.lk) මගින් ලියාපදිංචි කරන ලද ආයතන පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කර ඇත.

## 6.3 පාඨමාලා ප්‍රතීතනය

ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව 2004 වසරේ දී හඳුන්වා දෙන ලදි.ලියාපදිංචි පුහුණු ආයතන වල පවත්වන පාඨමාලා NVQ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා සකස් කිරීම ප්‍රතීතනය තුළින් අරමුණු කරයි.මෙහිදී ජාතික නිපුණතා සම්මතයන්හී හඳුනාගන්නා කර්මාන්තයට අවශ්‍ය නිපුණතාවය පුහුණු වන්නන්ට ලබා දෙන පරිදී පුහුණු නිර්ණායකයන් සකස් කරනු ලබයි.ලියාපදිංචි පුහුණු ආයතන තුල පවත්නා පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා සකස් කිරීම ප්‍රතීතනය තුලින් අරමුණු කරයි. මෙහිදී ජාතික නිපුණතා සම්මතයන්හි හඳුනා ගත් කර්මාන්තයට අවශය නිපුණතා පුහුණු වන සිසුන්ට ලබා දෙන පරිදි පාඨමාලා ප්‍රතීතන නිර්ණායකයන් සකස් කරනු ඇත.

එම නිර්ණායක සපුරන්නේ නම් පාඨමාලා ප්‍රතීතනය කර ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය පිරිනැමීම සඳහා අනුමැතිය දෙනු ලැබේ.

ඒ අනුව පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ 2012 වසරේ ඉලක්කයන් හා ප්‍රගතිය පහත වගුවෙන් දක්වා ඇත.

**වගුව 6.3: පාඨමාලා ඇගයීම් හා ප්‍රතීතනය කිරීමේ ඉලක්ක හා ප්‍රගතිය - 2012**

| පුහුණු ආයතන | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | ඇගයීම් කිරීම | ප්‍රතීතනය | ඇගයීම් කිරීම | ප්‍රතීතනය |
| රාජ්‍ය අංශය | 400 | 340 | 409 | 214 |
| පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 50 | 36 | 89 | 57 |
| | 450 | 376 | 498 | 271 |

ඒ අනුව ජාතික නිපුණතා සම්මතයන්ට අනුකූලව පවත්වාගෙන යනු ලබන රාජ්‍ය අංශයට අයත් පුහුණු පාඨමාලා 214 ක් 2012 වසර තුලදී පමණක් ප්‍රතීතනය කර ඇති අතර මෙම වසර අවසාන වන විට කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කර ඇති රාජ්‍ය අංශයට අයත් මුළු පුහුණු පාඨමාලා සංඛ්‍යාව 857 ක් වේ.

2012 වසරේ දී පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ ක්‍රියාත්මක පුහුණු පාඨමාලා 89 ක් ප්‍රතීතනය සඳහා ඇගයීම් කර ඇත. මෙයින් පාඨමාලා 57 ක් ප්‍රතීතනය කරන ලදී. ඒ අනුව 2012 වසර අවසාන වන විට පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ ප්‍රතීතනය කරන ලද මුළු පාඨමාලා සංඛ්‍යාව 359 කි.

2012 වසර අවසාන වන විට ප්‍රතීතනය කර ඇති මුළු පාඨමාලා සංඛ්‍යාව 1225 කි.

වගුව 6.2 අනුව රාජ්‍ය අංශයේ ප්‍රතීතන ඇගයීම් කිරීම අපේක්ෂිත ඉලක්කයට වඩා 9 කින් සහ පුද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ අපේක්ෂිත ඉලක්කයට වඩා 39 කින් වැඩි වී

ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් බඳවා ගැනීමේ පටිපාටියට ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය හඳුන්වා දීමත්, නව නිපුණතා සම්මත හඳුන්වා දීමත්, ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ජනප්‍රිය වීමත් නිසා පාඨමාලා ප්‍රතීතන ඉල්ලුම්පත්‍ර ලැබීම හේතුවෙන් අදාල ඉලක්කයට වඩා පාඨමාලා 48 ක් ඇගයීම් කර ඇත.

ඇගයීම් කල සංඛ්‍යාව වැඩි වුවද රාජ්‍ය අංශයේ පාඨමාලා ප්‍රතීතනයවූ සංඛ්‍යාව අපේක්ෂිත ඉලක්කයට වඩා 120 කින් අඩු වී ඇත. පුහුණු උපකරණ වල අඩු පාඩු, උපදේශක පුරප්පාඩු , සම්මතයන්ට අනුව පුහුණුව පවත්වාගෙන නොයාම යන කරුණු පාඨමාලා ප්‍රතීතනය කිරීමට නොහැකි විය. පෞද්ගලික අංශය අපේක්ෂිත ඉලක්කයට වඩා පාඨමාලා 21 කින්ද වැඩි වී ඇත. 2012 වසර තුලදී ඇගයීම් කළ මුළු පාඨමාලා සංඛ්‍යාව 498 ක් වන අතර ඉන් 271 ක් ප්‍රතීතනය කර ඇත.

**2012 වසර අවසන් වන විට ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් පහත දැක්වේ.**

වගුව **6.3:** ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා

| පුහුණුව සපයන ආයතන | ලද අයදුම්පත් සංඛ්‍යාව (2012 වසර තුල) | ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව (2012)* | 2012 වසර තුලදී ප්‍රතීතනය කරන ලද පාඨමාලා | ප්‍රතීතනය කරනු ලැබූ මුළු පාඨමාලා සංඛ්‍යාව (2012 වසර අවසානයේ දී) |
|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 31 | 27 | 18 | 66 |
| ජාතික තරුණ සේවා සභාව | 45 | 66 | 31 | 64 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 21 | 45 | 26 | 192 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 138 | 244 | 130 | 535 |
| වෙනත් රාජ්‍ය ආයතන | 53 | 27 | 9 | 09 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 89 | 89 | 57 | 359 |
| **එකතුව** | **377** | **498** | **271** | **1225** |

* පෙර වසරේ දී ලද අයදුම්පත් ද ඇගයීමට ලක්කර ඇත.

* දෙසැම්බර් මස භාරදුන් අයදුම්පත් ඇගයීමට ලක්කර නැත.

## 6.5 ප්‍රතීතනය අළුත් කිරිම

ප්‍රතීතනය කරන ලද පාඨමාලාවක වලංගු කාලය වසර 03 ක් වන අතර එම වසර 03 අවසානයේ ප්‍රතීතනය අළුත් කල යුතුය. ඒ අනුව 2012 වසර තුල රාජ්‍ය අංශයේ පාඨමාලා 85 ක් සහ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 54 ක් ප්‍රතීතනය අළුත් කල යුතුව ඇත. මෙම වසර තුලදී රාජ්‍ය අංශයේ පාඨමාලා 79 ක් ඇගයීම් කරන ලද අතර ඉන් පාඨමාලා 68 ක් ප්‍රතීතනය අළුත් කරන ලදි. මෙම රාජ්‍ය අංශයේ ඇගයීම් සඳහා පසුගිය වසරේ අයදුම්පත් ලැබු පාඨමාලාද ඇතුළත් වේ. එමෙන්ම පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 41 ක් ඇගයීම් කරන ලද අතර ඉන් පාඨමාලා 35 ක් ප්‍රතීතනය අළුත් කරන ලදි.

රාජ්‍ය අංශයේ පාඨමාලා 11 ක් සහ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 06 ක් ප්‍රතීතනය අළුත් කිරීමට නොහැකි වූයේ පහත සදහන් හේතු නිසාය.

- අදාළ සැලසුම් වලට අනුව පාඨමාලා නොපැවැත්වීම.
- අදාළ ජාතික නිපුණතා සම්මතයට සහ විෂය මාලාවට අදාළව අන්තර්ගතය නොතිබීම.
- අඛණ්ඩ ඇගයීම නොපැවැත්වීම සහ වාර්තා තබා නොගැනීම.
- ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත සහ අනෙකුත් අදාළ වාර්තා තබා නොගැනීම.
- පාඨමාලා ප්‍රතීතනයේදී ( මීට අවුරුදු 3 කට පෙර ) තිබු යන්ත්‍ර සූත්‍ර , උපකරණ, ආවුද සහ පහසුකම් නොතිබීම.

**2012 වසර අවසන් වන විට ප්‍රතීතනය අලුත් කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් වගු අංක 6.4 හි දැක්වේ.**

**වගුව 6.4- ප්‍රතීතනය අලුත් කරන ලද පුහුණු පාඨමාලා**

| පුහුණුව සපයන ආයතන | ලද අයදුම්පත් සංඛ්‍යාව (20122වසර තුල) | ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව (2012)* | 2012 වසර තුලදී ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා |
|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 02 | 05 | 04 |
| ජාතික තරුණ සේවා සභාව | - | 09 | 06 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 19 | 25 | 20 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 26 | 40 | 38 |

| | | | |
|---|---|---|---|
| වෙනත් රාජ්‍ය ආයතන | 04 | - | - |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 28 | 41 | 35 |
| **එකතුව** | **79** | **120** | **103** |

*පෙර වසරේ දී ලද අයදුම්පත් ද ඇගයීමට ලක්කර ඇත.

*දෙසැම්බර් මස භාරදුන් අයදුම්පත් ඇගයීමට ලක්කර නැත.

### 6.6 පාඨමාලා ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන්

විවිධ දිස්ත්‍රික්කයන්හි ලියාපදිංචිය ලත් පුහුණුව සපයන ආයතන වල උපදේශකවරුන්ට පාඨමාලා ප්‍රතීතනය සඳහා පුහුණු සැලසුම් හා ඇගයීම් ක්‍රම වේදයන් සකස් කිරීම පිළිබඳව වැඩමුළු 6 ක් පවත්වා උපදේශකවරු 126 ක් පුහුණු කරන ලදී.

### 6.7 ISO 9001: 2008 තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

ආයතන ලියාපදිංචිය සහ පාඨමාලා ප්‍රතීතනය මගින් පුහුණුවේ ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. නමුත් පුහුණුවේ ගුණාත්මකභාවය තවදුරටත් පවත්වා ගැනීම සඳහා පුහුණු ආයතන වල තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කටයුතු කරනු ලබයි. ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් අත්පොතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 පවත්වන පුහුණු ආයතන තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම අනිවාර්යය වේ.

කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් ISO 9001: 2008 සහ IWA 2007 සම්මතයන් පදනම් කරගෙන තත්ත්ව කළමණාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදි.

පුහුණු ආයතනයෙහි තත්ත්ව කළමණාකරන පද්ධතිය ස්ථාපිත කිරීම, අධීක්ෂණය කිරීම උදෙසා කාර්යක්ෂම ක්‍රියාපිළිවලක් සැකසීම ද මෙම අංශයෙහි වගකීමකි.
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතනයන්හි තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල පහත සඳහන් වැඩසටහන් සහ ක්‍රියාවලීන් 2012 වසර තුලදී මෙම අංශය මගින් ක්‍රියාත්මක කරන ලදී.

- 2012 වසරේ දී තත්ත්ව සංග්‍රහයන් 06 ක් (Quality Manual) කොමිෂන් සභාව වෙත භාර දෙන ලදි. එම තත්ත්ව සංග්‍රහයන් පරික්ෂා කිරීමෙන් අනතුරුව එම ආයතන වෙත නැවත භාර දුන් අතර ඒවා නිවැරදි කර තත්ත්ව කළමණාකරණ අයදුම්පත සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

  වර්ෂය අවසාන වන විට තත්ත්ව කළමණාකරණ අයදුම්පත් 04 ක් ලැබී ඇත. පුද්ගලික සහ රාජ්‍ය නොවන අංශයේ ආයතන 05 ක තත්ත්ව විගනනයන් පවත්වන ලදි.

- පුද්ගලික සහ රාජ්‍ය නොවන අංශයේ ආයතන 04 කට තත්ත්ව කළමණාකරණ සහතිකය ප්‍රදානය කරන ලදි.

- දැනටමත් තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් පවතින කාර්මික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ආයතන සඳහා තත්ත්ව කළමණාකරණය සහ අභ්‍යන්තර විගනනය පිළිබඳ පුහුණු වැඩසටහන් 2 ක් පැවැත්වූ අතර ඒ සඳහා නිලධාරින් 35 දෙනෙකු සහභාගි විය.

## 6.8 පුහුණු ආයතන වල ලියාපදිංචිය සනාථ කිරීම.

වෘත්තීය පුහුණු ආයතන වලින් නිකුත් කරන ලද සහතික විදේශ රැකියා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේදී ඒවායේ පිළිගැනීම තහවුරු කල යුතුය. විදේශ කටයුතු අමාත්‍යාංශය, තානාපති කාර්යාල හා සුදුසුකම් ඇගයීමේ මණ්ඩල (Qualification Verification Councils and Authorities ) විසින් එම සහතික කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2012 වසර තුළදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවශ්‍යතාව මත විදේශ රැකියා ගත වන්නන්ගේ සහතික තහවුරු කිරීමේ ලිපි 275 ක් නිකුත් කරන ලදී.

එමෙන්ම, 2012 වසර තුළදී රාජ්‍ය ආයතන වල බඳවාගැනීම්, උසස් කිරීම් සඳහා සහතික තහවුරු කිරීමේ ලිපි 262 ක් නිකුත් කරන ලදී.

## 6.9 2012 වසර තුලදී පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය මගින් උපයාගනු ලැබූ ආදායම

| | |
|---|---|
| ශිෂ්‍ය ප්‍රගති වාර්ථා අලෙවියෙන් උපයාගත් ආදායම | - රු. 3, 279, 500. |
| ආයතන ලියාපදිංචි ගාස්තු | - රු. 584, 950. |
| පාඨමාලා ප්‍රතීතන ගාස්තු | - රු. 1, 114, 550. |
| **මුලු ආදායම** | **- රු. 4, 979, 000.** |

## 7.0 ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම ජාතික වෘත්තීය සුදුසුකම් අංශය වෙත පැවරී ඇති අතර, 2012 වර්ෂය තුළ මේ සඳහා ක්‍රියාකාරකම් මාලාවක් මෙම අංශය ක්‍රියාවට නංවන ලදි.

1. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා වූ 'සමාජමය අලෙවිකරණය' (Social Marketing ) හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්
2. ජාතික නිපුණතා සම්මත සහ ආශ්‍රිත ලේඛන සංවර්ධනය හා යාවත්කාලීන කිරීම්
3. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ඍජු හා වක්‍ර ක්‍රියාකාරකම්
4. කොමිෂන් සභාව තුල තත්ත්ව කළමණාකරන පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා වූ සහතිකරණය යාවත්කාලීන කිරීම
5. 2012 ක්‍රියාකාරී සැලැස්මට පරිබාහිරව පැවැත්වූ වෙනත් ක්‍රියාකාරකම්

ඒ අනුව 2012 වර්ෂය තුල ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති

### 7.1 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා වූ 'සමාජමය අලෙවිකරණය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්,

i වර්ෂ 2012 ක්‍රියාකාරී සැලැස්මට අනුව මීජේ ජාතික අධ්‍යාපන ආයතනයේ පවත්වනු ලබන අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළු වෙනත් පාඨමාලා හදාරන විදුහල්පතිවරුන් සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරින් සඳහා NVQ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් පැවැත්වීමට යෝජිතව තිබූ අතර එම වැඩසටහන් 3ම ක්‍රියාත්මක විය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් තුන සඳහා විදුහල්පතිවරුන් 242 දෙනෙකු සහභාගී වී ඇත.

ii වර්ෂ 2012 ක්‍රියාකාරී සැලැස්මට අනුව කර්මාන්තකරුවන් සඳහා NVQ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් යෝජිත විය. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සාමාජික සාමාජිකාවන් සඳහා සැසි දෙකකින් යුතු වැඩසටහන් මාලාවක්ද, වරාය අධිකාරියේ සේවක සේවිකාවන් සඳහා සැසි තුනකින් යුතු වැඩසටහන් මාලාවක්ද, 'මාගා' ආයතනයේ ඉංජිනේරුවන් වෙනුවෙන් වැඩසටහනක්ද පැවැත්වීමට යෙදිනි. මෙහිදී ආයතන තුනකට පමණක් වැඩසටහන් සීමාවූයේ වරාය අධිකාරියේ සහ ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සැසි කිහිපයකින් යුතු වැඩසටහන් මාලා ශ්‍රේණියක් පැවැත්වීම නිසාවෙනි.

iii NVQ ක්‍රමවේදය කොළඹින් දුර බැහැර ප්‍රදේශයන්හි ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා NVQ ප්‍රවර්ධන නිළධාරින් (Deligates) උපයෝගී කරගනිමින් 2012 වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පැවැත්වුනු අතර එම වැඩසටහන් 10 සඳහා 1137 දෙනකු සහභාගි වී ඇත.

මෙම වැඩසටහන පහත ප්‍රදේශයන්හිදී පවත්වා ඇත

- විදාතා මධ්‍යස්ථානය,කොටපොල - වැඩසටහන් 01
- ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, බුත්තල - වැඩසටහන් 01
- විදාතා මධ්‍යස්ථානය, මාලිම්බඩ - වැඩසටහන් 02
- තරුණ සංගම් ශාලාව, බියගම - වැඩසටහන් 01
- බිෂෝප් විද්‍යාලය, කොළඹ - වැඩසටහන් 01
- බන්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව - වැඩසටහන් 01
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කළුබෝවිල - වැඩසටහන් 01
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වැල්ලවත්ත - වැඩසටහන් 01
- පැල්වත්ත සීනි කර්මාන්ත ශාලාව, බුත්තල - වැඩසටහන් 01

iv 2012වර්ෂය තුළදී දැයට කිරුල ප්‍රදර්ශන කටයුතු වලට සමගාමීව අත්පත්‍රිකා 10,000 මුද්‍රණයකර බෙදාහැරිනි. මෙම ප්‍රමාණය ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් විය.

ඒ අනුව මුද්‍රණය කරන ලද අත්පත්‍රිකා ප්‍රමාණයන් වන්නේ,

RPL අත් පත්‍රිකා 2000 (සිංහල)
RPL අත් පත්‍රිකා 1000 (දෙමළ)
NVQ අත් පත්‍රිකා 5000 (සිංහල)
NVQ අත්පොත් සිංහල - (නව සංස්කරණය) - 1000
NVQ අත්පොත් දෙමළ - (නව සංස්කරණය) - 1000

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රදර්ශන දෙකකට සහභාගි වීඇත

- දැයට කිරුල ප්‍රදර්ශනය - අනුරාධපුර ඔයාමඩුව
- පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ප්‍රදර්ශනය

## 7.2 නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීම

i. 2012 වසරේදී නව නිපුණතා සම්මත 13 සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී

- කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සහායක
- කිරි දෙවීමේ උපකරණ ක්‍රියාකරු

- සහකාර කර්මාන්ත ශාලා නිළධාරි(තේ)
- සහකාර කර්මාන්ත ශාලා නිළධාරි (රබර්)
- ස්වභාවික විසිතුරු මල් සකසන්නා
- කායි වර්ධන පුහුණුකරු
- උපැස් කාර්මික
- ඇතුලත අලංකරණය කරන්නා
- සත්ව ආහාර නිෂ්පාදන යන්ත්‍රක්‍රියාකරු
- සත්ව ආහාර නිෂ්පාදන සහකාර
- කිරි ආහාර ආශ්‍රිත ගොවිපල සහකාර
- නැව් බඩු ඔසවන යන්ත්‍ර ක්‍රියාකරු
- සහකාර ක්ෂේත්‍ර නිලධාරි (තේ)

ii. පහත දැවෙන නිපුණතා සම්මත සංශෝධනය කිරීමෙන් අනතුරුව යාවත්කාලීන කරන ලදී

- විදුලි කාර්මික ශිල්පී - නාවුක විදුලි කේෂ්ත්‍රය ආශ්‍රිත නිපුණතා ඇතුලත් කරනලදී
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී

iii. ඇගයීම් සම්පත් සංවර්ධනය කිරීම

2011/2012 වර්ෂයේ නිමකරන ලද ජාතික නිපුණතා සම්මත සඳහා ඇගයීම් සම්පත් සංවර්ධනය කිරිම සඳහා ප්‍රතිපාදන මෙම කොමිෂන් සභාව විසින් ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට ලබා දි ඇත. කොමිෂන් සභා ප්‍රතිපාදන උපයෝගි කරගනිමින් පහත සඳහන් ඇගයීම් සම්පත්18ක් සංවර්ධනය කර ඇත

මෙම වසරේදී වෘත්තින් 18ක් සඳහා ඇගයීමේ සම්පත් සංවර්ධනය සිදුකෙරිණි.

- ධීවර යාත්‍රා ක්‍රියාකරු(Skipper)
- බෝට්ටු නිෂ්පාදන කාර්මික ශිල්පී
- ධීවර යාත්‍රා කාර්මික
- නැව් බඩු ඔසවන යන්ත්‍ර ක්‍රියාකරු
- මල්වගා හා ගෙවතු අලංකරණ තාක්ෂණය
- ප්‍රමාණ සමීක්ෂණ
- ධීවර කාර්මික
- කිරි ආහාර ආශ්‍රිත ගොවිපල සහකාර
- කාය වර්ධන පුහුණුකරු
- මෝටර් රථ පින්තාරු ශිල්පී
- රූපලාවන්‍ය ශිල්පී
- කොන්ඩ මෝස්තර නිරූපන ශිල්පී
- සහකාර කේෂ්ත්‍ර නිලධාරී (තේ)
- සහකාර කර්මාන්තශාලා නිලධාරී (තේ)
- සහකාර කර්මාන්තශාලා නිලධාරී (රබර්)
- විදුලි කාර්මික ශිල්පී
- කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සහයක
- කිරි දෙවීමේ උපකරන ක්‍රියාකරු

iv. 2012 **වර්ෂයේ විෂය මාලා 17**ක් ද සංශෝධනය කරන ලදි

- ඇලුමිනියම් සැකසුම් ශිල්පී
- මෝටර් රථ පින්තාරු ශිල්පී
- මෝටර් රථ වැද්දුම් ශිල්පී
- මෝටර් රථ වායු සමීකරණ සැකසුම් ශිල්පී
- බේකරි ශිල්පී
- රූපලාවණ්‍ය ශිල්පී
- පරිගනක ජාල කාර්මික ශිල්පී
- පරිගනක යෙදුම් සහායක
- පරිගනක චිත්‍රක සැලසුම් ශිල්පී
- විදුලි කාර්මික ශිල්පී
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී
- ලිතෝ යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී
- යන්ත්‍ර ශිල්පී
- ලෝහ පිරිසැකසුම් ශිල්පී
- ගුවන් විදුලි රූපවාහිනි සහ ආශිත උපකරණ අලුත්වැඩියා කරන්නා
- තේ කර්මාන්ත ශාලායාන්ත්‍රික ශිල්පී
- වැඩ ලොව සඳහා මූලික නිපුණතාව

(v.) 2012 වර්ෂයේ නිමකරන ලද NVQ මට්ටම් 5 සහ 6 සඳහා වූ ජාතික නිපුණතා සම්මතයක් කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය සඳහා නිමවා ඇත

(vi.) ජාතික නිපුණතා සම්මත සහ අදාල ලේඛණයන්හි මෘදු පිටපත් සැකසීම
සියළුම ජාතික නිපුණතා සම්මත සහ ඒවායේ ලේඛණ ඇතුලත් මෘදු පිටපත් සහිත CD තැටි අලෙවිකිරීමෙන් රු.535,250/- ක මුදලක් කොමිෂන් සභාව උපයා ගන්නා ලදි.

(vii.) පහත සඳහන් නිපුණතා සම්මත 05 ක් හා විෂයමාලා සංෂිප්ත 02ක්දෙමල භාෂාවට පරිවර්තනය කරන ලදී

**නිපුණතා සම්මත**

1.පැලතවාන් සංවර්ධන සහකාර

2. බේකරි ශිල්පී

3.වඩුකාර්මික ශිල්පී

4.හෙද සහකාර

5. ක්ෂේත්‍ර සහකාර කෘෂිකර්ම

**විෂයමාලා සංෂිප්ත**

1. විදුලි කාර්මික ශිල්පී

2. ගුවන් විදුලි රූපවාහිනී ආශ්‍රිත
 උපකරණ අළුත්වැඩියා කරන්නා

**7.3 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වෙනත් සෘජු හා වක්‍ර ව්‍යාපෘති**

(i) 2012වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව නව ජාතික නිපුණතා සම්මත හඳුන්වාදීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වු වැඩ මුළු දෙකක් පැවැත්වීමට යෝජිත වූ අතර වැඩසටහන් 2ක පවත්වන ලදී.

මෙම වැඩ සටහන් දෙක සඳහා සහභාගිත්වය 70 දෙනකි. මෙම වැඩමුළු සඳහා යොදාගත් වෘත්තීන් නම් ,

පලමු වැඩමුළුව

උපැස් කාර්මික නිපුණතා සම්මතය සඳහාද

දෙවන වැඩමුළුව

සහකාර කර්මාන්තශාලා නිලධාරී (තේ)

සහකාර කර්මාන්තශාලා නිලධාරී (රබර්)

කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන සහායක සහ කිරි දෙවීමේ උපකරණ ක්‍රියාකරු

(ii) 2012 වර්ෂය සඳහා චක්‍ර ලේඛණ හතක් කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කරන ලදි.

- චක්‍ර ලේඛණ අංක 1/2012 - ඉංජිනේරු තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) NDET, NVQ මට්ටම 5 සමග සමගාමී කිරීම
- චක්‍ර ලේඛණ අංක 2/2012 - වෘත්තිය හා කාර්මික පුහුණුව සඳහා ගුරු ශිෂ්‍ය අනුපාතය
- චක්‍ර ලේඛණ අංක 3/2012 - ඉංජිනේරු විද්‍යා පිළිබඳ ජාතික ඩිප්ලෝමා (සිවිල් ඉංජිනේරු) පාඨමාලාව NDES, NVQ 6 වන මට්ටම හා සම කිරීම

- චක්‍ර ලේඛණ අංක 4/2012 – NVQ 5/6 මට්ටමේ පාඨමාලා ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපදෙස් මාලාව
- චක්‍ර ලේඛණ අංක 5/2012 – ඉංජිනේරු විද්‍යා පිළිබඳ ජාතික ඩිප්ලෝමා (යාන්ත්‍රික ඉංජිනේරු) පාඨමාලාව NDES, NVQ 6 වන මට්ටම හා සම කිරීම
- චක්‍ර ලේඛණ අංක 6/2012 – ජාතික තාක්ෂණ සහතික NCT (යාන්ත්‍රික ඉංජිනේරු) සඳහා NVQ 5 වන මට්ටම හා සම කිරීම
- චක්‍ර ලේඛණ අංක 7/2012 – ජාතික කර්මාන්ත කාර්මික ශිල්පි (සිවිල්) පාඨමාලාව (NCIT) සඳහා NVQ ඉදිකිරීම් තාක්ෂණ 5 වන මට්ටම හා සම කිරීම

(iii) NVQ නොවන පාඨමාලාවන් හදාරනලද අයදුම්කරුවන් හට NVQ මට්ටම නිර්ණය කිරීමේ ක්‍රියාවලිය තුලින් සහතික ලබාදීම. මෙම සහතික ලබාදීමේ ක්‍රියාවලිය සීමා සහිත කාල සීමාවක් සඳහා වලංගු වන්නකි.

NVQ නොවන පාඨමාලා සඳහා NVQ මට්ටම ලබාදීමට පැවැත්වූ පරීක්ෂණයෙන් සමත් වූවන් 11 දෙනෙකු සඳහා NVQ සමකිරීම් සහතික පත්‍ර පහත සඳහන් අයුරින් ලබාදෙන ලදී.

| පාඨමාලාව | | සහතික පත්‍ර |
|---|---|---|
| NCT (සිවිල්) | - | 05 |
| NDES (සිවිල්) | - | 03 |
| NDET (සිවිල්) | - | 03 |
| | = | 11 |

## 7.4 තත්ත්ව කළමණාකරන පද්ධතිය ස්ථාපනය කරමින් තත්ත්ව සහතිකය දිර්ඝ කර ගැනීමේ ක්‍රියාවලිය

කොමිෂන් සභාව 2012 වර්ෂයේ IS0 9001 : 2008 තත්ත්ව කළමණාකරන පද්ධතිය සඳහා ලබාගත් සහතිකය තවත් වර්ෂ තුනකට දීර්ඝ කර ගැනීමට සමත්වී ඇත .

## 7.5 2012 ක්‍රියාකාරී සැලැස්මට පරිභාහිරව NVQ අංශය ක්‍රියාවට නැංවූ වෙනත් වැඩසටහන්

- ජාතික නිපුණතා සම්මත හා ආශ්‍රිත ලේඛන සහිත CD අලෙවිය සඳහා සරල මෘදුකාංගයක් සංවර්ධනය කර පුස්තකාලය වෙත ලබාදී ඇත මෙය CD තැටි ප්‍රමාණයන්හි තත්ත්ව නිර්ණය කිරීමටත් ඒ අනුව NVQ අංශයට අවශ්‍ය CD ප්‍රමාණය දැන්වීමටත් උපයෝගීකර ගනී

- දන්ත ශලා උපස්ථායක සහ ඝන අපද්‍රව්‍ය කළමණාකරන යන වෘත්තීන් සඳහා සංවර්ධනය වන ජාතික නිපුණතා සම්මත සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පෞද්ගලික ආයතන දෙකකින් ලබා ගැනීම (පිළිවෙලින් දන්ත වෛද්‍ය සංගමය සහ ILO ආයතනය)
- ″අපද්‍රව්‍ය කළමණාකරණය හා ප්‍රතිචක්‍රීයකරණය සඳහාවූ වෘත්තීය හැඩගැසීම" (WARM – Work Adjustment for Recycling and Managing Waste) අත් පොත වෘත්තීය පුහුණුව සඳහා නිදේශිත ලේඛනයක් බවට පත්කිරීම

- රූපලාවන්‍ය සහ කොන්ඩා සැකසුම් ක්ෂේත්‍රයන් සඳහා වාර්ෂිකව පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයට ප්‍රශ්න පත්‍රය සකස් කිරීම
- වරලත් ගණකාධිකරණය, CIMA සහ AAT පාඨමාලාවන් සඳහා NVQ සුදුසුකම් පිලිගැනීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම
- NVQ රාමුව තුලින් ″Green Jobs″ සඳහා සලසා ඇති පහසුකම් පිළිබඳ ඉදිරිපත් කිරීමක් Skype තාක්ෂණයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තායිලන්ත ILO ශාඛාවට ඉදිරිපත් කිරීම

## 7.6 ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම්

ජාතික වෘත්තීය සුදුසුකම් අංශයේ ඇගයීම් ඒකකයෙහි වගකීම් පහත සඳහන් වේ.

i. ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය සඳහා සිදුකෙරෙන ඇගයීම් නියාමනය කිරීම
ii. නිපුණතා පාදක ඇගයීම්කරුවන්ගේ සංචිතය පවත්වාගෙන යාම

මූලික වශයෙන් මෙම කාරණා සපුරාගැනීම සඳහා මෙම ඒකකය ප්‍රයත්න දරණ ලද අතර ගතවූ 2012 වසරෙහි කරන ලද කටයුතු පහත සඳහන් පරිදි වේ.

- **අන්තර් ආයතනික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම**

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙහිලා පැන නගින ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳ ගැටළු මෙන්ම එම ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙහිලා එදිනෙදා පැන නගින ගැටළු විසඳා ගැනීමේ මාර්ගයක් ලෙස පැවැත්වෙන අන්තර් ආයතනික මෙහෙයුම් කමිටු රැස්වීම් 6ක් 2012 වසරේදී පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර, ඒ අතරින් රැස්වීම් 5ක් ඉකුත් වසරේදී පවත්වා ඇත. මෙම කමිටුවෙහි සාමාජිකයින් හා එහි වපසරිය පිළිබඳව ඇතිවූ ප්‍රතිපත්තිමය සංශෝධනයක් කිරීමට උත්සාහ දැරීම නිසා අප්‍රේල් මස සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලය තුල රැස්වීම් පැවැත්වීමට නොහැකිවූ බැවින් ඉලක්ක කල ප්‍රමාණයෙන් එක් රැස්වීම් වාරයක් පැවැත්වීමට නොහැකි විය.

- **නිපුණතා පාදක ඇගයීම් නිලධාරීන්ගේ ප්‍රමාණයන් හා අවශ්‍යවන වෘත්තීන් පිළිබද පුරෝකථනය කිරීම**

  යතෝක්ත කාල පරාසය තුල මෙවැනි ඇස්කමේන්තු කිරීම් 2ක් සැලසුම් කර තිබූ නමුත් එවැනි ඇස්තමේන්තු කිරීම් දෙකක අවශ්‍යතාවයක් නොවූ හෙයින් එක් පුරෝකථනයක් පමණක් සිදුකරන ලදී.

- **නිපුණතා පාදක ඇගයීම් නිලධාරීන් / නිලධාරිනියන් ලෙස පුහුණු කිරීම සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.**

  නිපුණතා පාදක ඇගයීම් නිලධාරී / නිලධාරිනියන් ලෙස කටයුතු කිරීමට කැමති අයගෙන් අයදුම්පත් භාර ගැනීම නොකඩවා මෙම ඒකකයෙන් සිදුකරන අතර එසේ ලියාපදිංචි අයදුම්කරුවන්ගෙන් සුදුසු අයවලුන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම සිදුකෙරේ. මෙවැනි සම්මුඛ පරීක්ෂණ 04ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර ගතවූ කාලය තුල එවැනි සම්මුඛ පරීක්ෂණ දින 05ක් පුරා පවත්වා ඇත.

- **නිපුණතා පාදක ඇගයීම්කරුවන් පුහුණු කෙරෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම**

  සම්මුඛ පරීක්ෂණ මගින් තෝරාගන්නා අයදුම්කරුවන් දින 05කින් යුත් විශේෂ පුහුණු වැඩසටහනක් මගින් පුහුණු කෙරෙන අතර වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව මෙම පුහුණු වැඩසටහන් 06ක් පැවැත්වීමට සැලසුම්කල අතර එවැනි වැඩ සටහන් 08ක් පවත්වා නිපුණතා පාදක ඇගයීම් නිලධාරීන් / නිලධාරිනියන් 208 දෙනෙකු ගතවූ වසරේදී පුහුණු කොට ඇත.

  විදේශ සේවා නියුක්ති කාර්යංශයෙහි හා සංචාරක හා හෝටල් කලමණාකරණ ආයතනයන් මගින් කරනු ලැබූ විශේෂ ඉල්ලීමකට අනුව එම ආයතනයන්හි සේවය කරන නිලධාරී / නිලධාරිනියන් නිපුණතා පාදක ඇගයීම්කරුවන් ලෙස පුහුණු කිරීම සඳහා විශේෂ පාඨමාලා 2ක් පැවැත්වූ හෙයින් ඉලක්ක කළ ප්‍රමාණයට වඩා වැඩි වැඩසටහන් ප්‍රමාණයක් පවත්වන ලදී.

- **බල ලත් නිපුණතා පාදක ඇගයීම් නිලධාරීන් පත් කිරීම**

  නිපුණතා පාදක ඇගයීම් 25ක් සම්පූර්ණ කරන ඇගයීම් නිලධාරීන් බලපත් ලබාගැනීමට සුදුසුකම් ලබන අතර ඔවුන් අතරින් සුදුස්සන් තෝරා බලපත් ලබාදීමේ වගකීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පවරා ඇත. පසුගිය අප්‍රේල් මාසය වන විට එවැනි සුදුසුකම් සපුරන ලද පිරිස් වෙත අදාල ඉල්ලුම්පත් යවන ලද අතර 138 දෙනෙකු එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් කොට තිබුණි. ඔවුන් අතරින් 108 දෙනෙකු මැයි මාසයේ පවත්වන ලද ලිඛිත පරීක්ෂණයට හා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටී අතර සුදුසුකම් සපුරණ ලද 76 දෙනෙකු වෙත බලපත් නිකුත් කරනලදී.

- **නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම**

ප්‍රතීතනය ලද පාඨමාලා පවත්වන පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පාඨමාලා සම්පූර්ණ කරන ආධුනිකයන් හට ඇගයීම් පැවැත්වීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදිය යුතුය. ගතවූ වසර තුළ එවැනි අනුමත කිරීම් 334ක් ලබාදී ඇත. සැලසුම්කරන ලද සංඛ්‍යාව 150ක් පමණි.

- **පෙර දැනුම හැදිනීමේ ක්‍රමය මත ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත්කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම**

  උක්ත කාරණය සම්බන්ධව මෙම කටයුත්ත ඉටුකරන ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ අදාල නිලධාරීන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් 2ක් පවත්වා ඇත.
  එවැනි සාකච්ඡා 04ක් සැලසුම් කර තිබූ නමුත් විසඳා ගැනිමට ගැටළු නොතිබූ හෙයින් ගතවූ වසර තුළ පවත්වන ලද්දේ එවැනි රැස්වීම් 2ක් පමණි.

- **ඇගයීම් කටයුතුවල සංඝතභාවය පවත්වා ගැනීම**

  කෙරෙන නිපුණතා පාදක ඇගයීම් කටයුතුවල සංඝතභාවය තහවුරු කර ගැනීමේ අරමුණින් එක් එක් වෘත්තීන්ට අදාල සියළුම ඇගයීම්කරුවන් කැඳවා සාකච්ඡාකර තීරණයන්ට පැමිණීම මෙම වැඩමුළුවල ප්‍රධාන අරමුණවේ. ගතවූ කාලය තුල එවැනි වැඩමුළු, වෘත්තීන් 10ක් අරමුණු කරගෙන සිදුකිරීමට සැලසුම් කල තිබූ අතර ඒ සියළුම වැඩමුවළු සැලසුම්කළ පරිදිම පවත්වාගැනීමට හැකිවිය.

- **නිපුණතා පාදක ඇගයීම් කටයුතු විගණනය කිරීම**

  නිපුණතා පාදක ඇගයීම් කටයුතු නිසියාකාරව සිදුවී ඇති දැයි විගණනයන් මගින් නිරීක්ෂණය කිරීමට කොමිෂන් සභාව කටයුතු කරනු ලබයි. සැලසුම් කළ පරිදිම එවැනි විගණනයන් 8ක් ගතවූ වසර තුළ පවත්වා ඇත.

- **ඇගයීම් කටයුතු සිදුකරන අවස්ථාවේ විගණනයන් සිදුකිරීම**

  අහඹු වශයෙන් තොරාගන්නා ලද මධ්‍යස්ථානවල සිදුකරන ඇගයීම් එම අවස්ථාවේදීම විගණනයට ලක්කිරීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කර ඇති එක් කාර්යක් වෙයි. එවැනි විගණනයන් 10ක් පැවැත්වීමට සැලසුම්කර තිබූ අතර එම විගණනයන් 08ක් ගතවූ වසර තුළ සම්පූර්ණකර ඇත.

7.7 **2012 වසර තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහතිකපත් 18,111ක් නිකුත් කර ඇති අතර විස්තර පහත දැක්වේ.**

වගුව **7.1** ආයතන අනුව **2012** වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානලාභීන් සහ සහතිකලාභීන්

| ආයතනය | සහතිකපත් ලාභීන් | | | සහතිකපත් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | නිපුණතා පාදක ඇගයීම් ප්‍රදාන ලාභීන් | පෙර දැනුම ඇගයීම් ප්‍රදාන ලාභීන් | මුළු සහතික ලාභීන් | නිපුණතා පාදක ඇගයීම් නිකුත්කල සහතික | පෙර දැනුම ඇගයීම් නිකුත්කල සහතික | මුළු සහතික ප්‍රමාණය |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 1297 | 0 | 1279 | 1316 | 0 | 1316 |
| ජාතික ආධුනිතත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 900 | 2703 | 3602 | 1214 | 3374 | 4588 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 5323 | 301 | 5622 | 6737 | 402 | 7139 |
| ජාතික තරුණ සේවා සභාව | 379 | 0 | 379 | 534 | 0 | 534 |
| පෞද්ගලික | 3608 | 0 | 3608 | 4534 | 0 | 4534 |
| **එකතුව** | 11489 | 3004 | 14490 | 14335 | 3776 | 18111 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

වගුව **7.2** මුද්‍රණය කරනලද සහතිකපත් ප්‍රමාණය - පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත් වෘත්තීය පුහුණුව සපයන ආයතන - **2012**

| ආයතනයේ නම | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| P01/0179 - ස්වීස් ලංකා හෝටල් පාසල | 14 |
| P01/0213 - ආසියා ලංකා කාර්මික හා ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය | 11 |
| P01/0222 - රුවිස් කේශාලංකරණ හා රූපලාවන්‍ය පුහුනු පාසල | 15 |
| P01/0223 - ප්‍රීමා සමූහ ව්‍යාපාරය - ශ්‍රී ලංකාව | 02 |
| P01/0102 - සසිකා ඩ්‍රස් ලයින් | 08 |
| P01/0247 - ටෙක්නික් ඉන්ටර් නැෂනල් (පෞද්ගලික) සමාගම | 71 |
| P01/0253 - ඉන්ටර් නැෂනල් ඇකඩමි ඔෆ් බියුටිෂන්ස් (පෞද්ගලික) සමාගම | 233 |
| P01/0257 - වින්-ස්ටෝන් හෝටල් පාසල | 47 |
| P01/0311 - ස්කිල් ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම | 11 |
| P01/0322 - ඉන්ෆොනෙට් කොම්පියුටර් සිස්ටම් (පෞද්ගලික) සමාගම | 22 |

| ආයතනයේ නම | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| | |
| P01/0274 - ටෙක්නොලොජි ඇන්ඩ් කොම්පියුටර් ට්‍රේනින් ඉන්ස්ටිටියුට් (පෞද්ගලික) ආයතනය | 37 |
| P01/0325 - රමණී අර්සකුලරත්න ඉන්ටර් නැෂනල් ඇකඩමි | 24 |
| P01/0295 - සැලෝන් ලී කොයිෆර් තිලාක් | 24 |
| P01/0308 - ෆ්‍රිල්ස් බේකරි, ඉවුම් පිහුම් හා රසකැවිලි නිශ්පාදන පුහුණු ආයතනය | 24 |
| P04/0090 - කොම් කොම්පියුටර් ඉන්ස්ටිටියුට් | 07 |
| P02/0152 - රන්ලිය ඉන්ස්ටිටියුට් (පෞද්ගලික) | 25 |
| P01/0326 - රන්මලී ඇසෝසියේට් ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) ආයතනය | 37 |
| P03/0048 - ජුලිස්ටන් ලංකා ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) ආයතනය | 37 |
| P01/0345 - ක්‍රියේටිව් ඇකඩමි | 74 |
| P01/0391 - රන්ජනා සැලෝන් ඇන්ඩ් ඇකඩමි | 35 |
| P06/0047 - රුහුණු ගැමි කාන්තා සංවිධානය | 19 |
| P06/0055 - බෝසත් පදනම | 10 |
| P02/0021 - ඩීසල් මෝටර් ඉංජිනේරු ආයතනය | 60 |
| P02/0045 - දොන් බොස්කෝ තාක්‍ෂණ ආයතනය | 126 |
| P02/0084 - එම්.ඩී.පී. පරිගණක පුහුණු ආයතනය | 45 |
| P02/0097 - බීටාකොම් මල්ටිමීඩියා සහ පරිගණක අධ්‍යාපන ආයතනය | 20 |
| P02/0104 - ටෙක්නොලොජි ඇන්ඩ් කම්පියුටර් අධ්‍යාපන ආයතනය | 70 |
| P02/0123 - එස්. එම්. අයි. වෘත්තීය හෙද පුහුණු ආයතනය | 40 |
| P02/0157 - ක්‍රමස්කි ලංකා පෞද්ගලික ආයතනය | 15 |
| P02/0159 - ගුඩ් ෂෙෆර්ඩ් සිස්ටර් | 126 |
| P02/0182 - ජයනි කේශාලංකරණ, රූපලාවන්‍ය මනාලියන් හැඩගැන්වීමේ පුහුණු පාසල | 47 |
| P03/0019 - ඉක්රා තාක්‍ෂණ පුහුණු ආයතන | 89 |
| P03/0067 - ඇගියෝ සිරිලක් සහන සේවා වෘත්තීය පුහුණු ආයතනය | 65 |
| P03/0076 - කෝනි පරිගණක පුහුණු මධ්‍යස්ථානය | 19 |
| P04/0007 - ජේසුයිට් ඇකඩමි | 13 |
| P04/0071 - එන්. කේ. අයි. පරිගණක පුහුණු ආයතනය | 32 |
| P04/0094 - වන් වර්ල්ඩ් පදනම | 79 |
| P04/0105 - ලිදකි වෙරි අධ්‍යාපන ආයතනය | 54 |
| P05/0001 - දැහැමි සමාජසේවා පදනම | 05 |
| P05/0041 - ශ්‍රී රේවත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 12 |

| ආයතනයේ නම | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| P05/0071 - සවිය කාන්තා සංවිධානය | 10 |
| P06/0040 - ශ්‍රී කාවන්තිස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 12 |
| P07/0043 - ඉන්ස්ටිටියුට් ඔෆ් ප්‍රොප්‍රෙෂනල් කම්පියුටර් ස්ටඩීස් | 53 |
| P09/0016 - වෝලන්කන්ද තරුණ පුහුණු මධ්‍යස්ථානය | 42 |
| P09/0051 - දොන් බොස්කෝ තාක්ෂණ ආයතනය - මහනුවර | 12 |
| P09/0091 - සුනේත්‍රා කේශලාවන්‍ය, රූපලාවන්‍ය හා මනාලියන් හැඩගැන්වීමේ පුහුණු ආයතනය | 30 |
| P09/0107 - ජයනි කේශාලංකරණ, රූපලාවන්‍ය මනාලියන් හැඩගැන්වීමේ පුහුණු පාසල | 13 |
| P10/0038 - ඉන්ෆොමැක්ස් පරිගණක තාක්ෂණ ආයතනය | 10 |
| P11/0034 - තොන්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 127 |
| P12/0076 - මයික්‍රොකොම් තාක්ෂණ විද්‍යායතනය | 87 |
| P12/0092 - වයඹ කාර්මික විද්‍යාලය (පෞද්ගලික) | 322 |
| P12/0104 - සියාසි විද්‍යායතනය | 183 |
| P13/0030 - ටෙක් විතානිකා | 60 |
| P14/0038 - බිෂොප් ලියෝ තාක්ෂණ ආයතනය | 173 |
| P06/0064 - ආසිරි අයි. සී. ටී. ඒ. මධ්‍යස්ථානය | 11 |
| P07/0053 - ජෙම් ඇන්ඩ් ජුවලරි රිසච් ඇන්ඩ් ඉන්ස්ටිටියුට් | 03 |
| P14/0056 - අනාගතය අපේ අතේ සංවර්ධන පදනම | 25 |
| P15/0025 - ශාන්ත අන්තෝනි තාක්ෂණ ආයතනය | 88 |
| P15/0028 - එස්.ඕ.එස්. ළමා ගම්මානය | 63 |
| P16/0041 - එස්.ඕ.එස්. ළමා ගම්මානය | 30 |
| P09/0123 - සැලෝන් රොසිටා හෙයාර් ඇන්ඩ් බියුටි ස්ටුඩියෝ (පෞද්ගලික) ආයතනය | 67 |
| P16/0083 - ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය | 130 |
| P18/0011 - උසස් අධ්‍යාපන ආයතනය | 49 |
| P12/0113 - හයිටෙක් ලංකා ඉන්ටර්නැෂනල් | 215 |
| P18/0031 - සමාජ සුබසාධක සංවිධානය - අම්පාර දිස්ත්‍රිකය | 19 |
| P18/0033 - සමාජ සුබසාධක සංවිධානය - අම්පාර දිස්ත්‍රිකය | 4 |
| P12/0126 - සැලෝන් කුසුම් හෙයාර් බියුටි ඇන්ඩ් බ්‍රයිඩල් ඇකඩමි | 16 |
| P20/0031 - සර්වෝදය ප්‍රාදේශීය මධ්‍යස්ථානය - මඩකලපුව | 11 |
| P20/0035 - රෝයල් පරිගණක ආයතනය | 62 |
| P20/0036 - මියානි තාක්ෂණ ආයතනය | 212 |
| P14/0042 - ආබාධිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 09 |

| ආයතනයේ නම | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| P21/0009 - ඔගනයිසේෂන් ඔෆ් රිහැබිලිටේෂන් ඔෆ් ද හැන්ඩික්‍රාෆ්ට් | 18 |
| P01/0240 - ලිට්ල් බඩ්ස් | 11 |
| P02/0073 - දියගල බෝයිස් ටවුන් | 17 |
| P13/0039 - මර්සි එඩියුකේෂන් කම්ප්ලෙක්ස් | 173 |
| P15/0021 - වෙල්ෆෙයා ඩිවලොප්මන්ට් සෙන්ටර් | 82 |
| P18/0034 - බෝධිරාජ පදනම | 12 |
| P19/0022 - සර්වෝදය අම්පාර | 89 |
| P20/0054 - ජී. අයි. ඉසඩ්. ශ්‍රී ලංකා | 35 |
| P20/0055- ජී. අයි. ඉසඩ්. ශ්‍රී ලංකා | 93 |
| P20/0056 - ජී. අයි. ඉසඩ්. ශ්‍රී ලංකා | 56 |
| P20/0058 - ජී. අයි. ඉසඩ්. ශ්‍රී ලංකා | 56 |
| P20/0060 - ජී. අයි. ඉසඩ්. ශ්‍රී ලංකා | 30 |
| P20/0061- ජී. අයි. ඉසඩ්. ශ්‍රී ලංකා | 45 |
| P21/0019 - සී. සී. අයි. එස්. එල්. | 48 |
| එකතුව | **4534** |

**මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය**

මීට අමතරව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2012 වසර සඳහා සහතිකපත් 320 නැවත මුද්‍රණය කරන ලදී. විස්තර පහතපරිදි වේ.

| සහතික වර්ගය | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| වැරදි නිසා නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර | 318 |
| නැතිවූ සහතික වෙනුවට අනු පිටපත් | 2 |
| **එකතුව** | 320 |

**මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය**

වගුව 7.3 මුද්‍රණය කරන ලද සහතික පත්‍ර ප්‍රමාණය - වෘත්තීන් අනුව

| කේතය | විෂය මාලාව | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (පෙරදැක්ම ඇගයීම) | වෘත්තීය පුහුණු අධිකාරිය | ජාතික තරුණ සේවා සභාව | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| A01T001 | කෘෂි යන්ත්‍ර උපකරණ තාක්ෂණය | 12 | 0 | 0 | 0 | 0 | 0 | 12 |
| BCS01 | කාර්ය කිරීමට අවශ්‍යය මූලික නිපුණතා | 0 | 0 | 99 | 0 | 0 | 0 | 99 |
| D15S001 | පළතුරු හා එළවළු සැකසුම් ශිල්පී | 0 | 0 | 09 | 0 | 0 | 0 | 09 |
| D15S002 | බේකරි ශිල්පී | 0 | 0 | 62 | 151 | 23 | 152 | 388 |
| D15T001 | ආහාර තාක්ෂණය | 22 | 0 | 0 | 0 | 0 | 0 | 22 |
| D18S007 | මෝස්තර නිර්මාණ ශිල්පී | 0 | 0 | 0 | 0 | 0 | 08 | 08 |
| D18S001 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | 0 | 0 | 10 | 120 | 0 | 0 | 130 |
| D18S002 | වර්ක් ස්ටඩී ඔෆිසර් | 0 | 0 | 0 | 05 | 0 | 0 | 05 |
| D18S004 | ඇඳුම් මසන්නා | 0 | 0 | 112 | 50 | 0 | 121 | 283 |
| D19S001 | සම් භාණ්ඩ හා පාවහන් තැනුම් ශිල්පී | 34 | 0 | 0 | 20 | 0 | 0 | 54 |
| D22S001 | පරිගණක ප්‍රකාශන ශිල්පී | 0 | 0 | 02 | 0 | 0 | 0 | 02 |
| D22S002 | පරිගණක චිත්‍ර සැකසුම් ශිල්පී | 0 | 114 | 12 | 75 | 6 | 93 | 300 |
| D22S003 | ලිතෝ යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී | 0 | 02 | 01 | 24 | 0 | 0 | 27 |
| D22S004 | පොත් බඳින්නා | 0 | 0 | 01 | 0 | 0 | 0 | 01 |
| D26S001 | මැණික් ඔප දමන්නා | 0 | 0 | 01 | 0 | 0 | 0 | 01 |
| D28S001 | ලෝහ පිරි සැකසුම් ශිල්පී | 0 | 10 | 32 | 29 | 0 | 0 | 71 |
| D28S002 | පෑස්සුම් ශිල්පී | 21 | 63 | 242 | 604 | 16 | 185 | 1131 |
| D28S003 | ආවුද හා අච්චු තැනුම් ශිල්පී | 0 | 0 | 0 | 0 | 0 | 05 | 05 |
| D28S004 | වැද්දුම් ශිල්පී | 0 | 0 | 03 | 0 | 0 | 0 | 03 |
| D28T001 | පෑස්සුම් තාක්ෂණ | 07 | 0 | 0 | 0 | 0 | 0 | 07 |
| D29S001 | යන්ත්‍ර ශිල්පී | 36 | 10 | 21 | 96 | 0 | 25 | 188 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| D29S002 | ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී | 33 | 48 | 42 | 211 | 14 | 211 | 559 |
| D29S004 | මහන යන්ත්‍ර කාර්මික ශිල්පී | 0 | 0 | 4 | 5 | 0 | 0 | 09 |
| D29T001 | නිශ්පාදන තාක්‍ෂණ | 18 | 0 | 0 | 0 | 0 | 0 | 18 |
| D32S001 | ගුවන් විදුලි, රූපවාහිනී සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා | 22 | 08 | 43 | 146 | 14 | 104 | 337 |
| D32S001 | මෙකාට්‍රොනික් තාක්ෂණය | 14 | 0 | 0 | 0 | 0 | 0 | 14 |
| D33T001 | මෙකාට්‍රොනික් තාක්ෂණය | 24 | 0 | 0 | 0 | 0 | 0 | 24 |
| D36S001 | දැව කාර්මික ශිල්පී (ගෘහභාණ්ඩ) | 18 | 28 | 146 | 345 | 0 | 82 | 619 |
| D36S002 | ස්වර්ණාභරණ ගල් බැඳුම් ශිල්පී | 0 | 0 | 0 | 23 | 0 | 0 | 23 |
| D36S003 | ස්වර්ණාභරණ සාදන්නා | 0 | 0 | 0 | 39 | 0 | 3 | 42 |
| E40S001 | විදුලිකාර්මික ශිල්පී | 96 | 81 | 307 | 953 | 51 | 409 | 1897 |
| E40S002 | ගෘහස්ථ විදුලි උපකරණ පිළිසකර ශිල්පී | 17 | 0 | 10 | 84 | 0 | 08 | 119 |
| E40S003 | විදුලි මෝටර් ඔතන්නා | 0 | 0 | 05 | 236 | 0 | 2 | 243 |
| E40S005 | බොයිලේරු ක්‍රියාකරු | 0 | 0 | 02 | 0 | 0 | 0 | 02 |
| E41S001 | ජලනල කාර්මික ශිල්පී | 02 | 45 | 92 | 152 | 0 | 116 | 407 |
| F45S001 | කම්බි නැවුම්කරු | 0 | 0 | 0 | 0 | 0 | 03 | 03 |
| F45S002 | පින්තාරු ශිල්පී (ගොඩනැගිලි) | 0 | 0 | 09 | 0 | 0 | 0 | 09 |
| F45S003 | ඇලුමිනියම් පිළිසැකසුම් ශිල්පී | 29 | 0 | 05 | 235 | 0 | 44 | 313 |
| F45S004 | දැව කාර්මික ශිල්පී (ගොඩනැගිලි) | 0 | 42 | 78 | 36 | 0 | 136 | 292 |
| F45S005 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) | 08 | 69 | 272 | 186 | 0 | 155 | 690 |
| F45S006 | ඉදිකිරීම් වැඩබිම් පරීක්ෂක | 0 | 0 | 18 | 0 | 0 | 11 | 29 |
| F45S008 | ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරු | 0 | 0 | 0 | 0 | 0 | 209 | 209 |
| F45T001 | ඉදිකිරීම් තාක්ෂණය | 57 | 0 | 0 | 0 | 0 | 0 | 57 |
| F45S009 | සැලසුම් ශිල්පී | 0 | 0 | 68 | 0 | 0 | 36 | 104 |
| G50S001 | මෝටර් රථ වායුසමීකරණ ශිල්පී | 0 | 0 | 0 | 19 | 0 | 0 | 19 |
| G50S002 | මෝටර් රථ විදුලි ශිල්පී | 0 | 34 | 07 | 67 | 0 | 0 | 108 |
| G50S003 | මෝටර් රථ යාන්ත්‍රික ශිල්පී | 103 | 337 | 206 | 218 | 31 | 310 | 1205 |
| G50S004 | මෝටර් රථ පින්තාරු ශිල්පී | 0 | 13 | 55 | 43 | 0 | 0 | 111 |
| G50S005 | මෝටර් රථ වැද්දුම් ශිල්පී | 08 | 24 | 20 | 33 | 0 | 0 | 85 |
| G50S006 | යතුරුපැදි කාර්මික ශිල්පී | 0 | 0 | 71 | 414 | 31 | 58 | 574 |
| G50S007 | ත්‍රී වීලර් කාර්මික ශිල්පී | 0 | 0 | 20 | 0 | 0 | 11 | 31 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| G50S009 | පිටතින් සවිකරණ ලද මෝටර් බෝට්ටු කාර්මික | 0 | 48 | 03 | 13 | 0 | 0 | 64 |
| G50 T001 | කාර්මික තාක්ෂණය | 47 | 0 | 0 | 0 | 0 | 0 | 47 |
| G52 T001 | ශීතකරණ හා වායු සමීකරණ තාක්ෂණය | 21 | 0 | 0 | 0 | 0 | 0 | 21 |
| H55S001 | වේටර්/ස්ටුවඩ් | 0 | 0 | 07 | 0 | 0 | 39 | 46 |
| H55S003 | ආහාර පිසින්නා | 0 | 0 | 15 | 0 | 0 | 11 | 26 |
| I63S001 | ගබඩා භාරකරු | 0 | 0 | 11 | 0 | 0 | 0 | 11 |
| I63S002 | බරවාහන ක්‍රියාකරු | 0 | 0 | 0 | 0 | 0 | 06 | 06 |
| I64S001 | සන්නිවේදන තාක්ෂණවේදී | 18 | 0 | 0 | 0 | 0 | 0 | 18 |
| I64 T001 | සන්නිවේදන තාක්ෂණය | 06 | 0 | 0 | 0 | 0 | 0 | 06 |
| K72S001 | පරිගණක දෘඩාංග කාර්මික ශිල්පී | 06 | 0 | 43 | 246 | 48 | 70 | 413 |
| K72S002 | පරිගණක ජාල කාර්මික ශිල්පී | 0 | 0 | 09 | 0 | 0 | 19 | 28 |
| K72S003 | පරිගණක යෙදවුම් සහායක | 384 | 238 | 486 | 1076 | 57 | 768 | 3009 |
| K72S004 | තොරතුරු හා සංනිවේදන තාක්‍ෂණ ශිල්පී | 12 | 0 | 04 | 0 | 0 | 63 | 79 |
| K72 T001 | තොරතුරු හා සංනිවේදන තාක්‍ෂණ | 241 | 0 | 0 | 0 | 0 | 0 | 241 |
| K74S001 | ලේකම් | 0 | 0 | 06 | 0 | 0 | 0 | 06 |
| K74S004 | ලිපිකරු | 0 | 0 | 03 | 0 | 0 | 08 | 11 |
| K74S005 | කැමරාකරු | 0 | 0 | 01 | 0 | 0 | 0 | 01 |
| M80S001 | පෙර-පාසැල් ගුරු | 0 | 0 | 22 | 0 | 0 | 11 | 33 |
| N85S001 | බයෝ මෙඩිකල් ටෙක්නීෂියන් | 0 | 0 | 02 | 0 | 0 | 0 | 02 |
| N85S002 | හෙද සහකාර | 0 | 0 | 0 | 0 | 0 | 230 | 230 |
| O90S002 | අපද්‍රව්‍ය කළමණාකරණ මෙහෙයුම් සහකාර | 0 | 0 | 76 | 0 | 0 | 0 | 76 |
| O93S001 | රූපලාවන්‍ය ශිල්පී | 0 | 0 | 425 | 780 | 123 | 554 | 1882 |
| O93S002 | කොණ්ඩාමෝස්තර ශිල්පී | 0 | 0 | 174 | 405 | 120 | 258 | 957 |
| එකතුව | | 1316 | 1214 | 3374 | 7139 | 534 | 4534 | 18111 |

**මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය**

වගුව 7.4 **2012 වර්ෂය සඳහා නිකුත් කරණ ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර ප්‍රමාණය ස්ත්‍රී/පුරුෂ භාවය අනුව**

| ආයතනය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 814 | 465 | 1279 |
| ජාතික ආධුනිතත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 2632 | 970 | 3602 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 3999 | 1623 | 5622 |
| ජාතික තරුණ සේවා සභාව | 205 | 174 | 379 |
| පෞද්ගලික | 2167 | 1441 | 3608 |
| **එකතුව** | **9817** | **4673** | **14490** |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

වගුව 7.5 **2011 හා 2012 වර්ෂ අතර ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ප්‍රමාණය අතර සංසන්දනයක් (පෙර දැනුම ඇගයුම හා නිපුණතා පාදක ඇගයීම මඟින්)**


| සහතික වර්ගය | **2011** | **2012** | සහතික පත් ප්‍රමාණයේ වෙනස |
|---|---|---|---|
| නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය | 14,576 | 14,335 | 241 |
| පෙර දැනුම ඇගයීම් ක්‍රමය | 1996 | 3776 | 1780 |
| එකතුව | 16572 | 18111 | 1539 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

වගුව 7.6 **2008 සිට 2012 දක්වා මුද්‍රණය කරනලද මුළු සහතික පත්‍ර ප්‍රමාණය**

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | එකතුව |
|---|---|---|---|---|---|---|
| සහතිකපත්‍ර ප්‍රමාණය | 8915 | 11249 | 13256 | 16572 | 18111 | 68103 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය




තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2012 වර්ෂය අවසාන වන විට සහතිකපත් 68103 ක් නිකුත්කර ඇත.

## 8.0 තොරතුරු පද්ධති අංශය

ඕනෑම ආයතනයක සංවර්ධනය සඳහා උපායමාර්ගික තීරණ ගැනීමේ දී ඉතා වැදගත් සාධකයක් වන්නේ තොරතුරු සම්පතය. මෙම තොරතුරු සම්පත් එක් එක් අවශ්‍ය පුද්ගලයන්ට හා ආයතන වලට අවශ්‍ය පරිදි ලබාදීම හා ලබා ගැනීම සංවර්ධනය සඳහා ඉතා වැදගත් සාධකයක් වේ. නවීනතම තාක්ෂණය උපයෝගී කරගෙන ලබා දෙන තොරතුරු සේවාව පැතුරුණු හා සංකීර්ණ කාර්යයක් වන අතර එම තොරතුරු ලබා ගැනීම ද තාක්ෂණය උපයෝගී කරගෙන පහසුවෙන් කළ හැකිය. තොරතුරු පද්ධති අංශය මගින් විවිධ වූ තොරතුරු එක්රැස් කර අවශ්‍ය පරිදි පිරිසැකසුම් කර එම තෙරතුරු අදාල පාර්ශවයන්ට ලබා දීමට පහසු මංපෙත් විවර කිරීමේ කාර්යය ඉටු කරනු ලැබේ. මෙම කාර්ය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගන්නා අතර එමගින් තොරතුරු භාවිතයට ගැනීමට වැඩි පහසුවක් හා උපයෝගිතාවයක් ඇති වේ. තොරතුරු සාමුහිකව පරිහරණය කිරීම තුළින් ආයතනික සංවර්ධනය ලඟා කර ගත හැකිය. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් මෙම අත්‍යවශ්‍ය තොරතුරු සේවාව විධිමත් පරිදි ලබා දීම සඳහා නවීනතම තාක්ෂණය උපයෝගී කරගෙන එම තොරතුරු ආයතනික දියුණුව සඳහා සාර්ථකව පරිහරණය කිරීමට හැකි සෑම උපාය මාර්ග හා විධිවිධාන සැලසීම කර ඇත.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන අරමුණු අතර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් හා පහසු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම ද සිදුවේ. තොරතුරු පද්ධති අංශය අධ්‍යක්ෂ, ශ්‍රම වෙළෙඳ පොළ විශ්ලේෂක, සංඛ්‍යාලේඛණඥ, පුස්තකාලාධිපති, *කනිෂ්ඨ පරිගණක වැඩසටහන් නිළධාරි* , සංවර්ධන *නිළධාරි*, පරිගණක ක්‍රියාකරු සහ කා.කා.ස. ඇතුළු කාර්ය මණ්ඩලයකින් 2012 වසරේ දී සමන්විත විය.

මෙම තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වැඩසටහන් පහත දැක්වේ

- ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරිම හා පවත්වාගෙන යාම.
- ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු සංග්‍රහය සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම.
- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුවත් ලිපිය (Newsletter) සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම.
- ප්‍රතීතනය කරන ලද පාඨමාලා හා ලියාපදිංචි ආයතන පද්ධතිය පාලනය කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර මුද්‍රණය කිරීමේ ක්‍රමවේදය පවත්වාගෙන යාම
- අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය පාලනය කිරීම
- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සංවර්ධනය කර පවත්වාගෙන යාම.

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අභ්‍යන්තර වෙබ් අඩවිය (Internet) සංවර්ධනය කර පවත්වාගෙන යාම.
- විද්‍යුත් සන්නිවේදන පහසුකම් කාර්ය මණ්ඩලයට සැලසීම හා අභ්‍යන්තර පරිගණක ජාලය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම. එම සේවාව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ලබා දීම
- තොරතුරු තාක්ෂණය උපයෝගි කරගෙන විවිධ මෘදුකාංග සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම තුළින් කොමිෂන් සභාවේ කාර්යයන් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පරිගණක දෘඩාංග හා මෘදුකාංග සපයා දීම.
- කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පුස්තකාල සේවාව හා ආශ්‍රිත තොරතුරු පහසුකම් සැලසීම හා පුස්තකාලය පවත්වාගෙන යාම.
- අවශ්‍යය වූ විට අදාල පරිදි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර සම්පාදනය කිරීම, යනාදී කටයුතු මින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනේ.


මෙම අංශයේ ප්‍රධාන තොරතුරු පද්ධතිය සමන්විත වන්නේ ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු පද්ධතිය, අධ්‍යාපන තොරතුරු කළමණාකරන පද්ධතිය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රධානය කිරීමේ පද්ධතිය හා ආයතන ලියාපදිංචි කිරීමේ හා පාඨමාලා ප්‍රතීතනය කිරීමේ තොරතුරු පද්ධතිය යනාදී තොරතුරු පද්ධතීන්ගෙනි. 2012 වර්ෂය තුල දී මෙම අංශය මගින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා සේවාවන් ඉටු කිරීමට සමත් වී ඇත.


## 8.1 ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කර ගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත. දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මගින් ලබාගන්නා ලද ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියෝජිත ආයතන, පුහුණුකරුවන්, සේවා යෝජකයන් හා සේවා යෝජක නියෝජිත ආයතන යන අයගේ ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin) මගින් හා කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව (TVEC web site: www.tvec.gov.lk/lmi) මගින් ලබාගත හැක.

## 8.2 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය පිළියෙළ කිරීම හා ප්‍රකාශ කිරීම

2012 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන දෙකක් ප්‍රකාශයට පත් කිරීමට තොරතුරු පද්ධති අංශයට හැකි විය. මෙම ප්‍රකාශන මගින් 2011 වසරේ අග භාගයේ දී සහ 2012 වර්ෂයේ මුල් භාගය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳ පොළේ පැවති ස්වභාවය විනිවිදව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ. මෙම තොරතුරු ප්‍රකාශනය මගින් රැකියා අපේක්ෂිකයන්ට, සේවා යෝජකයන්ට, වෘත්තීය මාර්ගෝපදේශකයන්ට, වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සැලසුම්කරුවන්ට, වෘත්තීය පුහුණුවක් අපේක්ෂාකරන්නන් හට සහ අනෙකුත් ක්ෂෙත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට, විවිධ සංවිධාන වලට ප්‍රයෝජනවත් තොරතුරු රාශියක් ලබා දි ඇත.




2012 වසර තුලදී ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු ප්‍රකාශනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු පද්ධති අංශය ක්‍රියා කර ඇත. ඒ අනුව ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු ප්‍රකාශනයට නව මුහුණුවරක් දෙමින් ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධව කරන ලද පර්යේෂණ හා ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු, ශ්‍රම වෙළෙඳ පොළ ගමන් මග පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වන අයට වඩා ප්‍රයෝජනවත් වේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම, දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත් පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන්හී ඇති රැකියා අවස්ථා, රැකියාගත වීම්, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී, පුරුෂ භාවය හා පලපුරුද්ද ආදි සියලුම අදාල තොරතුරු අන්තර් ගත කර ඇත

2005 සිට 2012 වර්ෂය පළමු භාගය දක්වා එක් එක් වර්ෂයන්හි සිළුමිණ, හා "Sunday Observer"පුවත්පත් සහ රජයේ Gazzette මගින් සමීක්ෂණය කරන ලද දැන්වීම් ගණන අංක 4.1 වගුවේ දැක්වේ.

**වගුව 8.1 - සම්පාදනය කරන ලද රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව**

| | වසර | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2005** | **2006** | **2007** | **2008*** | **2009*** | **2010*** | **2011** | **2012*** පළමු භාගය |
| පැවති රැකියා වෙළඳ දැන්වීම් ගණන | 83,527 | 104,839 | 113,060 | 116,157 | 82,167 | 124,741 | 108,193 | 71,121 |

* රජයේ ප්‍රකාශිත ගැසට් පත්‍රයේ අන්තර්ගත රැකියා අවස්ථා

පුවත් දැන්වීම් මගින් පලකර ඇති රැකියා පුරප්පාඩු මට්ටම තව දුරටත් සාර්ථක කර ගැනීම සඳහා විද්‍යුත් තැපැල හා වෙබ් අඩවි තොරතුරු සලකා බලන ලදි.


### 8.2.1 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව

කාර්යක්ෂම හා ඵලදායි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු, ඒවා භාවිතා කරන්නන් හට ලබාදීමේ අරමුණ ඇතිව වෙන්වූ මෙම වෙබ් අඩවිය 2012 වසර තුල යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.

එමගින්,

- වත්මන් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු
- පුහුණු පාඨමාලා තොරතුරු *අන්තර්ජාලයෙන් බලාගත හැකි වීම*
- පසුගිය ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු ප්‍රකාශන
- ශ්‍රම වෙළෙඳ පොළ පිළිබඳ සංකල්ප හා අර්ථ දැක්වීම
- ප්‍රයෝජනවත් වෙබ් අඩවි වලට පිවිසුම
- ජීව දත්ත සහිත ඉල්ලුම් පත්‍ර සදා ගැනීමට උදව් කිරීම
- රැකියා ඇබෑර්තු *තොරතුරු* ලබාගැනිමට හැකි වීම
- කාර්මික හා ඊට සම්බන්ධ වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා 10ක් ප්‍රදර්ශනය කිරීම යනාදී වැදගත් කරුණු ලබා දීමට කටයුතු කර ඇත.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුවේ අනුරුවක් පහත දැක්වේ.




## 8.2.2 අන්තර්ජාලය, විද්‍යුත් තැපැල හා අභ්‍යන්තර ජාල පහසුකම්

විද්‍යුත් තැපැල භාවිතා කිරීම පිළිබඳව වූ රජයේ චක්‍ර ලේඛය අනුව කාර්යාල තොරතුරු හුවමාරු කිරීමේ දී කාර්යක්ෂමතාවය වැඩි කිරීම, වියදම අඩු කිරීම සහ කාලය ඉතුරු කර ගැනීම සඳහා නවතාවයකින් යුතුව අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල් පහසුකම් කාර්යය මණ්ඩලයේ සෑම කෙනෙකුටම භාවිත කිරිමට පහසුකම් සලසා ඇත. එමගින් කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයේ සන්නිවේදන කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට මෙන්ම අන්තර්ජාලය තුලින් නව දැනුම ලබාගැනීමට පහසුකම් සලසා ඇත. කාර්යය මණ්ඩලය වෙත තොරතුරු ලබා දීම සඳහා අභ්‍යන්තර ජාලයක් නඩත්තු කරනු ලබයි. මෙම නව සන්නිවේදන ක්‍රමයේ ඇති නම්‍යශීලි බව හා එමගින් තොරතුරු ලබා ගැනීමේ ඇති පහසුව නිසා එය පරිහරණය කරන්නන්ගේ අවධානයට ලක්ව තිබේ.

පහත සඳහන් අභ්‍යන්තර හා බාහිර වාර්තා අන්තර්ජාලය තුල අඩංගු වේ

- අභ්‍යන්තර ප්‍රතිපත්ති, අභ්‍යන්තර ක්‍රමවේදයන්, අභයන්තර මාර්ගෝපදේශන හා එක් එක් අංශ වල වර්තාවන්
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා
- නියාමන අවශ්‍යතා

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා අභ්‍යන්තර ජාලයට පිවිසිය හැකි අතර ඒ සඳහා අප කාර්යය මණ්ඩලයට පමණක් ආරක්ෂිත පිවිසුම් ලබා දී ඇත.

තොරතුරු පද්ධති අංශය මගින් කාර්යය මණ්ඩලයේ නිලධාරින් අතරේ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අභ්‍යන්තර ජාලය පවත්වාගෙන යනු ලැබේ.

### 8.2.3 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවිය පවත්වාගෙන යාම

තොරතුරු පද්ධති අංශය මගින් කොමිෂන් සභා වෙබ් අඩවිය පාලනය කරනු ලබයි. කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වඩාත් නිවැරදිව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම හා කොමිෂන් සභාවේ නව වැඩි දියුණුවීම් හා වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂත්‍රෙයේ නව සංවර්ධනයන් හඳුන්වා දීම් කොමිෂන් සභා වෙබ් අඩවියේ ඇතුලත් වේ.
මෙම තොරතුරු එකී ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයට ප්‍රයෝජනවත් වුවකි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



අප ප්‍රධාන වෙබ් අඩවිය තුලින් පහත සඳහන් වෙබ් අඩවි වලට පිවිසීමට අවස්ථාව සලසා ඇත

- ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු (LMI)
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)
- පාඨමාලා ලියාපදිංචිය හා ප්‍රතීතනය
- සැලසුම් හා පර්යේෂණ (Planning and Research)
- අභ්‍යන්තර ජාලය (Intranet)
- කොමිෂන් සභාවේ පර්යේෂණ කවය
- පුවත් හා සිදුවීම්
- තොරතුරු පද්ධති
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු මඟ පෙන්වීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රධානය කිරීමේ ක්‍රමවේදය
- අයදුම්පත් හා තොරතුරු බාගත කිරීම
- අභ්‍යන්තර වෙබ් ජාලය

2012 වර්ෂය තුල දි පහත සඳහන් දත්ත ගබඩා හා තොරතුරු අප වෙබ් අඩවියට සම්බන්ධ කර ඇති අතර අවශ්‍ය දත්ත සොයා ගැනිමේ පහසුකම් සලසා ඇත.

- 2013-2017 ආයතනික සැලසුම
- ජාතික TVET ප්‍රතිපත්තිය රාමුව
- සේවාලාභි/පුරවැසි ප්‍රඥප්තිය
- ලියාපදිංචි පුහුණු ආයතන
- වෘත්තීය අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පාඨමාලා විස්තර
- NVQ චක්‍රලේඛන හා මාර්ගෝපදේශන
- NVQ ක්‍රියාකාරි අත්පොත
- ලියාපදිංචි පුහුණු ආයතන
- ප්‍රතීතනය කල පාඨමාලා ලේඛනය
- වෘත්තීය අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පාඨමාලා විස්තර
- ජාතික වෘත්තීය සම්මතයන්ගේ ලේඛනය
- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුවට මග
- පාඨමාලා ඇගයීම් කරුවන්ගේ ලේඛනය
- වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම්
- පුහුණු ආයතන සඳහා ලබාදෙන මූලාධාර
- පර්යේෂණ හා අධ්‍යාපන පුහුණු සැලසුම
- අනෙකුත් පර්යේෂණ TVEC පර්යේෂණ වර්තා

2012 වසර තුල තෘතීයික හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාවේ වෙබ් අඩවිය 2,679,515 වාරයක් භාවිතා කර ඇත. මේ සම්බන්ධ සංඛ්‍යාලේඛන හා භාවිතයන්ගේ අදාල දත්ත පහත වගුවෙහි දැක්වේ.

**2012 වසර තුල තෘතීයික හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාවේ වෙබ් අඩවිය භාවිතය සම්බන්ධ මාසික සංඛ්‍යාලේඛන හා දත්ත**

| මාසය | දිනක සාමාන්‍ය | | | | මාසික එකතුව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **Hits** | **Files** | **Pages** | **Visits** | **Sites** | **KBytes** | **Visits** | **Pages** | **Files** | **Hits** |
| Dec-12 | 8949 | 6326 | 1613 | 484 | 8568 | 41056452 | 15014 | 50013 | 196132 | 277431 |
| Nov-12 | 8174 | 5716 | 1399 | 429 | 7495 | 23994336 | 12877 | 41978 | 171507 | 245232 |
| Oct-12 | 8702 | 5978 | 1494 | 461 | 7663 | 21782704 | 14301 | 46321 | 185336 | 269779 |
| Sep-12 | 10273 | 7412 | 1894 | 438 | 7346 | 17158850 | 13165 | 56821 | 222389 | 308213 |
| Aug-12 | 6319 | 4398 | 1228 | 359 | 5816 | 9304507 | 11155 | 38080 | 136368 | 195891 |
| Jul-12 | 7512 | 5119 | 1435 | 401 | 6454 | 11566155 | 12455 | 44488 | 158705 | 232886 |
| Jun-12 | 6965 | 4756 | 1478 | 380 | 6189 | 9790092 | 11414 | 44354 | 142702 | 208963 |
| May-12 | 6641 | 4333 | 1367 | 385 | 6349 | 10274841 | 11935 | 42394 | 134339 | 205893 |
| Apr-12 | 4988 | 3229 | 1035 | 294 | 4639 | 6906745 | 8839 | 31074 | 96896 | 149647 |
| Mar-12 | 6240 | 4118 | 1203 | 295 | 5219 | 8098258 | 9159 | 37313 | 127688 | 193443 |
| Feb-12 | 6225 | 4122 | 1105 | 308 | 5121 | 7595633 | 8954 | 32070 | 119547 | 180542 |
| Jan-12 | 6825 | 4567 | 1257 | 335 | 5621 | 8220086 | 10391 | 38989 | 141590 | 211595 |
| **Totals** | | | | | | **175748659** | **139659** | **503895** | **1833199** | **2679515** |

පහත දැක්වෙන වෙබ් අඩවි 2012 වසරේදී තව දුරටත් සංවර්ධනය කර අන්තර්ජාලය වෙත සම්බන්ධ කර ඇත.

### (අ) ලියාපදිංචි හා ප්‍රතීතන වෙබ් අඩවිය

මෙම වෙබ් අඩවිය මගින් ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ සියලුම තොරතුරු ලබාගැනීමට හැකිය. තවද මෙම වෙබ් අඩවියේ ලියාපදිංචි ආයතන හා කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු, *තත්ත්ව කළමණාකරණ පද්ධතිය පිළිබඳ තොරතුරු*, ලියාපදිංචි ඉල්ලුම්පත්, ලියාපදිංචිය අලුත්කිරිමේ ඉල්ලුම්පත්, පාඨමාලා ප්‍රතීතන අයදුම්පත් ආදිය අඩංගු කර ඇත.


මෙම වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ




**සජීවී ලියාපදිංචි හා ප්‍රතීතන තොරතුරු වෙබ් පහසුකම**

මෙම පහසුකම මගින් ලියාපදිංචි වි ඇති ආයතන හා ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ පරීක්ෂා කල හැකි අතර එමගින් ඕනෑම අයෙකුට පහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව තොරතුරු සොයාගත හැකිය.

1. පළාත් සහ ක්ෂේත්‍ර අනුව ආයතන
2. පළාත් සහ හිමිකාරත්වය අනුව ආයතන
3. පළාත් නම හෝ නමින් කොටසක් මගින් ආයතන
4. පාඨමාලා නම සහ දිස්ත්‍රික්ක අනුව ආයතන





**(ආ) සැලසුම් හා පර්යේෂණ වෙබ් අඩවිය.**

සැලසුම් හා පර්යේෂණ වෙබ් අඩවියේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් ප්‍රතිපත්ති, ආයතනික සැලසුම, වාර්ෂික සැලසුම්, වෘත්තීය පුහුණු සැලසුම් සහ මූල්‍ය ආධාර පිළිබඳ විස්තර ආදිය ඇතුලත් කොට ඇත. පර්යේෂණ කවය සඳහා වෙනම වෙබ් අඩවියක් ස්ථාපිත කර ඇති අතර එහි පර්යේෂණ කවයේ පරමාර්ථ, පර්යේෂණ කවය ස්ථාපිත කිරීම, පර්යේෂණ වර්ග සහ වෙනත් පර්යේෂණ වල ප්‍රගතිය ඇතුලත් වේ. පර්යේෂණ සඳහා උනන්දුවක් දක්වන කණ්ඩායම් වලට පර්යේෂණ වල ප්‍රගතිය සහ ඒ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ය.

සැලසුම් හා පර්යේෂණ වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ



තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මෙම වෙබ් අඩවියට ඇතුල් වන අයගේ සමීක්ෂණයක් කරන ලද අතර 2012වසරේ දී ද 20,000 වැඩි පිරිසක් *මාසිකව,* දේශියව හා ජාත්‍යාන්තරව මෙම පර්යේෂන වෙබ් අඩවිය ප්‍රයෝජනයට ගෙන ඇත.




**(ඇ) තොරතුරු පද්ධති අංශයේ වෙබ් අඩවිය**

තොරතුරු පද්ධති අංශය එම අංශයේ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා මෙම වෙබ අඩවිය 2012 වසරේ දී සංවර්ධනය කර පවත්වා ගෙන යන ලදී .

මෙම වෙබ අඩවියට e Library , Intranet ආදී පහසුකම් ඇතුලත් වේ .

මෙම වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



ඉහත තොරතුරු වලට අමතරව තොරතුරු පද්ධති අංශය 2012 වසරේ දී පහත දැක්වෙන දත්ත සමුදායන් සංවර්ධනය කර පවත්වාගෙන ගොස් ඇත.


- ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ප්‍රතීතනය කල පාඨමාලා
- ජාතික වෘත්තීය සුදුසුකම් ලාභීන්ගේ තොරතුරු
- පුවත් පත් දැන්වීම් සමීක්ෂණ තොරතුරු

තවද තොරතුරු පද්ධති අංශය අභ්‍යන්තර පරිගණක ජාලය, අන්තර් ජාල හා ඉලෙක්ට්‍රෝනික තැපැල් පද්ධති, පරිගණක ජාල පිවිසුම් බාධක ආදිය ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා 2012 වසර තුල පවත්වා ගෙන ගොස් ඇත.

### 8.2.4 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන / පුහුණු මාර්ගෝපදේශය (TVET Guide)

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු ප්‍රකාශයට අමතරව 2012 වර්ෂය සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳ මගපෙන්වීමේ ප්‍රකාශනය (TVET GUIDE 2013) 2012 වසර තුලදී ද ප්‍රකාශයට පත් කරන ලදි. මෙම TVET GUIDE ප්‍රකාශනය පලාත් මට්ටමින් ආයතන අනුව හා අධ්‍යාපන ක්ෂෙත්‍ර අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු පාඨමාලා විස්තර, පාඨමාලා බඳවා ගැනීමේ සුදුසුකම් ආදි විස්තර, පාඨමාලා ගාස්තු, ලියාපදිංචි පුහුණු ආයතන පිළිබඳ විස්තර හා ප්‍රතීතනය කල පාඨමාලා පිළිබඳ විස්තර එහි ඇතුලත් කර ඇත. පලාත් මට්ටමින් එක් එක් ආයතනවල පාඨමාලා හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් අනුව වර්ග කර දක්වා ඇත.

TVET GUIDE, 2013 හි අනුරුවක් පහත දැක්වේ



මීට අමතරව TVET Guide ප්‍රකාශනය CD තැටියක් ලෙස භාෂා තුනෙන් යුක්තව පිළියෙල කර ඇත. එහි අනුරුවක් පහත දැක්වේ.




මෙම ප්‍රකාශනය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කර ඇති අතර

1. පුහුණු පාඨමාලා, පලාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර
2. පුහුණු පාඨමාලා, පලාත් සහ අධ්‍යාපන සුදුසුකම්
3. පුහුණු පාඨමාලා, පලාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර හා පුහුණු ආයතන අනුව තොරතුරු ලබා ගත හැක

අනුරුවක් පහත දැක්වේ.



### 8.2.5 TVEC පුවත් ලිපිය

2012 වසර තුල දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් TVEC පුවත් ලිපි (TVEC Newsletters) දෙකක් ප්‍රකාශයට පත් කර සියලුම ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් අතරේ නොමිලයේ බෙදාහරින ලදි.

එම පුවත් ලිපි දෙකෙහි අනුරූ පහත දැක්වේ







### 8.2.6 කොමිෂන් සභාවේ පුස්තකාලය

කොමිෂන් සභාවේ පුස්තකාලය තොරතුරු පද්ධති අංශය මගින් පාලනය වේ. පුස්තකාලය මගින් දෙස් විදෙස් විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රවල නියුතු විවිධ තරාතිරම් වලට අයත් පර්යේෂකයන් විද්වතුන් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පුද්ගලයන්ට පුස්තකාල පහසුකම් සලසා ඇත. ඒ අනුව, පුස්තකාලය මගින් පහත සඳහන් සේවාවන් ලබාදීම සිදු වේ.

- වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට අදාල පොත්පත් පර්යේෂණ වාර්තා සැපයිම.
- කොමිෂන් සභාවේ ප්‍රකාශන පාලනය හා බෙදා හැරීම.
- වාර සඟරා පරිහරණයට ඉඩකඩ සැලසීම.
- දිනපතා පුවත්පත් පරිහරණයට ඉඩ සැලසීම හා අනෙකුත් ප්‍රලේඛන කාර්යයන්
- වෙනත් පරිශීලන පහසුකම්


**2006 සිට 2012 වසර දක්වා පුස්තකාලයට පොත් පත් මිලදී ගැනීම පිළිබඳ විස්තර පහත දැක්වේ**

| වර්ෂය | වටිනාකම (රුපියල්) |
|---|---|
| 2006 | 99,513 |
| 2007 | 150,000 |
| 2008 | 195,000 |
| 2009 | 99,288 |
| 2010 | 50,000 |
| 2011 | 25,000 |
| 2012 | 50,000 |

ඊට අමතරව කොමිෂන් සභාවේ පුස්තකාලයේ නොමැති එහෙත් උනන්දුවක් දක්වන පාඨකයන් හට අන්තර් පුස්තකාල පිරුළු සේවාව මගින් අවශ්‍ය පුස්තකාල තොරතුරු සේවාව සපයා ඇත. කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටුකරනු වස් පසුගිය වසර තුල වෙනත් පුස්තකාල මගින් තොරතුරු සම්පත් හුවමාරු කරගෙන ඇත. බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඇති පුස්තකාලයේ ආයතනික සාමාජිකත්වය ලබාගෙන තිබේ. එමගින් අතිරේක පොතපත පරිශීලනය කිරීම පහසු කර ඇති අතර අන්තර්ජාතික දැනුම පාඨකයන්ට ලබා දීමට පුස්තකාලය කටයුතු කර ඇත.

2011 වසරේ සිට ඉලෙක්ට්‍රොනික පුස්තකාල පද්ධතියක් හඳුන්වා දි එහි දත්ත ගබඩාවට පුස්තකාලයේ සියලුම ප්‍රකාශන ඇතුලත් කර ඇති අතර වෙනත් තැනක සිට වුව ද එහි ඇති පොත් හා ප්‍රකාශන මොනවා ද යන්න පාඨක පිරිසට අන්තර්ජාලය ඔස්සේ සජීවීව බලා දැන ගත හැකි ය. මෙම නව සංකල්පය ඉලෙක්ට්‍රොනික පුස්තකාල ව්‍යාපෘතිය (eLibrary) යටතේ කොමිෂන් සභාවේ අනුමැතිය අනුව ක්‍රියාත්මක කරන ලදි. 2011 වර්ෂයේ පටන් libsys නැමැති පුස්තකාල මෘදුකාංගය පුස්තකාලයේ භාවිතා වේ. එමගින් පුස්තකාල පාඨකයන්ට වැඩි පහසුකම් හා සේවාවන් සැලසීමට කටයුතු කර ඇත.

libsys නැමැති පුස්තකාල මෘදුකාංගයේ අනුරුවක් පහත දැක්වේ




### 8.2.7 භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS)

භූගෝලීය තොරතුරු පද්ධතියත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ස්ථාපනය *කර පවත්වාගෙන යනු ලැබේ.*

මෙම භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ ඇති වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ නියැලි සෑම ආයතනයක් පිළිබඳව ම ඒවායේ භූගෝලීය වශයෙන් පිහිටීම දුර ආදී තොරතුරු විනිවිදව දැනගත හැකි වන පරිදි ලබාදීම අපේක්ෂිතය.

මෙම භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් අන්තර් ජාලය හරහා අදාල එක් එක් ආයතන ගැන තොරතුරු දැන ගැනීමේ පහසුකම්ද සැලසීමට අවධානය යොමුවී ඇත. ඒ අනුව තමන්ට අවශ්‍ය තොරතුරු යාවත්කාලීනව කලට වේලාවට ලබාගත හැකිය. මෙම භූගෝලීය තොරතුරු පද්ධතිය සඳහා විවෘත මෘදුකාංග තෝරා ගෙන ඇති අතර එම නිසා විශේෂයෙන්ම වැඩි පිරිවැයකින් තොරව භූගෝලීය තොරතුරු මෘදුකාංග සේවාව ස්ථාපනය කර ඇත. මෙම තොරතුරු සේවාවේ ආරම්භක පියවරක් වශයෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටි සබරගමුව පළාත් සහ උතුරු මැද පළාතේ ඇති වෘත්තීය පුහුණු ආයතන උපදේශකයින්ගේ උපදෙස් පරිදි *GSP* ඛණ්ඩාංක ගැනීම සිදු කරන ලදි. එසේම 2012 වර්ෂයේදි දකුණු පළාත, උතුරු මැද පළාත සහ නැගෙනහිර පළාත සම්පූර්ණ කරන ලද අතර මෙම කාර්යය පළාත් මට්ටමින් වර්ෂ 2014 දක්වාම නොකඩවා පවත්වාගෙන යනු ඇත.


Geographical Information System
Tertiary and Vocational Education Commission
Search
User Guide
VOCATIONAL CENTRE PATH FINDER
ADVANCE SEARCH
- Select Your Industry Sector -
- Select Type of Institution -
- Select Your Province -
- Select Your District -
Find Institute
No Location Found
Map
Satellite
Advance Mapping

# 9.0 ජාත්‍යන්තර සහයෝගිතාවය

**වෘත්තිය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයෙහි ජාත්‍යන්තර සහයෝගීතාවය ශක්තිමත් කිරීම.**

**යුනෙස්කෝ යුනිවොක් සම්බන්ධතා ජාලය**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජර්මනියේ බොන් වල පිහිටි යුනෙස්කෝ සංවිධානයට අනුබද්ධිත යුනිවොක් ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරී ශාඛාවක් පිහිටුවා ඇත. කොමිෂන් සභාව 2012 වර්ෂයේදී ලොව ප්‍රධාන අවධානයට යොමු වූ රටක් වූ චීනයේ ෂැංහායි (Shanghai) හිදි පැවැත්වූ යුනෙස්කෝ ආයතනයට අනුබද්ධිත යුනිවොක් සමුළුවට සහභාගි විය. මෙම සමුළුවට ආසියාවේ අනෙකුත් රාජ්‍යන් වල ඉහල සහභාගිත්වයක් ලැබුණි. මෙම සමුළුව ආසියානු රටවල් අතර සම්බන්ධතාවයක් නැංවීමට මෙන්ම අදහස් උදහස් හුවමාරු කර ගැනීමට කදිම අවස්ථාවක් හා ශක්තියක් විය. එපමණක් නොව මීට පෙර අවස්ථා වලදී ද රැස්වීම් සංවිධානය කරන ලද සම්බන්ධිකරණ නියෝජිතයන් හා ආයතන ද මෙම සමුළුවට සහභාගි වීම විශේෂත්වයක් විය. මේ සමුළුවේදී ශ්‍රී ලංකාවේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කලාපීය යුනිවොක් උප සම්බන්ධතා මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපනය කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකාවේ යුනිවොක් උප මධ්‍යස්ථානයක් ලෙස තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව නම් කල අතර ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ඉරානය යන රටවල යුනිවොක් සම්බන්ධිකරණ උප කාර්යාලයක් ලෙස තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව තෝරා පත් කර ගන්නා ලදී.

**2012 වර්ෂයේදී කොමිෂන් සභාව කලාපීය සහයෝගිතාවය දැක්වීම.**

**පාකිස්ථානය**

පාකිස්ථානයේ යුනිවොක් කාර්යාලය මගින් කරන ලද ඉල්ලීමකට අනුව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය හා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව වෘත්තිය හා කාර්මික අධ්‍යපන පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රවීණතා ඇති විශේෂඥයන්ගේ සේවාව තව දුරටත් පාකිස්ථානයට ලබා දි ඇත. ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා කොමිෂන් සභාවේ සම්පත් හා සේවාවන් ද ලබා දෙන ලදි. මෙම විශේෂඥ සේවාව හුවමාරු කර ගැනිමට අමතරව පාකිස්ථානයෙන් නිලධාරි කණ්ඩායම් කිහිපයක් ශ්‍රී ලංකාවේ වෘත්තිය හා කාර්මික අධ්‍යපන පුහුණු ක්ෂේත්‍රය අධ්‍යයන කිරිම සඳහා පැමිණීම සිදුවිය. මේ අතර ශ්‍රී ලංකාවේ හා පාකිස්ථානයේ විෂය ක්ෂේත්‍රයන්හි දැනුම හුවමාරු කර ගනිමින් නිපුණතා සම්මත හා විෂයමාලා සංවර්ධනය කිරිම කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් සිදුවිය. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය හා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව දෙරට අතර සහයෝගීතාවය ඇතිව 2006 දි හා 2008 වර්ෂ වලදි කරන ලද දැනුම් හුවමාරුව මගින් දෙරටහි සහයෝගිතාව ශක්තිමත් වි ඇති බවද විශේෂත්වයකි.

**භූතානය**

භූතානය විසින් ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් පද්ධතිය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් කරන ලදි. ඒ සඳහා අධ්‍යයන චාරිකා කිහිපයකදී ශ්‍රී ලංකාවට භූතානයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් නිලධාරීන් පැමිණ ඇත. භූතාන රජයේ ඉල්ලීමක් මත ශ්‍රී ලංකාව භූතානයට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳව හා එහි විෂය මාලා සංවර්ධනය සහ පුහුණු තාක්ෂණය පිළිබඳ වෘත්තීය හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේදී න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදි එම වැඩ සටහනේ කොටසක් ලෙස තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වෘත්තීය හ තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තත්ත්ව සහතික ක්‍රියාවලි පද්ධතිය පිළිබඳව භූතානයෙන් පැමිණි මෙම අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් නිලධාරීන්ට සති දෙකක වැඩසටහනක් පවත්වන ලදි. ඊට අමතරව ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් සංවර්ධනය කිරීම හා නිපුණතා පාදක ඇගයීම පළිබඳ හඳුන්වාදීමේ වැඩසටහනක්ද භූතානයෙන් පැමිණි තවත් රාජ්‍ය නිලධාරීන් කණ්ඩායමක් වෙත අමාත්‍යාංශය හා කොමිෂන් සභාව එක්ව 2012 ජනවාරි 9 සිට 20 දක්වා සති දෙකක පුහුණු පාඨමාලාවක් පවත්වන ලදි.



**නේපාලය**

නේපාලය විසින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් අඛණ්ඩව ක්‍රියාත්මක කරවීමේ නියාමන හා ක්‍රියාකාරී ආයතනයක් ලෙස හැඳිනගෙන තිබේ. එබැවින් ශ්‍රී ලංකාවේ වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා නේපාලයේ රාජ්‍ය අංශයේ උසස් නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත්

කණ්ඩායමක් 2012 ජුනි මාසයේදි ලංකාවට පැමිණියේය. මෙම කණ්ඩායම සඳහා පුහුණු සැසි හා නේවාසිකාගාර ආදි සියලු පහසුකම් කොමිෂන් සභාව විසින් සලස්වන ලදි. ඊට අමතරව ශ්‍රී ලංකාවේ වෘත්තිය හා කාර්මික අධ්‍යපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හමුවීමෙන් දැණුම හා අත්දැකීම් හුවමාරුකර ගැනිමට අධ්‍යයන සැසිවාර කිහිපයක්ම පවත්වන ලදි.



**ඇෆ්ගනිස්ථානය**

ඇෆ්ගනිස්ථානයේ කාබුල් අගනුවර යුනෙස්කෝ ආයතනයේ කාර්යාලයේ ඉල්ලීමක් මත තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව ඇෆ්ගනිස්ථානු නියෝජිතයන් පිරිසකට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන චාරිකාවක් හා ශ්‍රී ලංකාවේ වෘත්තිය හා කාර්මික අධ්‍යාපනය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව වැඩසටහන් මාලාවක් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරන ලදි.

මෙම අධ්‍යයන චාරිකාව 2012 නොවැම්බර් මස 08 සිට නොවැම්බර් 14 දින දක්වා පැවතුනි. මෙම අධ්‍යාපන චාරිකාව ඇෆ්ගනිස්ථානයේ අධ්‍යාපනික හා නිපුණතා ප්‍රතිපත්ති ආයතනයේ(CESP) නියෝජිතයින් කණ්ඩායමක් සඳහා කාබුල් නුවර යුනෙස්කෝ යුනිවොක් කාර්යාලයේ වෘත්තිය අධ්‍යාපන හා පුහුණු අංශයේ හා යුනෙස්කෝ ප්‍රධාන කාර්යාලයේ සහයෝගය ඇතිව සංවිධානය කරන ලදි.

මෙම අධ්‍යයන චාරිකාව ඇෆ්ගනිස්ථානයේ වෘත්තිය අධ්‍යාපනය හා කාර්මික අධ්‍යාපන පුහුණුව සපයන ආයතනවල තත්වය සංවර්ධනය කර ගැනීමේ අරමුණින් යුක්තව සංවිධානය කරන ලදි. මෙහිදි විධිමත් හා අවිධිමත් අංශයේ වෘත්තිය හා කාර්මික අධ්‍යාපන පුහුණු අංශයේ එක ලෙස වර්ධනයක් බලාපොරොත්තු විය. මෙම අධ්‍යයන චාරිකාව සඳහා සහභාගි වු දූත පිරිස ඇෆ්ගනිස්ථානයේ වෘත්තිය හා කාර්මික අධ්‍යාපන පුහුණු අංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා ඇතුලු 6 දෙනෙකුගෙන් සමන්විත විය.

මෙම දූත පිරිසට බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 02/11/2012 සිට 08/11/2012 දක්වා පැවති නව නිපැයුම් හා නිපුණතා ප්‍රදර්ශනය නැරඹීමට අවස්ථාවක් සලසා දුන් අතර ශ්‍රී ලංකාවේ වෘත්තිය අධ්‍යාපන හා පුහුණු ආයතන නැරඹීමට යාම වැනි වැඩසටහන් කිහිපයකට සහභාගී වීමේ අවස්ථාව උදාකර දෙන ලදි. මෙවැනි වැඩසටහන් තුලින් ශ්‍රී ලංකාවේ කලාපීය සහයෝගීතාවය වඩා සංවර්ධනය වීම හා ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, පාකිස්ථානය, ඇෆ්ගනිස්ථානය, භූතානය සහ මාලදිවයින වැනි රටවල් අතර ශ්‍රී ලංකාව විශේෂ ඇගයීමකට පාත්‍ර වී තිබීම විශේෂ ලක්ෂණයකි.



**2012 වර්ෂයේ දි කලාපීය සහයෝගීතාවය තුලින් තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව හරහා ශ්‍රී ලංකාවට ලැබුනු ප්‍රධාන**

**සිංගප්පූරුව**

සිංගප්පූරුවේ තෙමසක් පදනම, නැන්යැන් පොලිටෙක්නික් ආයතනය සහ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව හා එක්ව වෘත්තිය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලය 670 කට පමණ සිංගප්පූරුවේ දි හා ශ්‍රී ලංකාවේ දි දැනුම ලබා දි ඇත. ජාත්‍යන්තර නැන්යැන් පොලිටෙක්නික් ආයතනය මගින් ප්‍රධාන පුහුණු කරුවන් 160 කට සිංගප්පූරුවේදි පුහුණුව ලබා දිමට මෙම වැඩසටහන යටතේ අවස්ථාව සැලසුනි. මෙම පුහුණු වැඩසටහන මගින් විදුලි කාර්මික, ඉලෙක්ට්‍රොනික්, මෙකාට්‍රොනික් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණුව 2012 වර්ෂයේ දි ලබා දි ඇත. මෙම කාර්ය මණ්ඩල සංවර්ධන කිරිමේ වැඩ සටහන යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව එක්ව සංවිධානය කරන ලදි. මේ සඳහා මූල්‍ය සහයෝගය සිංගප්පූරුවේ තෙමසෙක් පදනම මගින් ලබා දුන් අතර එම පදනම මානව හිතවාදි පරාර්ථකාමි චේතනාවෙන් කටයුතු කරන

ආයතනයකි. එබැවින් මෙම ආයතනය ආසියාවේ අධ්‍යාපන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් හදිසි ආපදා තත්ව වලදි සහන සලසාදිම ආදිය සඳහා දායකත්වය ලබා දි ඇත.
මෙම පුහුණු වැඩසටහනේ ප්‍රධාන අභිප්‍රාය වූයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය නගා සිටුවීම සඳහා වෘත්තිය පුහුණු පාඨමාලා පවත්වන උපදේශකයන් වෙනුවෙන් වඩාත් ශක්තිමත් හැකියාවක් ඇති කිරිමය. එසේ දැනුමෙන් ශක්තිමත් වෘත්තිකයින් පිරිසක් බිහිකිරිමෙන් ඵලදායි රැකියා අවස්ථා ලබා දිම හා ඩිප්ලෝමා පාඨමාලා දක්වා ජාතික වෘත්තිය සුදුසුකම් යටතේ ශක්තිමත් කිරිමටද මෙම පුහුණු වැඩසටහන මගින් බලාපොරොත්තු විය.

**සිංගප්පූරුව තෙමසක් පදනම සහ ITE අධ්‍යාපනික සේවාවන් මගින් සිදුකල ප්‍රධානයන්**

2012 වසරේ සිංගප්පූරුවේ තෙමසක් පදනමේ හා ITE අධ්‍යාපනික සේවා අංශය මගින් වෘත්තිය අධ්‍යාපන ශික්ෂන විද්‍යාව හෙවත් පුහුණු ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහනක් වෘත්තිය හා කාර්මික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවිණයන්ට ලබා දිමට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා මූල්‍ය දායකත්වය සිංගප්පූරුවේ තෙමසක් පදනම් ආයතනය විසින් දරණ ලදි. වර්තමානයේ ඇති අභියෝග අවබෝධකරගෙන කර ගෙන ශ්‍රී ලංකාවේ පුහුණු කිරිමේ වැඩසටහන අරඹන ලදි. මේ සඳහා සිංගප්පූරුවේ හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුගහය යටතේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව සහයෝගිතා ව්‍යාපෘතියක් වශයෙන් මෙම වෘත්තිය හා කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු කරුවන් පුහුණුකිරිම් අරඹන ලදි. මෙම වැඩසටහන මගින් 2012 වර්ෂයේ දි වෘත්තිය හා කාර්මික අධ්‍යාපන පුහුණුකරුවන් 120 දෙනෙකු සඳහා කණ්ඩායම් වශයෙන් ශ්‍රී ලංකාවේ වෘත්තිය හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේදි හා සිංගප්පූරුවේ ITE ආයතනයේදි පුහුණුව ලබා දීම අරඹන ලදි.
මෙම ප්‍රධාන පුහුණු ක්‍රමවේදයට සහභාගි වූ ප්‍රධාන පුහුණුකරුවන් 120 දෙනෙකු ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පුහුණු ආයතන වල තමන්ගේ එක් එක් සේවා ස්ථාන වල පුහුණුකරුවන් පුහුණුකිරිමේ වැඩසටහන යටතේ අඩුමතරමේ තවත් පුහුණු කරුවන් 600 ක් පමණ පුහුණු කිරිම අපේක්ෂා කෙරේ.



**නෙදර්ලන්තය**

යුනෙස්කෝ ආයතනයේ තෙවැනි සම්මේලනය 2012 දී චීනයේදි පැවැත්වුනු අතර එහිදි නෙදර්ලන්තයේ CINOP ආයතනය සමග සාකච්ඡාවලින් පසු ඇතිකරගත් සහයෝගීත්වය හරහා වෘත්තිය මාර්ගෝපදේශය හා උපදේශනය පිළිබඳ හා පෙර දැනිම හැදින ගැනිම තුලින් ජාතික වෘත්තිය සුදුසුකම් ලබා දිම පිළිබඳව අමාත්‍යංශයේ සහයෝගිතාවය ඇතිව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ව්‍යාපෘතියක් ලෙස නෙදර්ලන්ත රජය වෙත ඉදිරිපත් කරන ලදි.

නෙදර්ලන්තයේ වැඩසටහන් නිලධාරිවරියක් අමාත්‍යංශයට හා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවට මෙම ව්‍යාපෘති වාර්ථාව හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අධ්‍යයනය කිරිම හා නිර්දේශනය කරනු වස් ශ්‍රී ලංකාවට පැමිණි අතර එමගින් අන්තර්ජාතික සහයෝගීතාවය වර්ධනය කරගැනීම අපේක්ෂා කරන ලදී.



## 10. විශේෂ වැඩසටහන්

### පුහුණු ආයතනවල තත්ත්ව පරීක්ෂාව.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික පුහුණු ආයතනවල විශේෂ විමර්ශනයක් කිරීමට තිරණය කර එම විශේෂ විමර්ශනය සිදුකිරිමේ වගකීම කොමිෂන් සභාව වෙත පවරන ලදි. කොමිෂන් සභාව විසින් 2012 පෙබරවාරි හා මාර්තු යන මාසවල මෙම විශ්ලේෂණය දිවයින පුරා පිහිටි අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල සිදුකරන ලදි.ඒ අනුව පහත සඳහන් ආයතනවල පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාවන් විශ්ලේෂණයට භාජනය කර ඇත.

| ආයතනයේ නම | පුහුණු ආයතන සංඛ්‍යාව |
|---|---|
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 38 |
| ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය | 54 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරීය | 248 |
| ජාතික තරුණ සේවා සභාව | 42 |
| එකතුව | 382 |

මෙම මධ්‍යස්ථාන 382 තුල පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව 2069ක් අධීක්ෂණයට ලක් කරන ලදි. මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශයට ලබා දී ඇත.

### අනාගතය දකිමු (Touch Your Future)වැඩසටහන

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය තම අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු ආයතන වලින් පුහුණුව ලබා ඇති ශිෂ්‍යයන්ගෙන් ඒ ඒ විෂයන් සඳහා දක්ෂම නිපුණ යොවුන් ශිල්පයා තේරුමේ තරඟයක් පැවැත්වීමට තිරණය කරන ලද අතර එම වැඩසටහන මෙහෙයවීම තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට පවරන ලදි. ඒ අනුව කොමිෂන් සභාව අමාත්‍යාංශය වෙනුවෙන් පහත කාර්යය ඉටු කරන ලදි.

මෙම නිපුණතා තරඟය වෘත්තීන් 18 ක් සම්බන්ධ කොටගෙන මූලික හා අවසන් ලෙස අදියර දෙකකින් සිදු කරන ලදි. කාර්මික හා අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයෙහි සේවය කරන අය මෙන්ම ඉන් පිටත පිහිටි විශ්ව විද්‍යාලයන්හි හා කර්මාන්තයේ නියුතු එම වෘත්තීය ක්ෂේත්‍රයෙහි දැනුමක් හා හසල අත්දැකිම් ඇති සම්පත් දායකයින් තෝරා ඒ ඒ වෘත්තීන් සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම භාර කරන ලදි. වෘත්තීය ක්ෂේත්‍ර 18 කට අදාලව මෙවැනි ප්‍රශ්න පත්‍ර 36ක් සකසන ලදි. සකසන ලද එම ප්‍රශ්න පත්‍ර වලංගු කරලීමේ කමිටු පත් කර ඒ අනුසාරයෙන් වලංගු කරන ලදි. මෙම පරීක්ෂණයන් පුහුණු මධ්‍යස්ථාන වලින් පවත්වන ලද අතර ඒ සඳහා විනිශ්චය මණ්ඩලයක් පත් කිරීම හා පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් අදාල පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධිකරණය කිරීම අප ඒකකයෙන් සිදු කරන ලදි. තෝරා ගන්නා ලද ජයග්‍රාහකයින් හට සහතික හා සම්මාන ප්‍රදාන උත්සවය පසුගිය වසරේ නොවැම්බර් මස බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී සිදු කරන ලදි.

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය**

| | සටහන් | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 01 | 57,985,658 | 73,063,385 |
| ව්‍යාපෘති ප්‍රදාන | 02 | 8,054,613 | 3,488,544 |
| ඉපයූ මෙහෙයුම් ආදායම් | 03 | 4,270,572 | 3,469,182 |
| මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම් | | 224,617 | 280,968 |
| ඉපයූ මෙහෙයුම් නොවන ආදායම් | 04 | 99,790 | 20,808 |
| | | 70,635,250 | 80,322,887 |
| සේවක ණය පොලී ආදායම් | 05 | 242,444 | 208,929 |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | | | |
| | | 70,877,694 | 80,531,816 |
| කල් දැමූ ආදායම් | | 12,333,184 | 5,261,473 |
| | | 83,210,878 | 85,793,289 |
| **වියදම්** | | | |
| පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දීමනා | 06 | 584,793 | 415,648 |
| පුද්ගලික පාරිශ්‍රමික | 07 | 29,601,196 | 24,537,957 |
| ගමන් වියදම් | 08 | 855,484 | 651,940 |
| සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය | 09 | 5,535,425 | 4,025,722 |
| නඩත්තු වියදම් | 10 | 2,998,041 | 1,722,416 |
| පුනරුත්තාපන වියදම් | 11 | 1,942,699 | 1,855,908 |
| ගිවිසුම්ගත සේවා | 12 | 6,434,387 | 6,902,099 |
| මෙහෙයුම් වියදම් | 13 | 13,375,560 | 35,547,196 |
| | | 61,327,585 | 75,658,886 |
| ව්‍යාපෘති වියදම් | 14 | 8,054,613 | 3,297,127 |

| | | | |
|---|---|---|---|
| | | 69,382,198 | 78,956,013 |
| වර්ෂය සඳහා ක්ෂය | 15 | 12,333,184 | 5,261,473 |
| | | 81,715,382 | 84,217,486 |
| වෙන්කිරීම්වලට පෙර ශුද්ධ අතිරික්තය/ඌණතාවය | | 1,495,496 | 1,575,803 |
| | | | - |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 1,440,279 | 1,176,759 |
| | | 83,155,661 | 85,394,245 |
| වෙන්කිරීම්වලට පසු ශුද්ධ අතිරික්තය/ඌණතාවය | | 55,217 | 399,044 |

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ජී.එස්.අමරසිංහ**
නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂිකා

**ආචාර්යය එස්.ඩී.ආර්. පෙරේරා**
අධ්‍යක්ෂ ජනරාල්

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**
**2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය**

| | සටහන් | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ශුද්ධ ස්පෘශ්‍ය වත්කම් | 15 | 43,715,697 | 18,343,062 |
| **ජංගම වත්කම්** | | | |
| තැන්පත් සහ ලැබීම් | 16 | 6,883,527 | 5,451,372 |
| ණයගැතියෝ | 17 | 1,996,281 | 783,529 |
| ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත් | 18 | 493,539 | 654,890 |
| මුදල් හා මුදල් සමකය | 19 | 6,934,823 | 8,911,362 |
| | | 16,308,170 | 15,801,152 |
| **මුළු වත්කම්** | | **60,023,867** | **34,144,214** |
| **හිමිකම හා වගකීම්** | | | |
| සමුච්චිත අරමුදල | | 175,452 | 175,452 |
| මෙහෙයුම් සංචිත | 20 | 3,862,963 | 5,672,262 |
| | | 4,038,415 | 5,847,714 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| කල් දැමූ ආදායම් | 21 | 43,715,697 | 18,343,062 |
| පාරිතෝෂික ප්‍රතිපාදන (උප ලේඛන -01) | | 6,557,426 | 5,479,389 |
| | | 50,273,123 | 23,822,451 |
| | | 54,311,538 | 29,670,165 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | 22 | 2,098,032 | 2,144,372 |
| ගෙවිය යුතු | 23 | 3,614,297 | 2,329,677 |
| | | 5,712,329 | 4,474,049 |
| **මුළු වගකීම්** | | **60,023,867** | **34,144,214** |

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදි.

**ජ්.එස්.අමරසිංහ**
නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂිකා

**ආචාර්යය එස්.ඩී.ආර්. පෙරේරා**
අධ්‍යක්ෂ ජනරාල්

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**
**2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය**

| | සමුච්චිත අරමුදල රු. | මෙහෙයුම් සංචිත රු. | **එකතුව** රු. |
|---|---|---|---|
| 2011.01.01 දිනට ශේෂය | 175,452 | 5,274,685 | 5,450,137 |
| ප්‍රාග්ධන ප්‍රදාන | | - | |
| වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය | | 399,044 | 399,044 |
| පෙර වර්ෂ ගැලපුම් | | (1,467) | (1,467) |
| 2012.01.01 දිනට ශේෂය | 175,452 | 5,672,262 | 5,847,714 |
| මහා භාණ්ඩාගාරයට මාරුකිරීම් | | (1,500,000) | (1,500,000) |
| පෙර වර්ෂ ගැලපුම් | | (364,519) | (364,519) |
| ආරම්භක ශේෂ ගැලපුම | | 3 | 3 |
| වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය | | 55,217 | 55,217 |
| 2012.12.31 දිනට ශේෂය | 175,452 | 3,862,963 | 4,038,415 |

## තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව
## 2012.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2012 රු. | 2011 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය | 55,217 | 399,044 |
| වත්කම් විකුණුම් ලාභය | | |
| **මූල්‍ය නොවන සිද්ධීන්** | | |
| පෙර වර්ෂ ගැලපීම් | (364,519) | (1,467) |
| ක්ෂය කිරීම් | 12,333,184 | 5,261,473 |
| ආරම්භක ශේෂ වෙනස ගැලපිම් | 3 | |
| පාරිතෝෂික වෙන් කිරීම් | 1,440,279 | 1,176,759 |
| කල්දැමූ ආදායම | 25,372,633 | 1,205,566 |
| කල්දැමූ ආදායම ගැලපුම | | (1,818,761) |
| | 38,836,797 | 6,222,614 |
| පොලී ආදායම් | 242,444 | 208,929 |
| පාරිතෝෂික ගෙවීම් | 362,242 | |
| **කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 38,232,111 | 6,013,685 |
| ණයගැතියෝ (අඩුවීම/වැඩිවීම) | (1,432,154) | (609,908) |
| තැන්පත් සහ ලැබීම් (අඩුවීම/වැඩිවීම) | (1,212,752) | 194,182 |
| ඉතිරි තොගය (අඩුවීම/වැඩිවීම) | 161,351 | (545,182) |
| ණයහිමියෝ (අඩුවීම/වැඩිවීම) | (46,340) | 402,238 |
| ගොඩනැගිලි | 41 | 41 | 41 | **100** |
| පිරියත හා උපකරණ | 1,148 | 1,148 | 1,148 | **100** |
| වාහන | 760 | 760 | 754 | **99** |
| | 1,949 | 1,949 | 1,943 | |
| **ප්‍රාග්ධන වියදම්(සංවර්ධන)** | | | | |
| වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරිම | 1,450 | 1,450 | 1,447 | **100** |
| ජාතික වෘත්තිය සුදුසුකම් | 679 | 679 | 656 | **97** |
| පුද්ගලික ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන | 2,200 | 2,200 | 2,196 | **100** |
| පර්යේෂණ පැවැත්විම | 800 | 800 | 526 | **66** |
| පීඩාවට පත්වූවන් සඳහා මූල්‍ය ප්‍රදාන | 900 | 900 | 799 | **89** |
| පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය | 1,800 | 1,800 | 809 | **45** |
| මෘදුකාංග | 440 | 440 | 440 | **100** |
| දෘඩාංග | 592 | 592 | 592 | **100** |
| | 8,861 | 8,861 | 7,465 | **84** |
| **මුලු ප්‍රාග්ධන වියදම්** | **12,239** | **12,239** | **10,819** | **88** |
| **පුනරාවර්ථන වියදම්** | | | | |
| **පෞද්ගලික පඩි නඩි** | | | | |
| වැටුප් හා වේතන | 20,564 | 23,600 | 23,513 | **100** |
| සභාපති දීමනා | 600 | 600 | 600 | **100** |
| පුහුණු දීමනා | 432 | 1,318 | 1,319 | **100** |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 740 | 673 | 672 | **100** |
| සේවක අර්ථ සාධක අරමුදල | 2,304 | 3,151 | 2,797 | **89** |
| සේවක භාර කාර අරමුදල | 576 | 750 | 700 | **93** |
| පාරිතෝෂික දීමනා | | 362 | 362 | **100** |
| | 25,216 | 30,454 | 29,963 | **98** |
| **ගමන් වියදම්** | | | | |
| දේශීය | 310 | 299 | 297 | **99** |
| විදේශීය | 575 | 558 | 558 | **100** |
| | 885 | 857 | 855 | **100** |
| **සැපයුම් හා පරිභෝජන** | | | | |
| ලිපි ද්‍රව්‍ය මුද්‍රණ හා දැන්වීම් | 3,455 | 3,419 | 3,422 | **100** |

| | | | | |
|---|---|---|---|---|
| ඉන්ධන - ලිහිසි තෙල් | 1,775 | 1,734 | 1,734 | **100** |
| ප්‍රවාහන වියදම් | 10 | 17 | 17 | **100** |
| නිළ ඇඳුම් | 74 | 74 | 74 | **100** |
| පුවත්පත් | 150 | 90 | 101 | **112** |
| වෙනත් සේවා ගාස්තු | 98 | 46 | 59 | **128** |
| සංග්‍රහ වියදම් | 100 | 99 | 118 | **119** |
| ඡායා පිටපත් දීමනා | 12 | 7 | 9 | **129** |
| | 5,674 | 5,486 | 5,534 | |

**නඩත්තු වියදම්**

| | | | | |
|---|---|---|---|---|
| වාහන නඩත්තු වියදම් | 2,438 | 2,447 | 2,431 | **99** |
| යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම් | 160 | 176 | 154 | **88** |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 176 | 177 | 177 | **100** |
| පරිගණක සේවා | 122 | 121 | 121 | |
| යාන්ත්‍රික - විදුලි උපකරණ | 25 | 21 | 15 | |
| ොපාදු නඩත්තු වියදම් | | 76 | 101 | |
| | 2,921 | 3,018 | 2,999 | **99** |

**ගිවිසුම් ගත සේවා**

| | | | | |
|---|---|---|---|---|
| දුරකථන ගාස්තු | 1,600 | 1,652 | 1,572 | **95** |
| තැපැල් වියදම් | 123 | 112 | 111 | **99** |
| විදුලි ගාස්තු | 2,800 | 2,411 | 2,412 | **100** |
| ජල ගාස්තු | 200 | 96 | 96 | **100** |
| වරිපනම් සහ කාර්යාල කුලි | 142 | 142 | 142 | **100** |
| ආරක්ෂක සේවා | 625 | 613 | 624 | **102** |
| පවිත්‍රතා සේවා | 494 | 497 | 487 | **98** |
| විගණන ගාස්තු | 100 | 50 | 220 | **440** |
| නීති හා මුද්දර ගාස්තු | 40 | 37 | 38 | **103** |
| වාර සගරා සාමාජික ගාස්තු | 3 | 3 | 3 | **100** |
| සාමාජික ගාස්තු - දේශීය | 40 | 34 | 34 | **100** |
| සාමාජික ගාස්තු - විදේශීය | 25 | 29 | 29 | **100** |
| කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධන | 200 | 186 | 186 | **100** |
| මාර්ගස්ථ මුදල් රක්ෂණ වාරික | | 12 | 17 | **142** |
| සේවා ගිවිසුම් | 465 | 464 | 464 | **100** |
| | 6,857 | 6,338 | 6,435 | **102** |

| **වැය විෂය** | **ඇස්තමේන්තුව** | **සංශෝධිත ඇස්තමේන්තුව** | **සත්‍ය වියදම** | **රු.000 වියදම රු.1/- ඇස්තමේන්තු %** |
|---|---|---|---|---|
| **මෙහෙයුම් වියදම්** | | | | |
| ඇගයීම් හා ලියාපදිංචිය | 800 | 776 | 791 | **102** |
| ප්‍රතීතන වැඩසටහන් | 2,000 | 2,286 | 2,286 | **100** |
| ජාතික වෘත්තිය සුදුසුකම් වැඩසටහන් | 1,882 | 1,836 | 1,819 | **99** |
| වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම | 1,620 | 1,598 | 1,598 | **100** |

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රම වෙළඳ පොළ ප්‍රකාශය පිළියෙළ කිරිම | 1,695 | 1,493 | 1,512 | **101** |
| තත්ව කළමණාකරණ පද්ධති | 30 | 33 | 33 | **100** |
| මූල්‍ය ප්‍රදාන නැවත ඇගයීම | 200 | 197 | 197 | **100** |
| භාෂා පරිවර්ථන ගාස්තු | 100 | 119 | 136 | **114** |
| තත්ව කළමණාකරණ පද්ධති/එස් 5 වැඩසටහන් | 50 | 17 | 17 | **100** |
| පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දිමනා | 639 | 565 | 585 | **104** |
| | 9,016 | 8,920 | 8,974 | **101** |
| **මුලු පුනරාවර්ථන වියදම්** | 50,569 | 55,073 | 54,760 | **99** |

| | | | | |
|---|---|---|---|---|
| | 558 | 558 | 356 | **64** |
| | 25 | 25 | | **-** |
| | 100,088 | 103,180 | 103,000 | **100** |
| | 900 | 1,200 | 1,194 | **100** |
| | 75 | 75 | 67 | **89** |
| | 50 | 50 | 21 | **42** |
| | 1,025 | 1,325 | 1,282 | **97** |
| | 10 | 10 | 7 | **70** |
| | 1,300 | 1,300 | 1,195 | **92** |
| | 2,200 | 2,308 | 2,230 | **97** |
| | 120 | 120 | 104 | **87** |
| | 360 | 360 | 286 | **79** |
| | 360 | 360 | 340 | **94** |
| | 300 | 300 | 265 | **88** |
| | 40 | 40 | 15 | **38** |
| | 142 | 142 | 142 | **100** |
| | 100 | 100 | 98 | **98** |
| | 130 | 130 | 130 | **100** |
| | 75 | 75 | 58 | **77** |
| | 5,137 | 5,245 | 4,870 | **93** |

**සාමාජික ගාස්තු**

| | | | | |
|---|---|---|---|---|
| දේශීය | 40 | 40 | 20 | **50** |
| විදේශීය | 25 | 25 | 24 | **96** |
| | 65 | 65 | 44 | **68** |
| **සංවර්ධන වැඩසටහන්** | | | | |
| | 900 | 650 | 581 | **89** |
| | 900 | 600 | 477 | **80** |
| | 100 | 100 | 92 | **92** |
| | 75 | 40 | 40 | **100** |
| | 50 | 20 | 14 | **70** |
| | 400 | 400 | 167 | **42** |
| | 430 | 430 | 405 | **94** |
| | 225 | 225 | 217 | **96** |
| | 700 | 700 | 660 | **94** |
| | 1,520 | 1,520 | 1,505 | **99** |
| | 700 | 700 | 693 | **99** |
| | 100 | 100 | 63 | **63** |
| | 250 | 250 | 214 | **86** |
| | 80 | 80 | 72 | **90** |
| | 200 | 484 | 267 | **55** |
| | 6,630 | 6,299 | 5,467 | **87** |
| **වෙනත් පුනරාවර්ථන වියදම්** | | | | |
| කොමිෂන් සභා සාමාජික දීමනා | 150 | 150 | 92 | **61** |
| | 360 | 360 | 174 | **48** |
| | 75 | 75 | 59 | **100** |
| විවිධ වියදම් | 450 | 450 | 450 | **100** |
| | 1,035 | 1,035 | 775 | **75** |
| | **42,200** | **42,200** | **38,523** | **91** |


## මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම


**පුනරාවර්ථන වියදම්**

| | |
|---|---|
| පෞද්ගලික පඩි නඩි | 29,601,196 |
| පාරිතෝෂික ගෙවීම් | 362,000 |
| ගමන් වියදම් | 855,484 |
| සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය | 5,535,425 |
| නඩත්තු වියදම් | 2,998,041 |
| ගිවිසුම් ගත සේවා | 6,434,387 |
| පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දීමනා | 584,793 |
| මෙහෙයුම් වියදම් | 8,389,688 |
| **එකතුව (රු.)** | **54,761,014** |

**ප්‍රාග්ධන වියදම්**

| | |
|---|---|
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 2,444,342 |
| පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය | 1,335,209 |
| පුනරුත්තාපන වියදම් | 1,942,699 |
| රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ප්‍රදාන හා පර්යේෂණ වියදම | 4,441,465 |
| ජාතික වෘත්තිය සුදුසුකම් | 655,850 |
| **එකතුව (රු.)** | **10,819,565** |




## මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම


### රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන


| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන(ප්‍රාග්ධන) | 9,284,625 | 5,565,474 | 6,938,571 | 16,988,909 | 1,446,652 |
| පෞද්ගලික ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන(ප්‍රාග්ධන) | 2,496,171 | 1,647,699 | 806,144 | 4,886,224 | 2,196,298 |
| පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන | | | 858,164 | 1,990,345 | 798,515 |
| **එකතුව** | **11,780,796** | **7,213,173** | **8,602,879** | **23,865,478** | **4,441,465** |



## අයවැය ඇස්තමේන්තු සහ මහා භාණ්ඩාගාර ප්‍රදාන

| | 2009 | | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු | සත්‍ය | ඇස්තමේන්තු | සත්‍ය | ඇස්තමේන්තු | සත්‍ය | ඇස්තමේන්තු | සත්‍ය |
| පුනරාවර්තන ප්‍රදාන | 39,716,000 | 34,739,967 | 42,200,000 | 38,523,832 | 47,370,000 | 46,571,924 | 55,073,712 | 54,761,014 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 13,907,000 | 11,087,344 | 18,000,000 | 12,978,832 | 33,000,000 | 31,292,303 | 12,239,500 | 10,819,565 |
| මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම් | | 541,052 | | 6,865 | | 253,465 | | 224,617 |
| **එකතුව** | 53,623,000 | 46,368,364 | 60,200,000 | 51,509,529 | 80,370,000 | 78,117,692 | 67,313,212 | 65,805,196 |



ජේපි/ඊ/ටීවීඊසී/එෆ්ඒ/12 2013 නොවැම්බර් දින

අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ 10(ඇ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2013 මැයි 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරනයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක

සාවද්‍ය **ප්‍රකාශයන්ගෙන්** තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම **ප්‍රමිති** අපේක්ෂා කරයි. **මූල්‍ය ප්‍රකාශන** වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් **මූල්‍ය ප්‍රකාශන** වල ඇතිවිය හැකි **ප්‍රමාණාත්මක** සාවද්‍ය **ප්‍රකාශයන්ගේ** අවදානම් තක්සේරුකිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්තාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ **මූල්‍ය ප්‍රකාශන** පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් **ප්‍රකාශ** කිරීමට අදහස් නොකරයි. කළමණාකරනය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ **ප්‍රතිපත්ති**වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම **මූල්‍ය ප්‍රකාශන වල** සමස්ථ ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ **ප්‍රමාණය** තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පණතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි **ප්‍රමාණවත්** සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. **මූල්‍ය ප්‍රකාශන**

### 2.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2006 සිට 2008 වර්ෂය දක්වා කාලය තුළදී ආයතන 7 කට ලබාදී තිබුණු රු.1,529,862 ක් වූ මූල්‍යාධාර සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා එම මූල්‍යාධාර නැවත ලබා ගත යුතු මුදල්ලෙස ගිණුම්වල දැක්විය යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබිණි. ඊට අමතරව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මධ්‍යස්ථාන 12 කට පාඨමාලා සඳහා උපකරණ ලබා ගැනීමට රු.3,360,399 ක් ලබා දී තිබුණු අතර ඉන් වියදම් නොකළ රු.1,414,588 ක් ලැබිය යුතු මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ආ) ප්‍රකාශන අලෙවි ආදායම රු.389,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.493,539 ක් වූ ශිෂ්‍ය ප්‍රගතිවාර්තා පොත් තොගය සහ රු.2,557,490 ක් වූ තැන්පතු හා ලැබිය යුතු ශේෂයන් පරීක්ෂා කිරීමට අදාල උපලේඛන, ශේෂ සනාථ කිරීම් සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය | ගමන් වියදම් ගෙවීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සංයුක්ත දීමනාවල සීමාවන් නොසලකා ගෙවීම් කිරීම නිසා අවස්ථා 13 කදී එකතුව රු.14,649 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ආ) | 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | වෙන්කළ වාහන හැර ඉතිරි රජයේ සියලුම වාහන වල රාජ්‍ය ලාංඡනය සහ සභාවේ නම සටහන් කර නොතිබුණි. |
| (ඇ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3.1(iii) ඡේදය | චක්‍රලේඛයේ ප්‍රකාරව කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතු නිලධාරීන් 6 දෙනෙකුට, වෙන් වෙන්ව ගමන් කිරීම සඳහා වාහන ලබා දී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2003 ජුනි 2 දිනැති අංක පීඒඩී/12 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය<br>------------------------------------------ | |
| | (i) 5.2.1 වගන්තිය | 2009 වර්ෂයේ සිට සකස් කළ අයවැය ලේඛනය සමඟ පුරෝකථනය කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 8.3.5(අ) වගන්තිය | "සී" ශ්‍රේණියේ සංස්ථාවක නිල වාහන වෙන්කළ හැක්කේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හා විධායක අධ්‍යක්ෂකවරයන් සඳහා පමණක් වුවද, එම විධිවිධානවලට පටහැනිව "සී" ශ්‍රේණිය යටතට ගැනෙන සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරයාට වෙන්කළ වාහනයක් ලබාදී ඒ සඳහා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂයකට රු.165,600 බැගින් රු.496,800 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඉ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 ඡේදය | කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීමේදී යාම් ඒම් සඳහා උපරිම දුර කි.මී.50 ක් ලෙස දක්වා තිබුණත් නිළධාරීන් දෙදෙනෙකු සඳහා එම සීමාවන් ඉක්මවා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය
---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවලින් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනයට පෙර රු.1,495,496 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්ත රු.1,575,803 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 80,307 ක පිරිහීමක් සඳහා ආදායම්වල අඩුවීම හා වියදම්වල වැඩිවීම යන කරුණු බලපා තිබුණි.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

### 4.1.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ළඟා කර ගැනීමට කොමිෂන් සභාව සමත් වී නොතිබූ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා 35 කට මූල්‍යාධාර සැපයීමට රුපියල් මිලියන 5 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, මූල්‍යාධාර සපයා තිබුණේ පාඨමාලා 19 කට පමණි. පාඨමාලා 35 කට මෙම මුදල් ලබාදීමට අපේක්ෂා කළත් එම ආයතනවල පාඨමාලා සඳහා ඇති උපකරණ අපේක්ෂා කළ මට්ටමකට වඩා පහත මට්ටමක පැවැතීම නිසා එක් එක් පාඨමාලාවන්ට වැඩිපුර මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට සිදුවීමෙන් මෙම තත්ත්වය ඇතිවූ බව සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 මැයි මාසයේදී විගණනය වෙත වාර්තා කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතන 225ක ලියාපදිංචිය අලුත් කිරීමට සැලසුම් කර තිබුණද ආයතන 211 ක පමණක් ලියාපදිංචිය අලුත් කර තිබුණි. එය ඉලක්කගත අගයෙන් සියයට 93.8 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරිම සඳහා වූ ඉලක්කයන් ලැබූ අයදුම්පත්,ඇගයීම් කළ හා ප්‍රතීතනය කළ සංඛ්‍යාවන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතනය | ඉලක්ක ගත පාඨමාලා සංඛ්‍යාව | අයදුම්පත් ලද පාඨමාලා සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරනු ලැබූ පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරන ලද පාඨමාලා සංඛ්‍යාව ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | | 31 | 27 | 18 | |
| ජාතික තරුණ සේවා සභාව | | 45 | 66 | 31 | |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 400 | 21 | 45 | 26 | |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | | 138 | 244 | 130 | |
| වෙනත් රාජ්‍ය ආයතන | | 53 | 27 | 9 | |
| | | 288 | 409 | 214 | 52 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 50 | 89 | 89 | 57 | 64 |
| | 450 | 377 | 498 | 271 | |

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු පාඨමාලා ප්‍රතීතනය අලුත් කිරීම සඳහා පුහුණුව සපයන ආයතන වලින් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව , ඇගයීම් කරන ලද සංඛ්‍යාව හා ප්‍රතීතනය අළුත් කරන ලද සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතන | ඉලක්ක ගත පාඨමාලා සංඛ්‍යාව | අයදුම්පත් ලද පාඨමාලා සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා සංඛ්‍යාව ඇගයීම් කරන ලද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | | 02 | 05 | 04 | |
| ජාතික තරුණ සේවා සභාව | | - | 09 | 06 | |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 96 | 19 | 25 | 20 | |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | | 26 | 40 | 38 | |
| වෙනත් රාජ්‍ය ආයතන | | 04 | - | - | |
| | | 51 | 79 | 68 | 86 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 57 | 28 | 41 | 35 | 85 |

(ඉ) ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ව්‍යාප්ත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ඇගයුම්කරුවන්ට බලපත්‍ර 200 ක් නිකුත් කිරීමට ඉලක්ක කර තිබුණද, සත්‍ය වශයෙන් නිකුත් කර තිබුණේ බලපත්‍ර 76 ක් පමණි.

(ඊ) 2012 වර්ෂයේ සංයුක්ත සැලැස්මට අනුව දිවයින පුරා පවත්වා ගෙනයන පුහුණු ආයතන පිළිබඳ සමීක්ෂණයක් කිරීමට සැලසුම් කර තිබුණද , එය සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) මූල්‍යාධාර පිරිනැමීම

(i) ඉකුත් වර්ෂයේ මූල්‍යාධාර ලබාදුන් රාජ්‍ය ආයතන , පෞද්ගලික ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන 10 ක් විසින් ගිවිසුම් ප්‍රකාරව උපකරණ මිලදී ගැනීම, ප්‍රතීතනය කිරීම, පාවිච්චි නොකළ මුදල් ආපසු එවීම වැනි කරුණු ඉටු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනය | ලබාදුන් මූල්‍යාධාර වටිනාකම |
|---|---|
| | රු. |
| ජාතික තරුණ සේවා සභාව | 3,103,030 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 7,382,110 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 4,119,919 |
| කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව | 383,850 |
| ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | 2,000,000 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 2,137,258 |

(ii) 2006 සිට 2010 වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 15 ක රාජ්‍ය අංශයේ පාඨමාලා 68ක් ප්‍රතීතනය සඳහා ලබාදෙන ලද රු.19,213,747ක් වූ මූල්‍යාධාර වලට අදාල පාඨමාලා 2013 මාර්තු මාසය වනවිටත් ප්‍රතීතනය කර නොතිබුණි.

(ආ) 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 14 වගන්තිය අනුව වෘත්තීය හා කාර්මික පුහුණු ආයතන ලියාපදිංචි කිරීම හා කාලීනව නැවත අලුත් කිරීම කළ යුතුය. සභාව පිහිටුවන දින සිට ආයතන 2,300 ක් ලියාපදිංචි කර තිබුණත් , 2012 වර්ෂයේ ලියාපදිංචිය අලුත් කර තිබුණේ ආයතන 809 ක් පමණි.

(ඇ) 2010,2011 හා 2012 වර්ෂ වලදී රු. 1,955,835 ක් වැය කර පර්යේෂණ 20 ක් සිදු කර තිබුණද, අවශ්‍යතා තීරණය නොකිරීම, ප්‍රවීනත්වයක් ඇති පුද්ගලයන් නොයෙදීම, වාර්තාවන් ක්‍රියාත්මක නොකිරීම, පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් නොකිරීම, සභාවේ නිලධාරීන් සිදු කරන පර්යේෂණ සඳහා ගිවිසුම් අත්සන් නොකිරීම, නියමිත කාලසීමාවන් තුළ වාර්තා ඉදිරිපත් නොකිරීම, පර්යේෂණ අධීක්ෂණයට වෘත්තීය හා කාර්මික විශ්වවිද්‍යාලයට භාරදී තිබුණත් එය සිදුනොවීම, වැනි කරුණු නිසා පර්යේෂණ සිදුකිරීම මඟින් සභාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වූ දායකත්වය ප්‍රමාණවත්වී නොතිබුණි.

(ඇ) විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම ( VET PLAN) සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලය සමඟ ඇති කරගත් ගිවිසුම අනුව අදාළ වාර්තාව සකස් කර භාරදීමට මාස 7ක් ප්‍රමාදවී තිබුණත් , ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අයකළයුතු රු.105,000 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(á) සංචාරක හා හෝටල් කර්මාන්තය වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම (VET PLAN) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුම අනුව අදාළ වාර්තාව සකස් කර භාරදීමට මාස 12ක් ප්‍රමාදවී තිබුණත්, ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අයකළ යුතු රු. 205,920 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

## 4.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් කොමිෂන් සභාවේ සම්පත්

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2012 ජනවාරි 02 දින බඳවා ගන්නා ලද සේවකයකු, බඳවාගත් දින සිටම රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.328,302 ක් සභාව විසින් ගෙවා තිබුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

කොමිෂන් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| විධායක ශ්‍රේණිය | 31 | 23 | 8 | 26 | 23 | 3 |
| ලිපිකරු හා සමාන්තර සේවා | 32 | 26 | 6 | 30 | 22 | 8 |
| කණිෂ්ඨ | 19 | 16 | 3 | 17 | 16 | 1 |
| අනියම් හා තාවකාලික | 01 | 01 | - | 01 | 01 | - |
| | 83 | 66 | 17 | 74 | 62 | 12 |

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

### 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණු අතර, එකී සංශෝධිත අයවැය ලේඛනයේ ඇතුළත් සංඛ්‍යාවන් සහ තථ්‍ය සංඛ්‍යාවන් අතර , විචලනය සියයට 15 සිට සියයට 56 ක පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වාහන උපයෝජනය

(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඉ) අයවැය පාලනය

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**<u>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු</u>**

ඔබගේ අංක 3P/E/TVEC/FA/12 හා 2013.05.22 දිනැති උක්ත මාතෘකාව සම්බන්ධයෙන් මා වෙත 27/5/2013 දින ලැබූ වාර්තාව මඟින් දක්වා ඇති විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් හා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරන අතර මෙම පිළිතුරු සලකා බලා අවසාන වාර්තාව නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

2.2.1 **ගිණුම් කරණ අඩුපාඩු**

(අ) මූල්‍යාධාර ලබා දීමේදී 2011 වසර දක්වා වූ ගිණුම් කරන ප්‍රතිපත්තිය වූයේ ලබා දුන් මුළු මුදලම වියදමක් ලෙස ගිණුම්ගත කිරීම වන අතර2012 වසරේදී එම ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කරමින් ලබාදෙන මූල්‍යාධාර මුදල් අදාල ආයතන විසින් වියදම් කර ඒ පිළිබඳ තොරතුරු ලබා දෙන තෙක් එම මූල්‍යාධාර වටිනාකම අත්තිකාරම් (ලැබිය යුතු) මුදලක් ලෙස ගිණුම් කරයි. ඒ අනුව 2012ට පෙර ලැබිය යුතු මුදල ද ලැබිය යුතු මුදලක් ලෙස නව ප්‍රතිපත්තිය අනුව ගිණුම්වලට ගැලපීමට කටයුතු කරමි.

කෙසේ නමුදු මූල්‍යාධාර ලබාගත් රාජ්‍ය ආයතන විසින් ගිවිසුම් ප්‍රකාරව මුදල් වැය කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ඔබගේ විමසුමෙහි සඳහන් මුදලේ වටිනාකම අය කර ගැනීමට හැකියාව ඇද්දැයි විමර්ශනය කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි.

(ආ) රු. 389,500 ක් ආදායම ලෙස නොපෙන්වීමට හේතු වන්නේ ආදායම් ගිණුම් ගත කරන්නේ මුදල් පදනමට වේ. විගණන විමසුමේ සඳහන් වෙනත් වටිනාකම් අලෙවියේ දී ආදායමක් ලෙස ගිණුම්ගත වනු ඇත.

**1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සමීක්ෂණයන් සිදුකල නමුදු වාර්තාවක් පිළියෙල කිරීමට ප්‍රමාද වූ හෙයින් ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාව ඔබ වෙත එවීමට ප්‍රමාද විය. කෙසේ නමුදු එම වාර්තාව 2012.05.29 වන දින විගණන අධිකාරීතුමිය වෙත ඉදිරිපත් කරන ලදී.

**ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත් තොග (රු. 493,539 උපලේඛන සමීක්ෂණ මණ්ඩල වාර්තාව)**

2012.12.31 වන දිනට පැවැති තොග ශේෂයන් පිළිබඳ ලේඛණයෙහි පිටපතක් 2013.02.28 වන දින ගිණුම් සමඟ ඔබ වෙත ඉදිරිපත් කරන ලද අතර එහි පිටපතක් නැවත ඔබ වෙත ලබා දීමට මේ සමඟ කටයුතු කරමි.

| | |
|---|---|
| ණය ගැතියෝ | රු. 330,109 |
| ණය හිමියෝ | රු. 2,098,032 |

මටද පිටපතක් එවන මෙන් සඳහන් කර ණය ගැතියන් හා ණය හිමියන්ගේ ශේෂ සනාථ කිරීමේ ලිපි 2013.02.20 වන දින ඔවුන් වෙත තැපැලෙන් යවන ලදී. එනමුත් ඔවුන් ශේෂ සනාථ කිරීම සඳහා ප්‍රතිචාර නොදක්වන ලදී. ඔවුන් වෙත යොමු කරන ලද ලිපි වල පිටපතක් ඔබ වෙත යොමු කරමි.

**තැන්පතු හා ලැබිය යුතු ශේෂයන් රු. 2,557,490**

මෙහි අන්තර්ගත කොමිෂම විසින් ලබා දී ඇති මුලාධාර සඳහා වූ අත්තිකාරම් මුදල් මෙන්ම අනෙකුත් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීමේ ලිපි යොමු නොකරන ලද අතර ඉදිරි වර්ෂයේ සිට ඒ සඳහා ද ශේෂ සනාථ කිරීම සඳහා ලිපි ලබා ගැනීමට කටයුතු කරමි.

### 2.2.3 නීති,රීති රෙගුලාසි හා කළමණාකරන තිරණවලට අනුකූල නොවීම.

(අ) විශේෂ ව්‍යාපෘති සිදු කිරීම සඳහා වෙනත් ආයතන විසින් ලබා දෙන අරමුදල් භාවිතා කර ගමන් වියදම් ලබා දීමේ දී රු.1000, රු.750 බැගින් ගෙවීම සඳහා 155/9 දරන මාණ්ඩලික පත්‍රිකාව මඟින් ගෙවීමට අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව මෙම ගමන් වියදම් දරා ඇත. නැගෙනහිර පළාතේ හා දකුණු පළාතේ වැඩසටහන් වෙනුවෙන් මෙම ගෙවීම් කර ඇත.

(ආ) වෙන් කල වාහන හැර සංචිත සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය, ආයතනයේ නම, ආයතන ලාංඡනය පින්තාරු කර ඇත.

(ඇ) අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන් ඒ ඒ අංශවල විධායක නිලධාරියා වන අතර 2005 වර්ෂය වන තුරු ඔවුන්ට නිල වාහන අනුයුක්ත කර තිබුණු. 2005 විගණන විමසුමට අනුකූලව ඔවුන්ගේ නිල වාහන ඉවත් කර විගණනය පෙන්වා දුන් පරිදි ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කරන ලදී. නමුත් මෙම අධ්‍යක්ෂවරුන් විවිධ රාජකාරි සඳහා ආයතනයෙන් පිටතට යෑම ආදී හේතුන් නිසා, සේවා නිමවා රාජකාරී ස්ථානයෙන් පිටව යෑම සිදු වන්නේ විවිධ අවස්ථා වලදී ය. එබැවින් එක් නිළධාරීයෙක් පැමිණෙන තෙක් තවත් නිළධාරියෙකුට රැඳී සිටිය නොහැකි අතර පොදු පුවාහනය සැලසීමේදී විශාල කාලයක් ප්‍රවාහනය සඳහා ගතවන බැවින්

ඵලදායි ලෙස රාජකාරී කිරීමට නොහැකි වන බව ද හඳුනා ගන්නා ලදී. මෙම අවහිරතා මඟ හරවා ගැනීම සඳහා ඒ ඒ අංශවලට අනුයුක්ත කර ඇති වාහනයෙන් අදාල අධ්‍යක්‍ෂවරයාට ප්‍රවාහන පහසුකම් සලසා ඇත. කෙසේ වෙතත් මේවන විට මේ සඳහා කැබිනට් අනුමැතිය ඉල්ලා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. එම පත්‍රිකාවේ තීරණයට අනුකූලව ඉදිරියේදී කටයුතු කරනු ඇත. මේ සඳහා කැබිනට් අනුමැතිය ලැබෙනතෙක් අමාත්‍යාංශ ලේකම්තුමා විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 82/99 හි 1:1:6(v) වගන්තිය යටතේ නිළධාරීන්ට පෞද්ගලික වන සේ නිල ප්‍රවාහන පහසුකම් අනුමත කර ඇත.

(ඇ) (i) 5.2.1 වගන්තිය

2009 වර්ෂයේ නිසි පරිදි ඉදිරිපත් කර ඇත. 2010 වර්ෂයේ කඩින්කඩ අයවැය ලැබූ නිසා මුදල් හා ප්‍රකාශ සකස් කිරීම සිදු කළ නොහැකි විය. 2011 වර්ෂයේ පමණක් එය ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර 2012 වර්ෂයේ පූරෝකථන ශේෂ පත්‍රයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර ඇත.

(ii) 8.3.5 (අ) වගන්තිය

අධ්‍යක්‍ෂවරුන් සඳහා වාහන වෙන් කිරීම පිළිබඳව 2005/2006/2007/2008 යන වර්ෂවල විගණන විමසුම් කර තිබුණත් ඒ සඳහා එම වර්ෂවල නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයාට වාහනයක් වෙන් තිරීම පිළිබඳව විමසුම් කර නොතිබුණි. ඉන් පසු JF/H/TVEC/AQ/2005/07 දරන 2008 මාර්තු 28 දිනැති විගණන විමසුමෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයාට වැඩිපුර ඉන්ධන ලබා දීම පිළිබඳව පෙන්වා දී තිබූ අතර එම විගණන විමසුමේ ද නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයාට වාහනයක් වෙන් කළ නොහැකි බව පෙන්වා නොදෙන ලදී. නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු අධීක්‍ෂණය  අධ්‍යක්‍ෂක ජනරාල්වරයා සමඟ ඉටුකරනු ලබන අතර ඔහු කොමිෂන් සභාවේ දෙවැනි විධායක නිළධාරියා වේ.

එසේම මහුට දැනට  වෙන් කර ඇති වාහනය මහා භාණ්ඩාගාරයෙන් ලබා දීමේ දී නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයා සඳහා වාහනයක් මිලදී ගැනීම වෙනුවෙන්ම මුදල් ලබා දී ඇත. එසේම මෙයට පෙර සිටි නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්වරයා බඳවා ගැනීමේ දී නිලවාහන සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබුන අතර එම කැබිනට් අනුමැතිය මොහුට ද බලපාන සේ සලකා වාහන වෙන් කිරීම සිදු කර ඇත.

"සී" කාණ්ඩයේ ආයතනයක නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරයාට වාහනයක් හිමි නොමැති බව දන්වන ලද්දේ 2012 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද 2011 විගණන විමසුම මඟිනි. 2011.12.17 සිට 2013.02.28 දක්වා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරයාට වාහන ලබා දී ඇත්තේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් වරයා ලෙස නම්කර ඇති හෙයිනි.

(ඉ) අධ්‍යක්ෂවරුන්ට නිල වාහන අනුයුක්ත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එම අනුමැතිය ලැබෙනතෙක් අමාත්‍යාංශ ලේකම්තුමා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 22/99 අනුකූලව නිලවාහන ප්‍රවාහන පහසුකම් ලබා දීම අනුමත කර ඇත. එබැවින් මෙම තත්වය ඉදිරියේදී ඇති නොවේ.

## 4 මෙහෙයුම් සමාලෝචන

### 4.1 කාර්යය සාධනය

#### 4.1.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

(අ) පාඨමාලා 35 කට මෙම මුදල් ලබා දීමට අපේක්‍ෂා කලත් එම ආයතනවල පාඨමාලා සඳහා ඇති උපකරණ අපේක්‍ෂා කල මට්ටමකට වඩා පහත මට්ටමක පැවතීම නිසා එක් එක් පාඨමාලාවන්ට වැඩිපුර මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට සිදුවීමෙන් මෙම තත්වය ඇති විය.

මුල්‍යාධාර ලබා දීමේ අරමුණ වන්නේ පාඨමාලා ප්‍රතීතනය කර ගැනීමයි. එහිදි අවශ්‍ය උපකරණ වලින් අඩක් පමණක් දිය නොහැක. එම නිසා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මුල්‍යාධාර ලබා දීමේ දී පාඨමාලා 19 ක් පමණක් සීමා කිරීමට සිදු වී ඇත.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ආයතන 225 ක් ලියාපදිංචි අලුත් කිරීමට සැලසුම් කර තිබුණු අතර එම වර්ෂය තුළ දී ආයතන 281 ක් ඇගයීම් කරන ලදී. ඒ අනුව අදාල නිර්ණායක සපුරන ලද ආයතන වලින් 211 ක් පමණක් ලියාපදිංචිය අලුත් කිරීම සිදුකරන ලදී.

(ඇ) පාඨමාලා ප්‍රතීතනය සඳහා ඇගයීමේ දී පුහුණු පාඨමාලාවේ අන්තර්ගතය ජාතික නිපුණතා සම්මත හා ගැලපීම, පාඨමාලා පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් උපකරණ, වැඩහල් සහ පංති කාමර පහසුකම් උපදේශක සුදුසුකම්, පුහුණුව පවත්වාගෙනයාමට අදාල සැලසුම් හා ලේඛණ ප්‍රතීතන නිර්ණායක වලට අනුව තිබේ දැයි තහවුරු කරනු ලැබේ.
ප්‍රතීතනය සඳහා ලැබෙන අයදුම්පත් කාර්යාලය තුල ඇගයීම් කර (Desk Evaluation) සුදුසුකම් සපුරා නැති හා අසම්පූර්ණ අයදුම්පත් ආපසු හරවා යවා සුදුසු අයදුම්පත් පමණක් ඇගයීමට ලක් කරයි. ඇගයීම් කරන සියලුම පාඨමාලා ප්‍රතීතනය නොවේ. එම නිසා මෙම ප්‍රතිශතයන් ගැටලුවක් ලෙස හඳුනා නොගත යුතු වේ.

ඒ අනුව ඉහත වර්ෂයේදී පාඨමාලා 409 ක් සපුරා ඇගයීමට ලක් කර තිබුණ ද ප්‍රතීතන නිර්ණායක සපුරා තිබුණේ 214 වන බැවින් එම සංඛ්‍යාව පමණක් ප්‍රතීතනය කරන ලදී. ප්‍රතික්ෂ්ප කරන ලද පාඨමාලාවන් ප්‍රතික්ෂ්ප කිරීමට හේතු එම ආයතන වෙත දැනුම් දී ඒවා සපුරාගෙන නැවත දැනුම් දෙන ලෙස දන්වා ඇත.

(ඈ) "ඈ" යන්නෙහි පැහැදිලි කල පරිදි ඇගයීම් කරන ලද සියලුම පාඨමාලා ප්‍රතීතනය නොවීම ස්වභාවික තත්වයකි.

ප්‍රතීතනය අලුත් කිරීම සඳහා පාඨමාලා 79 ක් ඇගයීම් කල ද උක්ත නිර්ණායක සපුරා තිබුණේ 68 ක් වන බැවින් එම 68 පමණක් නැවත ප්‍රතීතනය අලුත් කරන ලදී. ඉතිරි ආයතනවල ප්‍රතීතනය තාවකාලික නතර කර අදාල නිර්ණායක සපුරන ලෙස එම ආයතන වෙත දන්වා සිටිමි.

(ඉ) බලපත්‍ර ලබා දීම සඳහා සුදුසුකම් ඇගයීම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවූ අතර ඊට ප්‍රතිචාර වශයෙන් අයදුම්පත් ලැබුණේ 109 ක් පමණි. එම 109 දෙනාට පවත්වන ලද විභාගය හා පරීක්ෂණයෙන් සමත් වූයේ 76 දෙනෙක් පමණි.

(ඊ) 2011 වසරේ දී 2012 වසර සඳහා වූ සංයුක්ත සැලසුම පිළියෙල කිරීමේ දී මෙසේ සමීක්ෂණයන් කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන රාජ්‍ය නොවන සංවිධානයක් වන WUSC ආයතන සමඟ සාකච්ඡා කර මෙම සමීක්ෂණ පැවැත්වීමට තිරණය කරන ලදී. නමුත් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම ආයතනයෙන් ලබා ගැනීමට නොහැකි වීම නිසා එම සමීක්ෂණය නොපවත්වන ලදී. එසේ වුව ද තැපැල් මාර්ගයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිපි යවා මෙම කාර්යය යම් මට්ටමකින් ඉටු කිරීමට කටයුතු කරන ලදී. එහිදි ප්‍රාදේශිය ලේකම්වරු 330 ක් සඳහා ලිපි යවන ලද අතර ඉන් 69 දෙනෙකු ප්‍රතිචාර දක්වා තිබුණි. එම ප්‍රතිචාර අනුව ලියාපදිංචි නොකර පවත්වන ලද ආයතන වෙත අයදුම් පත්‍ර යවා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ලැබුණු ආයතන ලියාපදිංචිය සඳහා කටයුතු කරන ලදී.

## 4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) මූල්‍යාධාර පිරිනැමීම.

(i) මේ වන විට ආයතන 10 විසින්ම මිළදී ගැනීම් සම්පූර්ණ කර ඇත. එමඟින් ආයතන 09 ට අදාල බිල්පත් 2012.12.12 දින අප වෙත එවා ඇත.

(ii) ජාතික තරුණ සේවා සභාව විසින් අදාල මිළදී ගැනීම් සම්පූර්ණ කර බිල්පත් අප වෙත එවා ඇත. ඉතිරි මුදල් එවන ලෙස 2013.01.02 දින ලිපියක් යවා ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට මිලදී ගැනීම්වලට අදාල බිල්පත් එවන ලෙස දන්වා 2012.01.06 හා 2012.05.04 ලිපි යවා ඇත. මේ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින්ද ඔවුන් දැනුවත් කර ඇත.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ ආයතන 06 ක පාඨමාලා 10 ක් සඳහා මුල්‍යාධාර ප්‍රදානය කර ඇත. එමඟින් ආයතන 02 ක පාඨමාලා 05 මිලදී ගැනීම සම්පූර්ණ කර බිල්පත් අප වෙත එවා ඇත. තවත් 01 ආයතනයක් මිලදී ගැනීම් සම්පූර්ණ කර ඇති බව දන්වා ඇත.

අනෙකුත් ආයතන 03 ට අප වෙත මිලදී ගැනීමට අදාල බිල්පත් එවන ලෙස දන්වා 2012.08.30, 2012.01.06 හා 2013.02.08 ලිපි යවා ඇත.

එයට පිළිතුරු වශයෙන් 2012.09.24 හා 2012.11.20 දින හා 2013.03.22 තවමත් මිලදී ගැනීම් සිදුවන බව දන්වා ලිපියක් එවා ඇත. කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව 2012.03.24 මිලදී ගැනීම සම්පූර්ණ කර අදාල බිල්පත් අප වෙත එවා ඇත. එම පාඨමාලාව ප්‍රතීතනය කර ඇත. ශ්‍රී ලංකා පුහුණු ආයතනය මිළදී ගැනීම සම්පූර්ණ කර අදාල බිල්පත් 2012.12.01 දින අප වෙත එවා ඇත.

(iii) රාජ්‍ය අංශයට මුල්‍යාධාර ලබා දීමේ දී යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පුහුණු ආයතන පවත්වාගෙන යන ආයතනවලට ප්‍රමුඛතාවයකින් යුතුව මුල්‍යයන් ලබා දුනි. එමෙන්ම මෙම ආයතන විසින් පවත්වාගෙන යනු ලබන සියලු NVQ පාඨමාලා 2012 වර්ෂය අවසාන වන විට ප්‍රතීතනය කරගන්නා ලෙස අමාත්‍යාංශ මට්ටමින්ද දැනුම් දී ඇත.

එමඟින් මුල්‍යාධාර ලබා දුන් ආයතන පාඨමාලා ප්‍රතීතන ක්‍රියාවලිය තුල නිරතවෙමින් පාඨමාලා ප්‍රතීතනය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ලියාපදිංචි පුහුණු මධ්‍යස්ධානවල ලියාපදිංචි කාලය අවසන් වූ පසු ලියාපදිංචිය අලුත් කල යුතුව ඇත. විශේෂයෙන් පෞද්ගලික අංශයේ පුහුණු ආයතන නැවත ලියාපදිංචිය අලුත් කිරීමට යෑමේදී සමහර ආයතන වසා ඇති බව නිරීක්ෂණය කර ඇත. පසුගිය වසර 05 තුළ ලියාපදිංචි මට්ටම පවත්වාගෙන ගිය මුළු ආයතන සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| වර්ෂය | ලියාපදිංචි පවත්වාගෙන යන මුළු සංඛ්‍යාව |
|---|---|
| 2008 | 606 |
| 2009 | 672 |
| 2010 | 680 |
| 2011 | 697 |
| 2012 | 809 |

ඉහත වර්ෂ 05 හා සංසන්දනය කිරීමේ දී මෙම වර්ෂයේ දී ලියාපදිංචිය පවත්වාගෙන යනු ලබන සංඛ්‍යාව පෙර වසර 04 ට වඩා වැඩිය. කෙසේ වුවද සමහර ආයතන ලියාපදිංචි අලුත් නොකර පවත්වාගෙන යන බවටද වාර්තා වී ඇත. මෙම තත්වය වලක්වා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කර ඇත.

01. ලියාපදිංචිය නැවත අලුත් කිරීමට අදාල අයදුම්පත්‍ර ලියාපදිංචි කල් ඉකුත් වීමට මාස 03 කට පෙර අදාල ආයතන වෙත යවනු ලබයි.

02. ලියාපදිංචිය අලුත් කිරීම නිසි කලට සිදු කර ගැනීම සඳහා ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රමාද කරන ආයතන වලින් දඩ මුදලක්ද අය කිරීමටකටයුතු කිරීම.

03. NVQ සහතික ලබා දීම සඳහා ප්‍රතීතනය කිරීමේදී ලියාපදිංචිය හා ලියාපදිංචිය වලංගුව පැවතීම අනිවාර්ය කර ඇත.

04. මුල්‍යාධාර ලබා දීමේ දී ලියාපදිංචිය අනිවාර්ය කර ඇත.

එසේම මෙම තත්වයන් වලක්වා ගැනීම සඳහා නීතිමය මැදිහත් වීමක් අවශ්‍ය වන අතර වර්තමාන තෘතීය හා වෘත්තීය අධ්‍යාපන පනත අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අපහසු වී ඇත. දැනට වර්තමාන තෘතීය හා වෘත්තීය අධ්‍යාපන පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලැබී ඇති අතර නව පනත යටතේ මෙය වලක්වා ගැනීමට හැකිවනු ඇත.

(ඇ) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 18 කින් වාර්ෂිකව පර්යේෂණ යෝජනා කැඳවනු ලැබයි. පුහුණු ක්ෂේත්‍රය තුළ ප්‍රමුකයන් වි සිටින එම ආයතනවල පවතින හා සංවර්ධනය කල යුතු අංශ පිළිබඳව විමසිලිමත් වෙමින් පර්යේෂණ ගැටළු ඉදිරිපත් කරයි. එම යෝජනාවලින් ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා සංවර්ධනය සඳහා අවශ්‍ය යෝජනාවන්, පර්යේෂණ කමිටුව මඟින් තෝරාගනු ලබයි. ඒ අනුව පර්යේෂණ අවශ්‍යතා තිරණය නොකිරීම සිදු නොවන බව අපගේ හැඟිමයි. එක් එක් වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ එම වර්ෂයේ පර්යේෂණ යෝජනාවන් ක්‍රියාත්මක කරන ක්‍රමවේදයන් සකස් කර ඒ අනුව සිදුකරනු ලබයි.

කොමිෂන් සභාවේ නිළධාරීන් පර්යේෂණ සිදුකිරීමේ දී ගිවිසුම්වලට එළඹීමේ හැකියාවක් නොමැත. ගිවිසුමක් අත්සන් කරනුයේ පාර්ශවකරුවන් දෙපාර්ශවයන් විසිනි. අප අමාත්‍යාංශය යටතේ ඇති, අනෙකුත් ආයතනවල නිළධාරීන් වෙනුවෙන් එම ආයතනවල ප්‍රධානීන් ගිවිසුම්වලට එළඹේ. එයට එම ආයතනයේ ප්‍රධානියා පළමු පාර්ශවය වන අතර අප කොමිෂන් සභාවේ ප්‍රධානියා දෙවන පාර්ශවකරු බවට පත් වේ. එවැනි පාර්ශවකරුවන් 02 ක් අප කොමිෂන් සභාවේ නිළධාරීන් වෙනුවෙන් භාවිතා කල නොහැකි නිසා ගිවිසුම්වලට එළඹීමේ හැකියාවක් නොමැත.

නමුත් සියලු පර්යේෂණ යෝජනාවන් අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා බැවින් මොවුන්ද පර්යේෂණ නිමවන තුරු නිත්‍යාණුකූල බැඳිමකට වේ.
දැනට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණයන් සිදුකරනු ලබන්නේ On the job research ලෙසයි. අනෙකුත් ක්ෂේත්‍රවල මෙන් අප ක්ෂේත්‍රය තුල පූර්ණ කාලීන පර්යේෂණ කිරීමේ අවස්ථාව ලබා දී නොමැත. එම නිසා ඇතැම් පර්යේෂණයන් නියමිත කාල වකවානුවටම වඩා ප්‍රමාදයන්ට ලක් වේ.

පර්යේෂණ අධිකරණයට වෘත්තීය හා කාර්මික විශ්ව විද්‍යාලයට භාර දී නොමැති අතර 2012 වර්ෂය පර්යේෂණ යෝජනා 10 අඩු පාඩු සකස්කර ගැනීම් සඳහා එම විශ්ව විද්‍යාලය උපකුලපති තුමා වෙත භාර දෙනලද අතර එම කාර්යය නිසි ලෙස අප විසින් ඉටු කරවා, සංශෝධනය කරන ලද පර්යේෂණ යෝජනා සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

(ඈ) ඉදිරියේදී මෙවැනි කාලපමාවීම් අනුව කරුණු විමසා බලා ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.
කාල පමාවක් සිදුවුවහොත් ඒ වෙනුවෙන් මසකට 2% අයකිරීමේ මෙම වගන්තිය ඇතුලත් කිරීමේ පදනම වන්නේ අදාල කාලයතුල කාර්යය ඉටුකර ගැනීමයි. එහෙත් පාලනය කල නොහැකි කරුණු එනම්, ශ්‍රම වෙළෙඳපොළ දත්ත ලබාගැනීම ආදී කරුණු හේතුකොට ගෙන නියමිත දිනටම අවසන් වාර්ථාව අවසන් නොවේ.

මේ සඳහා විසඳුමක් ලෙස, අවසන් වාර්ථාව භාරදීම පමාවන අවස්ථාවල, එසේ පමාවීමට හේතු විමසා බලා අදාල ගිවිසුම් වලංගු කාලය දීර්ඝ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
ඉදිරියේදී අදාල ආයතනයෙන් ගිවිසුම් කාලය දීර්ඝ කරගැනීමට ඉල්ලීමක් ලබාගනු ලැබේ.

(ඉ) ඉදිරියේදී මෙවැනි කාලපමාවීම් අනුව කරුණු විමසා බලා ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.
කාල පමාවක් සිදුවුවහොත් ඒ වෙනුවෙන් මසකට 2% අයකිරීමේ මෙම වගන්තිය ඇතුලත් කිරීමේ පදනම වන්නේ අදාල කාලයතුල කාර්යය ඉටුකර ගැනීමයි. එහෙත් පාලනය

කල නොහැකි කරුණු එනම්, ශ්‍රම වෙළෙඳපොළ දත්ත ලබාගැනීම ආදී කරුණු හේතුකොට ගෙන නියමිත දිනටම අවසන් වාර්ථාව අවසන් නොවේ.
මේ සඳහා විසඳුමක් ලෙස, අවසන් වාර්ථාව භාරදීම පමාවන අවස්ථාවල, එසේ පමාවීමට හේතු විමසා බලා අදාල ගිවිසුම් වලංගු කාලය දීර්ඝ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
ඉදිරියේදී අදාල ආයතනයෙන් ගිවිසුම් කාලය දීර්ඝ කරගැනීමට ඉල්ලීමක් ලබාගනු ලැබේ.

4.3 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කොමිෂන් සභාවේ සම්පත්**

අමාත්‍ය ලේකම්ගේ අංක 2/1/3/2/27(1) හා 2012.03.13 දිනැති ලිපිය මහින් අදාල නිළධාරියා ගරු ඇමතිතුමාගේ කාර්යය මණ්ඩලයට නිදහස් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශ නියෝගය මත නිදහස් කරන ලදී.
එම නිළධාරී මහතා අමාත්‍යාංශයට නිදහස් කළත් ඔහුට හිමි වැටුප හා දීමනා කොමිෂන් සභාවෙන් ගෙවන ලෙස උක්ත ඇමුණුම් 01 ලිපියෙන් ම දන්වා ඇත.

4.4. **සේවක මණ්ඩල කළමණාකරණය**

(අ) බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ අවස්ථා කිහිපයකදී පැවැත්වුවද තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සේවයට වාර්තා නොකරන ලදී. මෙම පුරප්පාඩු තනතුරු 17 න් තනතුරු 05 ක් අලුතින් අනුමත කරන ලද විභාග හා ඇගයීම් ඒකකයේ වෙයි. (කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අංක DMS/E4/47/3/2781 හා 2012.06.15 දින අනුමත විය) නමුත් අනුමත වූ විභාග හා ඇගයීම් ඒකකයේ නම කොමිෂන් සභාව විසින් තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලනය ලෙස වෙනස් කර බැවින් එය අනුමත කර ගැනීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට 2012.11.28 දින ඉදිරිපත් කර ඇත.එය මේ දක්වා අනුමත කර ඉදිරිපත් වී නොමැති බැවින් එය අනුමත කල වහාම එම තනතුරු 05 බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. අවනකුත් අනුමත තනතුරු ඉදිරියෙදී බඳවා ගැනීමට කටයුතු කරමි.

දැනටමත් පරිපාලන නිළධාරි, භාෂා පරිවර්ථක හා පුස්තකාල ප්‍රලේඛන සහකාර යන තනතුරු බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකර සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

(ආ) අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නව අධ්‍යක්ෂ ජනරාල්වරයකු 2013.03.01 දින බඳවා ගෙන ඇත. ඒ අනුව මා සේවයට වාර්තා කර ඇත.

(ඇ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/E4/47/3/2781(1) හා 2012.07.17 දිනැති ලිපිය මහින් බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛණය සංශෝධනය කර තිබුණ ද පුනරාවර්තන වැය විෂයන් 11 ක් අයවැය සහ වියදම ඉක්මවා වියදම් දැරීමට සිදුව ඇත. එයට හේතුව ගෙවීය යුතු විගණන ගාස්තු සත්‍ය වියදමට ගැලපෙන පරිදි පෙර වර්ෂයන්ටද අදාලව ගැලපුම් කිරීම අමාත්‍යාංශය සඳහා ගෙවිය යුතු පොදු නඩත්තු වියදම් දැරීමට සිදුවීම, භාෂා පරිවර්තන ගාස්තු ගෙවීමට සිදුවීම, පුවත්පත් අපේක්ෂිත වියදමට වඩා සත්‍ය වියදම ඉහල යාම වැනි කරුණු වේ.

## 6. පද්ධති හා පාලන

විගණනය විසින් වාර්ෂිකව පෙන්වා දෙන පද්ධති හා පාලන අඩුපාඩු සෑම විටම නිවැරදි කිරීමට කටයුතු කරන අතර පද්ධති හා පාලනය කාර්යක්‍ෂමව ඉටු කිරීම සඳහා උපරිම උත්සහය දරන්නෙමු. 2009 අප්‍රේල් මාසයේ සිට මෙම කොමිෂන් සභාව ISO9001: 2000 තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපනය කර ශ්‍රී ලංකා ප්‍රමිතී ආයතනය මඟින් තත්ත්ව සහතිකයද ලබා ගෙන ඇත.

**ආචාර්ය එස්.ඩී.ආර්. පෙරේරා**
අධ්‍යක්‍ෂ ජනරාල්

පිටපත් : ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය. - දැ.ගැ.ස.